76 වන කාණ්ඩය
3 වන කලාපය

බ්‍රහස්පතින්ද
1968 ජනවාරි 11

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදනය [තී. 313]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 314]

බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත් කෙටුම්පත [තී. 357] :
දෙවන වර කියවා "බී" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

සංචාරක සංවර්ධන පනත් කෙටුම්පත [තී. 423] :
දෙවන වර කියවීම—විවාදය කල් තබන ලදී.

කල් තැබීමේ යෝජනාව [තී. 460]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 473]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 76
இல. 3

வியாழக்கிழமை
11 ஜனவரி 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

அறிவிப்பு [ப. 313]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 314]

பௌத்த சிராவக்க தர்மபீட மசோதா : [ப. 357]
இரண்டாம் மதிப்பிடம்பெற்ற நிலையற்குழு " பி " க்குச் சாட்டப்பட்டது

உல்லாசப் பிரயாண அபிவிருத்தி மசோதா : [ப. 423]
இரண்டாம் மதிப்பு—விவாதம் ஒத்திவைக்கப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை [ப. 460]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 473]

---

Volume 76
No. 3

Thursday
11th January 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ANNOUNCEMENT [Col. 313]

ORAL ANSWERS TO QUESTIONS [Col. 314]

BUDDHA SRAVAKA DHARMAPITHAYA BILL [Col. 357] :
Read a Second time and allocated to Standing Committee " B "

TOURIST DEVELOPMENT BILL [Col. 423] :
Second Reading—Debate adjourned

ADJOURNMENT MOTION [Col. 460]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 473]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

**1968 ජනවාරි 11 වන බ්‍රහස්පතින්දා**

*வியாழக்கிழமை, 11 ஜனவரி 1968*

*Thursday, 11th January 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## නිවේදනය

### அறிவிப்பு

### ANNOUNCEMENT

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ප්‍රතිශෝධනය කිරීම සඳහා 1967 නොවැම්බර් මස 5 වැනි දින පත් කරන ලද ඒකාබද්ධ විශේෂ කාරක සභාවෙන් ඉල්ලා අස්වන බව දන්වා, එම සභාවේ සාමාජිකත්වයෙන් මුදාහැරීම සඳහා කටයුතු කරන ලෙස අයැදිමින් සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිණිය, මෛත්‍රීපාල සේනානායක මහතා, එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මහතා, ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා, ලෙස්ලි ගුණවර්ධන මහතා සහ පී. ජී. බී. කෙනමන් මහතා විසින් අත්සන් කරනු ලැබූ ලිපියක් අද උදෑසන මට ලැබුණු බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.



I have to announce to the House that I have this morning received a letter signed by Mrs. Sirimavo R. D. Bandaranaike, Mr. Maithripala Senanayeke, Mr. F. R. Dias Bandaranaike, Dr. N. M. Perera, Mr. Leslie Goonewardene and Mr. P. G. B. Keuneman requesting that action be taken to have them discharged from the Joint Select Committee on the Revision of the Constitution, set up on the 5th November 1967, from which they tender their resignation.

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

### வினாக்களுக்கு வாய்மூல விடைகள்

### ORAL ANSWERS TO QUESTIONS

**මීගමුව-දිවුලපිටිය-මීරිගම පාරේ බස් සේවය**

*நீர்கொழும்பு-திவுலபிட்டிய-மீரிகம பஸ் சேவை*

**NEGOMBO-DIVULAPITIYA-MIRIGAMA BUS SERVICE**

11. **ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலபிட்டிய)*
(Mr. Lakshman Jayakody—Divulapitiya)

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මීගමුව ලං. ග. ම. ඩිපෝවෙන් පාලනය වන මීගමුව-දිවුලපිටිය-මීරිගම පාරේ බස් ධාවනයේ කාල සටහන එතුමා සඳහන් කරනවාද? (ආ) 1967 සැප්තැම්බර් මාසය තුළදී ධාවනය සඳහා නියමිතව ඇති වාර ගණන සම්පූර්ණ ලෙස ක්‍රියාත්මක වූ දිනයන් ඇත්නම් ඒ කවදාද? (ඉ) බස් සේවයේ අඩපනවීමක් ඇත්නම් එයට හේතු දක්වනවාද?

*தேசியமயச் சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) நீர்கொழும்பு இ. போ. ச. சாலையினால் நிர்வகிக்கப்படும் நீர்கொழும்பு-திவுல*

2——එච් 10088—793 (68/1)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

*பிட்டிய-மீரிகம தெருவில் ஓடும் பஸ் வண்டிகளின் கால அட்டவணையை அவர் குறிப்பிடுவாரா? (ஆ) 1967 செப்டெம்பர் மாதத்தில் ஓடுவதற்காக அட்டவணைப்படுத்தப்பட்ட பஸ் சேவை முறைகள் முழுமையாக செயற்படுத்தப்பட்ட தேதிகள் உண்டாயின், அவை யாவை? (இ) பஸ்சேவை சீரழிந்திருந்தால் அதற்குரிய காரணத்தை அவர் அறிவிப்பாரா?*

asked the Minister of Nationalized Services: (*a*) Will he read the time table relating to the bus services on the Negombo-Divulapitiya-Mirigama road, operated by the C. T. B. depot at Negombo? (*b*) What, if any, were the dates on which the full number of trips scheduled were done during September 1967? (*c*) If there is a deterioration in this bus service, will he state why?

**ඩී. බී. වෙලගෙදර මයා. (ජනසතු සේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. டீ. பி. வெலகெதர—தேசிய மய சேவை அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. D. B. Welagedera—Parliamentary Secretary to the Minister of Nationalized Services)

(අ) කාල සටහනේ පිටපතක් සභාගත කර ඇත. (ආ) 1967 සැප්තැම්බර් 5 (ඉ) ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ ගමන් වාරවලට ප්‍රධාන හේතුව අයහපත් පාරවල් නිසා බස්රථවලට සිදු වූ ආපදා වන්ය. ආපදාවන් හැකිතරම් දුරට අඩු කිරීමට සියලු උත්සාහයන් දරනු ඇත.

**සභාමේසය මත තබන ලද ලැයිස්තුව මෙසේ යි:**

*சபா பீடத்தில் வைக்கப்பட்ட நிரல் வருமாறு :*

*The list tabled is as follows :*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

| ඩිපෝව Depot | මීගමුව Negombo | මරදගහමුල Maranda-gahamula | දිවුලපිටිය Divulapitiya | මීරිගම Mirigama | ඊළඟ ගමන් වාරය Next Trip | මීරිගම Mirigama | දිවුලපිටිය Divulapitiya | මරදගහමුල Maranda-gahamula | මීගමුව Negombo | ඩිපෝව Depot | ඊළඟ ගමන් වාරය Next Trip |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
|  | — | 0435 | 0445 | 0515 | — | — | — | 0415 | 0450 | 0500 | — |
| 0420 | 0435 | 0515 | 0525 | 0555 | — | 0435 | 0500 | 0510 | 0550 | 0600 | — |
|  | — | 0535 | 0540 | — | (වෙයන්ගොඩ) Veyangoda | 0525 | 0555 | 0605 | 0645 | — | — |
|  | — | — | 0545 | 0615 | — | 0605 | 0635 | 0645 | 0725 | — | — |
| 0505 | 0515 | 0555 | 0605 | 0635 | — | — | 0650 | 0700 | 0740 | — | — |
| — | 0545 | 0625 | 0635 | 0705 | (නුවර) (Kandy) | 0645 | 0715 | 0725 | 0805 | — | — |
| 0605 | 0615 | 0655 | 0705 | 0735 | — | 0720 | 0750 | 0800 | 0840 | — | — |
| — | 0655 | 0735 | 0745 | 0815 | — | 0750 | 0825 | 0835 | 0930 | — | — |
| — | 0735 | 0815 | 0825 | 0855 | — | 0825 | 0855 | 0905 | 0945 | 0955 | — |
| — | 0755 | 0833 | 0845 | — | — | 0910 | 0940 | 0950 | 1030 | 1040 | — |
| — | 0815 | 0855 | 0905 | 0935 | — | — | 1000 | 1010 | 1050 | — | — |
| — | 0855 | 0935 | 0945 | 1055 | — | 1000 | 1030 | 1040 | 1120 | 1130 | — |
| — | 0935 | 1015 | 1025 | 1055 | — | 1110 | 1140 | 1150 | 1230 | — | — |
| — | 1020 | 1100 | 1110 | 1140 | — | 1150 | 1220 | 1230 | 1310 | — | — |
| — | 1055 | 1135 | 1145 | — | — | 1240 | 1320 | 1330 | 1400 | — | — |
| 1100 | 1120 | 1200 | 1210 | 1240 | — | 1300 | 1330 | 1340 | 1420 | — | — |
| 1145 | 1200 | 1240 | 1250 | 1320 | — | 1330 | 1400 | 1410 | 1450 | — | — |
| — | 1240 | 1320 | 1330 | 1400 | — | — | 1415 | 1425 | 1505 | — | — |
| — | 1330 | 1410 | 1420 | — | — | — | 1430 | 1440 | 1520 | — | — |
| — | 1410 | 1440 | 1450 | 1520 | — | 1415 | 1445 | 1455 | 1535 | — | — |
| — | 1430 | 1510 | 1520 | 1550 | — | 1515 | 1545 | 1555 | 1635 | — | — |
| — | 1500 | 1545 | 1550 | 1620 | — | 1600 | 1630 | 1640 | 1720 | — | — |
| — | 1515 | 1555 | 1605 | — | — | 1640 | 1710 | 1720 | 1800 | — | — |
| — | 1545 | 1625 | 1635 | 1705 | — | — | 1720 | 1730 | 1810 | — | — |
| — | 1625 | 1705 | 1715 | 1745 | — | 1720 | 1750 | 1800 | 1840 | — | — |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| ඩිපෝව Depot | මීගමුව Negombo | මරදගහමුල Maranda-gahamula | දිවුලපිටිය Divula-pitiya | මීරිගම Mirigama | ඊළඟ ගමන් වාරය Next trip | මීරිගම Mirigama | දිවුලපිටිය Divulapitiya | මරදගහමුල Maranda-gahamula | මීගමුව Negombo | ඩිපෝව Depot | ඊළඟ ගමන් වාරය Next trip |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| — ... | 1700 ... | 1740 ... | 1750 ... | 1820 ... | — ... | 1800 ... | 1830 ... | 1840 ... | 1920 ... | — ... | — |
| — ... | 1730 ... | 1810 ... | 1820 ... | 1850 ... | — ... | 1830 ... | 1900 ... | 1910 ... | 1950 ... | 2000 ... | — |
| — ... | 1810 ... | 1850 ... | 1900 ... | 1930 ... | — ... | 1900 ... | 1930 ... | 1940 ... | 2020 ... | 2030 ... | — |
| — ... | 1830 ... | 1910 ... | 1920 ... | — ... | — ... | 1935 ... | 2005 ... | 2015 ... | — ... | — ... | — |
| — ... | 1850 ... | 1930 ... | — ... | — ... | — ... | — ... | — ... | 2105 ... | — ... | — ... | — |
| — ... | 1930 ... | 2010 ... | 2020 ... | 2050 ... | — ... | — ... | 2035 ... | 2045 ... | 2135 ... | — ... | — |
| — ... | 2030 ... | 2110 ... | 2120 ... | 2150 ... | — ... | 2155 ... | 2225 ... | — ... | — ... | — ... | — |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කොහොවිල වයි. එම්. සුදුකුමා මහතාගේ හාල් පොත්

கொஹோவில திரு. வை. எம். சுதுகுமாவின் பங்கீட்டரிசிப் புத்தகங்கள்

RICE RATION BOOKS OF Y. M. SUDUKUMA, KAHAWILA

1. **එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ—කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.—සොරනතොට—වෙනුවට)

(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட—திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை—சார்பாக)

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda—on behalf of Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොහොවිල ග්‍රාම සේවක කොටසේ පහළගෙදර පදිංචි වයි. ඇම්. සුදුකුමා යන අය සහල් සලාක පොත් තුනක් නැතිවූ බව දන්වා දිවුරුම් පෙත්සමක් දී ඇති බව එතුමා දන්නවාද? (ආ) අනතුරුව එකී පෙත්සම වෙනුවෙන් ඔවුන්ට රෙදි ගැනීමට පමණක් සලාක තුනක් නිකුත් කර ඇති බව එතුමා දන්නවාද? (ඉ) එම සහල් සලාක පොත් ලබාදීමට එතුමා ක්‍රියා කරන්නේද? (ඊ) නො එසේ නම්, ඒ මන්ද?

விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினா: (அ) கொஹோவில கிராம சேவையாளர் பகுதியின் பஹலகெதறவிலிருக்கும் திரு. வை. எம். சுதுகுமா மூன்று பங்கீட்டரிசிப் புத்தகங்களை இழந்தது பற்றி அறிவித்து சத்தியக் கடதாசி கொடுத்திருக்கிறார் என்பதை அவர் அறிவாரா? (ஆ) பின்னர், மேற்படி விண்ணப்பத்தின் பேரில் அவர்கள் துணி வாங்குவதற்கு மாத்திரம் மூன்று பங்கீட்டு அட்டைகள் கொடுக்கப்பட்டன என்பதை அவர் அறிவாரா? (இ) இப் பங்கீட்டரிசிப் புத்தகங்களைப் பெற்றுக்கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture and Food: (a) Is he aware that a person named Y. M. Sudukuma, residing at Pahalagedera in the Gramasevaka Division of Kahawila, has submitted an affidavit stating that he has lost three rice ration books? (b) Is he aware that subsequently in response to the affidavit, three ration cards have been issued for the purchase of textiles only? (c) Will he take action to issue these rice ration books? (d) If not, why?

**වෙලගෙදර මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමති වෙනුවට)**

(திரு. வெலகெதர—விவசாய, உணவு அமைச்சர் சார்பாக)

(Mr. Welagedera—on behalf of the Minister of Agriculture and Food)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) නැතිවූ සහල් සලාක පොත් වෙනුවට මෙම වාරයේ සහල් සලාක පොත් ලබාදිය නොහැක. එහෙත්, අළුත් වාරයේ පොත් යථා කාලයේදී නිකුත් කෙරෙනවා ඇත. (ඊ) ඉල්ලුම්කාරිය සඳහන් කර ඇත්තේ ඇය ඔයෙන් එතෙර වනවිට ඇයගේ සහල් සලාක පොත ඔයට වැටුන බවයි. නැතිවූ සහල් සලාක පොත් වෙනුවට අළුතින් පොත් ලබා නොදෙනු බවටත්, ස්වකීය සහල් සලාක පොත් සුරැකිව තබාගන්නා ලෙසටත්, මෙම වාරයේ සහල් සලාක පොත් නිකුත් කිරීමට පෙර මහජනයාගේ දැනගැනීම සඳහා සෑහෙන ප්‍රසිද්ධියක් දෙනු ලැබීය. කරුණු මෙසේ හෙයින්, මෙම සහල් සලාක පොත් නැවත ලබාදීමට අදහස් නො කරමි. මෙම නිවසේ තවත් සහල් සලාක පොත් 5 ක් තිබෙන බවට වාර්තා වී ඇත.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

(திரு. பி. வை. துடாவ—மாத்தறை)

(Mr. B. Y. Tudawe—Matara)

ඒ කියන්නේ කිසිම විධියකින් නැතිවුණු හෝ විනාශ වුණු සහල් පොතකට නැවත සහල් පොතක් නොදෙන බවද?

**වෙලගෙදර මයා.**

(திரு. வெலகெதர)

(Mr. Welagedera)

තේරුම් ගත්තේ එහෙමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ක/වලල්ලාවිට මහා විද්‍යාලයට යන පාර

க/வல்லலாவிட்ட மஹாவித்தியாலயத்திற்குப் பாதை

ROAD TO K/WALLALLAWITA MAHA VIDYALAYA

2. **ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා** (අගලවත්ත)

*(கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த)*

(Dr. Colvin R. de Silva—Agalawatta)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ක/වලල්ලාවිට මහා විද්‍යාලයට යන පාර සෑදීම සඳහා ගම් වැසියන්ගේ ඉඩම් රජයට ලබාගෙන දැනට අවුරුදු 8ක් ම ගත වී තිබෙන බව එතුමා දන්නේද? (ආ) ඒ පාර තවම සාද නැති බව එතුමා දන්නේද? (ඉ) විද්‍යාලයන් කීපයකට මේ මහා විද්‍යාලය මධ්‍යස්ථානය වීම නිසා මේ පාර වහාම සෑදීමට එතුමා භාරගන්ට සූදානම්ද? (ඊ) එසේ නම් කුමන කාලයේදී වැඩ ආරම්භ කරන්ට බලාපොරොත්තු වෙනවාද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) க/வல்லலவிட்ட மகா வித்தியாலயத்திற்குப் பாதை அமைப்பதற்கெனக் கிராமவாசிகளிடமிருந்து காணி கொள்வனவு செய்யப்பட்டு எட்டு ஆண்டு காலம் கடந்துவிட்டதென்பதை அவர் அறிவாரா? (ஆ) இந்தப் பாதை இன்னும் அமைக்கப்படவில்லையென்பதை அவர் அறிவாரா? (இ) இந்த மகா வித்தியாலயம், பல வித்தியாலயங்களுக்கு ஒரு மத்திய நிலையமாக இருப்பதால், இந்தப் பாதை அமைப்பு வேலைகளை உடனடியாகத் தொடங்க அவர் தயாராக இருக்கிறாரா? (ஈ) அப்படியாயின், அவர் எப்பொழுது வேலையைத் தொடக்க எண்ணியுள்ளார்?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that eight years have elapsed since the acquiring of land from the villagers for the construction of a road to K/Wallallawita Maha Vidyalaya? (*b*) Is he aware that this road has not yet been constructed? (*c*) As this maha vidyalaya serves as the centre for several other vidyalayas, is he prepared to undertake the construction of this road immediately? (*d*) If so, when does he propose to start work?

**ගාමණි ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

(*a*) A strip of land 845 feet long, 20 feet wide, has been acquired six years ago for the construction of an approach road to KI/Wallallawita Maha Vidyalaya. (*b*) Yes. (*c*) Will be considered with the other priorities. (*d*) Does not arise.

## ඒ. යූ. රොමානිස් මහතාට දී ඇති හැවනේතැන්න රජයේ ඉඩම

திரு. எ. யூ. றெமானிசுக்கு ஹேவனேதென்ன முடிக்குரிய காணி பராதீனம்

ALIENATION OF HEVANETENNE CROWN LAND TO MR. A. U. ROMANIS

3. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ඩී. ඩී. එල්. ලෙටිෂියා රාජපක්ෂ මිය.—දොඩන්ගස්ලන්ද—වෙනුවට)

*(திரு. டி சொய்சா சிறிவர்தன—திருமதி டீ. டீ. எல். லெரிஷியா ராஜபக்ஷ—தொடங்கஸ்லந்த—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mrs. D. D. L. Leticia Rajapaksa—Dodangaslanda)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ හැවනේතැන්න රජයේ ඉඩමෙන් කොපමණ ප්‍රමාණයක් එක්සත් ජාතික පක්ෂයේ දොඩන්ගස්ලන්දේ හිටපු මන්ත්‍රී වරයෙකු වූ ඒ. යූ. රොමානිස් මහතාට දී තිබේද? (ආ) මෙම රජයේ ඉඩම් ධනවතුන්ට පැවරීම නවතා මෙතෙක් කළ පැවරීම් අවලංගු කරණවාද? නො එසේ නම්, ඒ මන්ද? (ඉ) ඒ. යූ. රොමානිස් මහතාට දී තිබෙන ඉඩම් කැබැල්ලෙන් අවුරුද්දකට පොල් ගෙඩි දසලක්ෂයක් පමණ කැඩෙන බව එතුමා දන්නවාද? (ඊ) මෙම ඉඩම් කැබැල්ලට ඒ. යූ. රොමානිස් මහතාගෙන් අවුරුද්දකට කොපමණ බදු මුදලක් අය කරනවාද? (උ) මෙම ඉඩම් කැබැල්ල සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ. යු. රොමානිස් මහතාගෙන් අයකළ යුතු බදු මුදල නියම කරන ලද්දේ මෙම ඉඩමේ තිබෙන වගාවේ වටිනාකම අනුවද? (ඌ) නො එසේ නම්, ඒ මන්ද?

காணி, நீர்ப்பாசன மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) குருநாகல் மாவட்டத்திலுள்ள ஹிரியாலே ஹத்பத்துவிலுள்ள ஹேவனேதென்ன முடிக்குரிய காணியில் ஐக்கிய தேசியக் கட்சியைச் சேர்ந்த தொடங்கஸ்லந்தைத் தேர்தல் தொகுதி முன்னை நாள் பாராளுமன்ற உறுப்பினர் திரு. ஏ. யூ. ரோமானிசுக்கு கொடுக்கப்பட்டுள்ள காணியின் பரப்பளவு யாது? (ஆ) முதலாளி வர்க்கத்தினருக்குக் காணிகளைப் பராதீனப்படுத்துதல் நிறுத்தப்பட்டு, இதுவரை பராதீனப்படுத்தப்பட்டவையும் இரத்துச் செய்யப்படுமா? அன்றேல், ஏன்? (இ) திரு. ஏ. யூ. ரோமானிசுக்குக் கொடுக்கப்பட்ட காணியில் ஆண்டொன்றுக்கு ஏறத்தாழ 10 லட்சம் தேங்காய்கள் காய்க்கின்றன என்பதை அவர் அறிவாரா? (ஈ) இந்தக் காணி சம்பந்தமாக திரு. ஏ. யூ. ரோமானிசிடமிருந்து அறிவிடப்பட வேண்டிய ஆண்டுக் குத்தகைத் தொகை யென்ன? (உ) இந்தக்காணி சம்பந்தமாகத் திரு. ஏ. யூ. ரோமானிசிடமிருந்து அறவிடப்படவேண்டிய ஆண்டுக் குத்தகைத் தொகை இந்தக் காணியின் உற்பத்திப் பெறுமதிக்கேற்ப வரையறுக்கப்பட்டதா? (ஊ) இல்லையெனில், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) What extent of land out of Hevanetenne Crown land in Hiriyala Hathpaththuwa in the Kurunegala District has been given to Mr. A. U. Romanis, a former U. N. P. Member of Parliament for Dodangaslanda? (*b*) Will the alienation of this land to capitalists be stopped and alienations made so far cancelled and if not, why? (*c*) Is he aware that the yield per year from the allotment given to Mr. A. U. Romanis is about one million nuts? (*d*) What is the annual lease charged from Mr. A. U. Romanis, in respect of this extent of land? (*e*) Was the annual lease chargeable from Mr. A. U. Romanis in respect of this extent of land fixed according to the value of the produce of this land? (*f*) If not, why?

**සී. පී. ජේ. සෙනෙවිරත්න මයා. (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

(*திரு. சீ. பீ. ஜே. செனெவிரத்ன—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி*)

(Mr. C. P. J. Seneviratne—Parliamentary Secretary to the Minister of Land, Irrigation and Power)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ හිරියාල හත්පත්තුවේ හැවනේ තැන්නේ පිහිටි අක්කර 130 ක පමණ රජයේ ඉඩම් රොමානිස් මහතාට දී ඇත. (ආ) 1944 දී රොමානිස් මහතා ඇතුළු කීප දෙනකු විසින් අක්කර 600 ක පමණ රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගෙන ඇත. මේ අයගෙන් වැඩි දෙනකු ගැමියන්ය. කෙසේ වුවද මෙයින් 7 දෙනකු පමණ අක්කර 10 කට වැඩි ප්‍රමාණයකින් යුත් බිම් කොටස බැගින් වගා කොට ඇත. මෙම ඉඩම් මහ නුවර නාථ දේවාලයට අයත්ය යන අවංක විශ්වාසය උඩ එම ඉඩම් අනවසරයෙන් අල්ලා ගත් අය විසින් සැලකිය යුතු වියදමකින් වගා කොට ඇති හෙයිනුත්, ඒ අනුව ඔවුන් විසින් හිමිකම් කියා ඇති හෙයිනුත් සාධාරණත්වය අනුව සලකා, වගා කොට ඇති බිම් කොටස් අනවසරයෙන් අල්ලා ගත් අයට බෙදා දීමට 1967 අගෝස්තු මාසයේදී තීරණය කරන ලදී. ගැමියන් විසින් අනවසරයෙන් අල්ලා ගෙන ඇති ඉඩම්, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඔවුන් අතර බෙදා දීමටත්, ඉහත සඳහන් 7 දෙනා විසින් අනවසරයෙන් අල්ලාගෙන ඇති ඉඩම්, රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඔවුන්ටම බදු දීමටත් තීරණය කරන ලදී. රොමානිස් මහතා මධ්‍යම පන්තියට අයත් කෙනකු බව වාර්තා වී තිබේ. අනෙක් 6 දෙනා ධනපතියන් බවට සාක්ෂි නොමැත. මෙම ඉඩම් බෙදා දීමට තුඩු දුන් කරුණු අනුව සලකා, ඒවා අවලංගු කිරීමට යෝජනා නොකරමි.

(ඉ) රොමානිස් මහතාට දී ඇති ඉඩමේ වාර්ෂික පළදාව ගෙඩි 4,60,000 ක් වන බව වාර්තා වී තිබේ.

(ඊ) රොමානිස් මහතා විසින් ගෙවිය යුතු වාර්ෂික බද්ද ඔහු විසින් එම ඉඩම භාර ගනු ලැබූ දින සිට එම ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට හතරෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

පංගුවක ප්‍රමාණයෙන් ගණන් බලනු ලැබේ. බිම් මැනීමෙන් පසු මෙය නිශ්චිත වශයෙන් තීරණය කරනු ලැබේ. නො දියුණු ඉඩමේ වර්තමාන වටිනාකම අක්කරයකට රුපියල් 2,000 ක් බැගින් යයි වාර්තා වේ. (උ) නැත. (ඌ) රජයේ බදු ඉඩම් පිළිබඳ වාර්ෂික බදු නියම කිරීමේ නොවනස් වන ක්‍රමය නම් ඉඩම් වටිනාකම අනුව බදු නියම කිරීම මිස බදුකරු විසින් කරනු ලබන යම් වගාවකින් ලැබෙන නිෂ්පාදන ද්‍රව්‍යවල වටිනාකම අනුව බදු නියම කිරීම නොවේ.

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*

(Mr. M. Tennakoon—Nikaweratiya)

ගම්වාසීන් මේ අන්දමට වගා කරගෙන යන ඉඩම් සුදුසු අයට නීත්‍යානුකූලව පවරා බලපත්‍ර දී අවසාන කරන්ට පුළුවන් වෙන්නේ කවදාදයි ගරු පාර්ලිමේන්තු ලේකම් තුමාට කියන්ට පුළුවන්ද?

**සෙනෙවිරත්න මයා.**

*(திரு. செனெவிரத்ன)*

(Mr. Seneviratne)

එය මේ ප්‍රශ්නයට අදාළ කරුණක් නොවෙයි. එහෙත් මම පිළිතුරු දෙන්ට කැමතියි. ප්‍රතිපත්තියක් වශයෙන් දැන් ඒක දිසාපතිවරුන් විසින් හැමදාම කරගෙන යන දෙයක්.

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னக்கோன்)*

(Mr. M. Tennakoon)

මගේ ප්‍රශ්නය පාර්ලිමේන්තු ලේකම් තුමාට වැටහුනේ නැහැ කියලයි, මම හිතන්නෙ. පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්වෙ, රොමානිස් මහත්මයාත් අනිකුත් ගම්මුන් අතරත් ඒ ඉඩම් බෙදා දෙන බවයි. ඒ ඉඩම් ගම්වාසීන්ට පවරා අවසර පත්‍ර දීල අවසාන කරන්ට පුළුවන් වෙන්නෙ කවදද කියන එකයි මගේ ප්‍රශ්නය.



**සෙනෙවිරත්න මයා.**

*(திரு. செனெவிரத்ன)*

(Mr. Seneviratne)

ඒක ප්‍රදේශයේ දිසාපති විසින් හැම දාම කරගෙන යන දෙයක් කියල මම කිව්වෙ ඒක තමයි. [බාධා කිරීමක්]

## රජයේ ගුරුවරු : ණය ඇපකරු වීමේ අයිතිය

அரசாங்க ஆசிரியர் : கடன்களுக்குப் பிணை நிற்கும் உரிமை

**GOVERNMENT TEACHERS : RIGHT TO GUARANTEE LOANS**

4. **තුඩාවේ මයා.** (ප්‍රින්ස් ගුණසේකර මයා.—හබරාදුව—වෙනුවට)

*(திரு. துடாவ—திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ—சார்பாக)*

(Mr. Tudawe—on behalf of Mr. Prins Gunasekera—Habaraduwa)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ආපදා ණය වශයෙන් තම වැටුපෙන් මාස 3 ක ප්‍රමාණය ගැනීමට ගුරු භවතුනට අයිතිය ඇතත් එම ණය සඳහා ඇපකරුවකු වීමට රජයේ ගුරු භවතුනට බලය නැති බව එතුමා දන්නවාද? ආ) විද්‍යාලයක කම්කරු, පියන් සහ මුරකරුවත් හිමි එම අයිතිය විදුහල්පතිට වත් නොමැති බව එතුමා දන්නවාද? (ඉ) මහජන බැංකුවේ ණයකරයකට පවා ඇප විය හැකි ගුරුවරුනට මෙම ආපදා ණය කරුවන් ඇපකරුවන් වීමේ බලය ලබා දීමට අවශ්‍ය විධිවිධාන යොදන්නේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா : (அ) ஆசிரியர்கள் 3 மாதக் கஷ்ட நிவாரணக் கடன் பெறும் உரிமையுடையவர்களாயிருந்தபோதிலும் அரசாங்க ஆசிரியர்கள் இக்கடன்களுக்குப் பிணை நிற்கும் தகுதிபெற்றவர்களல்லர் என்பதை அவர் அறிவாரா? (ஆ) கல்லூரியொன்றின் கூலியாட்கள், ஏவலாளர், காவற்காரர் ஆகியோருக்குள்ள இவ்வுரிமை கல்லூரி அதிபருக்கு வழங்கப்படவில்லை யென்பதை அவர் அறிவாரா? (இ) மக்கள் வங்கிக் கடன்களுக்குப் பிணை நிற்கும் தகுதி வாய்ந்த ஆசிரியர்களுக்குக் கஷ்ட நிவாரணக் கடன்களுக்கும் பிணை நிற்கும் தகுதியைப் பெற்றுக்கொடுத்தலுக்குரிய நடவடிக்கைகளை அவர் எடுப்பாரா?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Education and Cultural Affairs: (a) Is he aware that although teachers have the right to a distress loan of 3 months' salary, government teachers are not eligible to guarantee such loans? (b) Is he aware that this right which is available to the labourer, the peon and the watcher of a school, is not enjoyed by even the school principal? (c) Will he take necesssary steps to obtain for teachers, who are eligible to guarantee even Peoples Bank loans, the right to guarantee distress loans?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

(a) Teachers have the right to be sureties in respect of distress loans. (b) and (c) do not arise.

### රජයේ ගුරුවරු : දෙවුරුදු වැටුප් ණය

அரசாங்க ஆசிரியர் : ஈராண்டுக் சம்பளக் கடன்

### GOVERNMENT TEACHERS: TWO YEARS' SALARY LOAN

5. **තුඩාවේ මයා.** (ප්‍රින්ස් ගුණසේකර මයා. වෙනුවට)
*(திரு. துடாவ—திரு. பிறின்ஸ் குணசேக்கர சார்பாக)*
(Mr. Tudawe—on behalf of Mr. Prins Gunasekera)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) භාණ්ඩාගාරයේ 728 චක්‍රලේඛය අනුව රජයේ සේවකයින්ට නිවාසයක් තැනීමට හෝ ඉඩමක් ගැනීමට දෑවුරුද්දක වැටුප හෝ රු. 3,000 ක් ලබා ගත හැකි බව එතුමා දන්නවාද? (ආ) එම අයිතිය රජයේ ගුරු භවතුන්ටත් හිමිද? (ඉ) එසේ නම් 1,20,000 ක් පමණ ගුරුවරුන්ට මෙම අයිතිය ලබා ගැනීමට අවශ්‍ය නීති රීති මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) திறைசேரியின் 728 ஆம் இலக்கச் சுற்றறிக்கையின்படி அரசாங்க ஊழியர்கள் வீடு வாங்குவதற்கு அல்லது காணி வாங்குவதற்கு, ஈராண்டு சம்பளம் அல்லது ரூபா 3,000/- பெற்றுக்கொள்ள முடியுமென்பதை அவர் அறிவாரா? (ஆ) அந்த உரிமை அரசாங்க ஆசிரியர்களுக்கு முண்டா? (இ) அப்படியெனில் ஏறத்தாழ 1,20,000 ஆசிரியர்களும் இந்த உரிமையை அனுபவிப்பதற்கு அவசியமான, சட்டதிட்டங்களை இக்கௌரவ சபையில் சமர்ப்பிப்பாரா?*

asked the Minister of Education and Cultural Affairs: (a) Is he aware that in terms of Treasury Circular No. 728, it is possible for public servants to get either Rs. 3,000 or two years' salary for constructing a house or for purchasing a property? (b) Do government teachers enjoy this right? (c) If so, will he introduce legislation in Parliament so as to confer this right on government teachers numbering nearly 120,000?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

(a) Yes. (b) No. (c) The matter is receiving the attention of the Treasury.

### කොප්පරා අපනයනය හා පුනක්කු ආනයනය

கொப்பரு ஏற்றுமதியும் பிண்ணாக்கு இறக்குமதியும்

### COPRA EXPORTS AND POONAC IMPORTS

6. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ටී. බී. ඉලංගරත්න මයා.—කොලොන්නාව—වෙනුවට)
*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ—சார்பாக)*
(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. T. B. Ilangaratne—Kolonnawa)

වාණිජ හා වෙළඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1965 අප්‍රේල් සිට 1967 සැප්තැම්බර් 30 දක්වා ලංකාවෙන් අපනයන කරන ලද කොප්පරා ප්‍රමාණය හා වටිනාකම කොපමණද? (ආ) එම කාල සීමාව තුළ ලංකාවට ආනයන කරන ලද පොල් පුන්නක්කු ප්‍රමාණය හා වටිනාකම කොපමණද? (ඉ) එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

කාල සීමාව තුළ ලංකාවට ආනයන කරන ලද කපු ඇට පුන්නක්කු ප්‍රමාණය හා වටිනාකම කොපමණද ?

*வர்த்தக, வியாபார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா : (அ) 1965 ஏப்ரில் முதல் 1967 செப்டெம்பர் 30 ஆந் திகதிவரை இலங்கையிலிருந்து ஏற்றுமதி செய்யப்பட்ட கொப்பறாவின் நிறையும், பெறுமதியும் எவ்வளவு? (ஆ) அக்கால எல்லைக்குள் இலங்கைக்கு வரவழைக்கப்பட்ட தேங்காய்ப் பிண்ணாக்கின் நிறையும், பெறுமதியும் எவ்வளவு? (இ) அக்கால எல்லைக்குள் இலங்கைக்கு இறக்குமதி செய்யப்பட்ட பருத்திக் கொட்டைப் பிண்ணாக்கின் நிறையும், பெறுமதியும் எவ்வளவு?*

asked the Parliamentary Secretary to the Minister of Commerce and Trade : (*a*) What is the volume and value of copra exported from Ceylon from April 1965 to 30th September 1967 ? (*b*) What is the volume and value of coconut poonac imported to Ceylon during this period ? (c) What is the volume and value of cotton-seed poonac imported to Ceylon during this period ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

(*a*) The volume and value of copra exported from Ceylon from April 1965 to 30th September 1967 are as follows :

| | *Quantity* (*tons*) | *Value* (*Rs.*) |
|---|---|---|
| 1965 (April—December) | 32,223 | 39,255,667 |
| 1966 | 20,869 | 24,593,113 |
| 1967 | 8,837 | 9,183,687 |
| Total | 61,929 | 73,032,467 |

| | | |
|---|---|---|
| (*b*) The volume and value of coconut poonac imported to Ceylon from April 1965 to 30.9.67 | Nil | Nil |
| (*c*) The volume and value of cotton-seed poonac imported to Ceylon from April 1965 to 30.9.67 | 500 | 200,000 |

In addition to the above, a quantity of 1,000 tons ground-nut poonac costing Rs. 520,000 was also imported during the period from April 1965 to 30.9.67. All this information is available in the customs returns.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## හල්ලොළුව-බරිගම පාර සහ කටුගස්තොට -පේරාදෙණිය පාර

ஹல்லொலுவ-பரிகம, கட்டுகஸ்தோட்டை-பேராதனைப் பாதைகள்

## HALLOLUWA-BARIGAMA AND KATUGASTOTA-PERADENIYA ROADS

7. ද සොයිසා සිරිවර්ධන මයා. (හේම චන්ද්‍ර සිරිසේන මයා.—අකුරණ පළමුවන මන්ත්‍රී—වෙනුවට)

*(திரு. டி சொய்சா சிறிவர்தன—திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Hemachandra Sirisena—First Akurana)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සන්දේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : අකුරණ ඡන්ද කොට්ඨාශය තුල පිහිටි ඇති, හල්ලොළුව-බරිගම පාර හා ගොහාගොඩ හරහා කටුගස් තොට-පේරාදෙණිය පාර යන ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවට අයත් මාර්ග දෙක වෙනුවෙන් 1966-67 මුදල් වර්ෂය සඳහා වෙන් කරන ලද නඩත්තු මුදල් සම්බන්ධ යෙන් පහත සඳහන් විස්තර එතුමා සඳ හන් කරනවාද? (i) එක් එක් මාර්ගය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද? (ii) එකී නඩත්තු මුදල් යොදවනු ලැබුයේ කුමන වැඩ කොටස් සඳහාද? (iii) එකී වැඩ කොටස් කිරීමට ආරම්භ කළ හා වැඩය නිමකළ දිනයන් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරනවාද?



அரசாங்கக் கட்டுவேலை தபால் தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா : அக்குறணைத் தேர்தல் தொகுதியிலே உள்ள அரசாங்கக் கட்டுவேலைத் திணைக்களம் பொறுப்பேற்றுள்ள பாதைகளான ஹல்லொலுவ பரிகமப் பாதை, கொஹொடை வழியாகக் கட்டுகஸ் தோட்டை-பேராதனைப் பாதை ஆகிய வற்றைப் பேணுவதற்கு 1966/67 ஆம் நிதி ஆண்டிலே ஒதுக்கப்பட்ட நிதித் தொகைபற் றிப் பின்வரும் விவரங்களை அவர் தருவாரா :—(i) பாதை ஒவ்வொன்றுக்கும் ஒதுக் கப்பட்ட நிதித் தொகை; (ii) பேணுகைக் கான நிதி எவ்வெவ் வேலைகளுக்குப் பயன் படுத்தப்பட்டது? (iii) அவ்வவ் வேலைகளைத் தொடங்கிய நாட்களும் முடித்த நாட்களும்?

asked the Minister of Public Works, Posts and Telecommunications: Will he give the following particulars relating to the funds apportioned for the maintenance during the financial year 1966-67 of two P. W. D. roads in the Akurana electorate—namely the Halloluwa-Barigama road and Katugastota-Peradeniya (via Gohagoda) road: (i) The amount allocated in respect of each road; (ii) The items of work for which such maintenance funds were utilised; (iii) the dates on which item of work was started and completed?

සෙනෙවිරත්න මයා. (රජයේ වැඩ තැපැල් සහ විදුලි සංදේශ ඇමති වෙනුවට)

*(திரு. செனெவிரத்ன அரசாங்க கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)*

(Mr. Seneviratne on behalf of the Minister of Public Works, Posts and Telecommunications)

(i) එක් එක් මාර්ගය සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණය මෙසේය :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| (අ) හල්ලොළුව-බරිගම පාර—නඩත්තුව සඳහා | ... ... | 5,730 | 0 |
| නැවත මතුපිට සැකසීම සඳහා | ... | 2,550 | 0 |
| | | 8,280 | 0 |
| (ආ) ගොහාගොඩ හරහා කටුගස්තොට-පේරාදෙනිය පාර—නඩත්තුව සඳහා | ... | 8,800 | 0 |
| නැවත මතුපිට සැකසීම සඳහා | ... | 8,730 | 0 |
| | | 17,530 | 0 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

(ii) නඩත්තු මුදල් යොදවන ලද කාර්ය විෂයයන් හා

(iii) එකී වැඩ කොටස් කිරීමට ආරම්භ කළ හා වැඩය නිම කළ දිනයන් වෙන් වෙන් වශයෙන් පහත පළවේ.

හල්ලොළුව-බරිගම පාර :

| | වැඩ විෂය | වියදම | ආරම්භ කළ දිනය | නිම කළ දිනය |
|---|---|---|---|---|
| 1. | වල්පැල ඉවත් කිරීම, පිලියම් කිරීම, කැලෑව එළි කිරීම 3/4" ගල් මුට්ට කිරීම ... ... ... | 297 12 ... | 66.10. 1 ... | 66.10.31 |
| 2. | වල්පැල ඉවත් කිරීම, පිලියම් කිරීම, 3/4" ගල් තද කිරීම, උස්පැති පහත් කිරීම හා 9" සක්කගල් ඇතිරීම ... | 1,538 75 ... | 66.11. 1 ... | 66.11.30 |
| 3. | වල්පැල ඉවත් කිරීම, පිලියම් කිරීම, 3/4'' ගල් තද කිරීම උස්පැති පහත් කිරීම හා ගොඩනැගිලි සංඥ පුවරු ... | 1,176 78 ... | 66.12. 1 ... | 66.12.31 |
| 4. | සංඥ පුවරු, කෙටි තාප්ප හා ආරක්ෂක ගල් සුදුපාට කිරීම, බෝක්කුවල අංක යෙදීම, පෙරළුන ආරක්ෂක ගල් නැවත සවි කිරීම, වල්පැල ඉවත් කිරීම හා පිලියම් කිරීම ... | 307 20 ... | 67. 1. 1 ... | 67. 1.31 |
| 5. | වල්පැල ඉවත් කිරීම, කැලය එළි කිරීම (අධික ලෙස) ... | 314 67 ... | 67. 2. 1 ... | 67. 2.28 |
| 6. | වල්පැල ඉවත් කිරීම, පිලියම් කිරීම හා උස් පැති පහත් කිරීම | 130 45 ... | 67. 3. 1 ... | 67. 3.31 |
| 7. | වල්පැල ඉවත් කිරීම හා පිලියම් කිරීම ... ... | 130 45 ... | 67. 4. 1 ... | 67. 4.30 |
| 8. | එම ... | 130 45 ... | 67. 5. 1 ... | 67. 5.31 |
| 9. | එම ... | 130 45 ... | 67. 6. 1 ... | 67. 6.30 |
| 10. | එම ... | 130 45 ... | 67. 7. 1 ... | 67. 7.31 |
| 11. | එම ... | 130 45 ... | 67. 8. 1 ... | 67. 8.31 |
| 12. | එම ... | 65 23 ... | 67. 9. 1 ... | 67. 9.15 |
| | | 4,482 40 | | |
| | තාරවල වටිනාකම ... | 1,243 50 | | |
| | | 5,725 90 | | |

නැවත මතුපිට සැකසීමේ මුදල් යොදවන ලද වැඩ විෂයන් මෙසේයි :

| වැඩ විෂය | ගෙවන ලද මුදල රු. ශ. | ආරම්භ කළ දිනය | නිම කළ දිනය |
|---|---|---|---|
| 2" ගල් මුට්ට කිරීම ... ... ... | 1,211 94 ... | 66.10. 1 ... | 66.10.31 |
| ගල් තද කිරීම හා පලමුවන තාර දැමීම ... ... | 1,334 50 ... | 67. 3. 1 ... | 67. 3.31 |

ගොහාගොඩ හරහා කටුගස්තොට-පේරාදෙණිය පාර

| | කාර්ය විෂය | වියදම රු. ශ. | ආරම්භ කළ දිනය | නිම කළ දිනය |
|---|---|---|---|---|
| 1. | වල්පැල ඉවත් කිරීම සහ පිලියම් කිරීම ... ... | 37 08 ... | 67. 9.16 ... | 66. 9.30 |
| 2. | වල්පැල ඉවත් කිරීම, පිලියම් කිරීම, ගල් කියුබ් 3 ක් තද කිරීම, ගල්කියුබ් 2 ක් මුට්ට කිරීම හා බෝක්කුව අළුත්වැඩියා කිරීම | 679 39 ... | 66.11. 1 ... | 66.11.30 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

| කාර්යය විෂය | වියදම රු. ශ. | ආරම්භ කළ දිනය | නිම කළ දිනය |
|---|---|---|---|
| 3. වල් පැල ඉවත් කිරීම, පිළියම් කිරීම, සාමාන්‍ය නඩත්තුව, තාර පිලියම් කිරීම, ගල් තද කිරීම, අළුත් කානු තැනීම, උස් පැති පහත් කිරීම, තෙත පස් ඉවත් කිරීම හා අවහිර වී ඇති බෝක්කු ශුද්ධ කිරීම ... ... ... | 640 20 | 66.12.1 | 66.12.31 |
| 4. වල් පැල ඉවත් කිරීම, පිළියම් කිරීම හා තෙත පස් ඉවත් කිරීම ... ... ... ... | 297 84 | 67. 1. 1 | 67. 1.31 |
| 5. වල් පැල ඉවත් කිරීම හා පිළියම් කිරීම ... ... | 236 84 | 67. 2. 1 | 67. 2.28 |
| 6. ශුද්ධ කිරීම ඇතුළුව, වල්පැල ඉවත් කිරීම, පිළියම් කිරීම, පැති කානු ගැඹුර කිරීම, මතුපිට ජලපවාහනය, උස් පැති පහත් කිරීම සහ පැති කානු විවෘත කිරීම ... ... | 1,485 0 | 67. 3. 1 | 67. 3.31 |
| 7. වල් පැල ඉවත් කිරීම පිළියම් කිරීම පිළියම් කළ තැන් තද කිරීම, උස් පැති පහත් කිරීම හා කානු විවෘත කිරීම ... | 1,393 29 | 67. 4. 1 | 67. 4.30 |
| 8. වල් පැල ඉවත් කිරීම, පිළියම් කිරීම හා මාර්ගය මතුපිට පිළියම් කළ ස්ථාන තද කිරීම ... ... | 271 12 | 67. 5. 1 | 67. 5.31 |
| 9. වල් පැල ඉවත් කිරීම, පිළියම් කිරීම, මතුපිට ජලපවහනය, පැති කානු ශුද්ධ කිරීම හා ගැඹුරු කිරීම පළල් කිරීම සඳහා හෑරීම සහ සංඥ කුළුණ තැනීම ... ... | 559 67 | 67. 6. 1 | 67. 6.30 |
| 10. වල් පැල ඉවත් කිරීම, පිළියම් කිරීම හා පූර්ව මිශ්‍රණ පිළියම්... | 203 76 | 67. 7. 1 | 67. 7.31 |
| 11. වල් පැල ඉවත් කිරීම, පිළියම් කිරීම පූර්ව මිශ්‍රණ පිළියම් සංඥ පුවරුවල අකුරු යෙදීම ... ... | 190 95 | 67. 8. 1 | 67. 8.31 |
| 12. වල් පැල ඉවත් කිරීම පිළියම් කිරීම පැති කානු ශුද්ධ කිරීම හා ගැඹුරු කිරීම සහ පූර්ව මිශ්‍රණ තොග සකස් කිරීම ... | 319 18 | 67. 9. 1 | 67. 9.15 |
| | 6.314 32 | | |
| තාරවල වටිනාකම ... | 2,478 72 | | |
| | 8,793 04 | | |

නැවත මතුපිට සැකසීමේ මුදල් යොදවන ලද වැඩ විෂයයන් මෙසේයි :

| විෂයය | ගෙවන ලද මුදල රු. ශ. | ආරම්භ කළ දිනය | නිම කළ දිනය |
|---|---|---|---|
| 2″ හා 3/4″ ගල් මුට්ට කිරීම කියුබ් 4යි ... ... | 1,947 52 | 66.12. 1 | 66.12.31 |
| 2″ ගල් මුට්ට කිරීම ... ... ... | 373 30 | 67. 1. 1 | 67. 1.31 |
| සක්කගල් ඇතිරීම, ගල් මුට්ට කිරීම හා ඇතිරීම—පල්මුවර තාර දැමීම ... ... ... ... | 1,126 95 | 67. 3. 1 | 67. 3.31 |
| 2 වෙනි වර තාර දැමීම ... ... ... | 1,366 82 | 67. 4. 1 | 67. 4.30 |
| 2 වෙනි වර තාර දැමීම ... ... ... | 383 75 | 67. 5. 1 | 67. 5.31 |
| ගල් ඇතිරීම හා පළමුවර තාර දැමීම ... ... | 356 03 | | |
| ගල් තද කිරීම, පළමුවර හා 2වෙනි වර තාර දැමීම ... | 438 34 | 67. 7. 1 | 67. 7.31 |
| ගල් මුට්ට කිරීම ... ... ... | 1,028 77 | 67. 9. 1 | 67. 9.15 |
| දෙවෙනි වර තාර දැමීම ... ... ... | 1,704 01 | | |
| | 8,725 50 | | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

(i) The amount allocated in respect of each road is as follows :—

| | | Rs. | c. |
|---|---|---|---|
| (a) Halloluwa-Barigama road—for maintenance | .. .. | 5,730 | 0 |
| (via Gohagoda) Road —for resurfacing | .. .. | 2,550 | 0 |
| | | 8,280 | 0 |
| (b) Katugastota-Peradeniya—for maintenance | .. .. | 8,800 | 0 |
| —for resurfacing | .. .. | 8,730 | 0 |
| | | 17,530 | 0 |

(ii) The items of work for which the maintenance funds were utilised ; and

(iii) the dates on which each item of work was started and completed are as follows :

*Item of Work (Halloluwa-Barigama Road)*

| | | Cost Rs. c. | Date of commencement | Date of completion |
|---|---|---|---|---|
| 1. | Weeding, patching, jungle clearing, $\frac{3}{4}''$ metal piling .. .. .. | 297 12 | 1.10.66 | 31.10.66 |
| 2. | Weeding, patching, $\frac{3}{4}''$ metal stamping, reducing high sides, $\frac{3}{4}''$ rubble paving .. | 1,538 75 | 1.11.66 | 30.11.66 |
| 3. | Weeding, patching, $\frac{3}{4}''$ metal stamping, reducing high sides, building direction boards .. | 1,176 78 | 1.12.66 | 31.12.66 |
| 4. | White washing and painting direction boards, parapets, guard stones, numbering culverts, refixing fallen guard stones, weeding and patching .. .. .. | 307 20 | 1. 1.67 | 31. 1.67 |
| 5. | Weeding, patching and jungle clearing (heavy) .. .. .. | 314 67 | 1. 2.67 | 28. 2.67 |
| 6. | Weeding and patching and reducing high sides | 130 45 | 1.3.67 | 31.3.67 |
| 7. | Weeding and patching .. .. | 130 45 | 1.4.67 | 30.4.67 |
| 8. | do. .. .. .. | 130 45 | 1.5.67 | 31.5.67 |
| 9. | do. .. .. .. | 130 45 | 1.6.67 | 30.6.67 |
| 10. | do. .. .. .. | 130 45 | 1.7.67 | 31.7.67 |
| 11. | do. .. .. .. | 130 45 | 1.8.67 | 31.8.67 |
| 12. | do. .. .. .. | 65 23 | 1.9.67 | 15.9.67 |
| | | 4,482 40 | | |
| | Cost of tar .. | 1,243 50 | | |
| | | | 5,725 90 | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The item of work for which the resurfacing funds were utilised are as follows :

| | *Amount paid* *Rs. c.* | *Date of commencement* | *Date of completion* |
|---|---|---|---|
| 2″ Metal piling | 1,211 94 | 1.10.66 | 31.10.66 |
| Metal consolidation and 1st coat tarring | 1,334 50 | 1.3.67 | 31.3.67 |

(ii) The items of work for which the maintenance funds were utilised ; and

(iii) the dates on which each item of work was started and completed are as follows :

*Item of Work (Katugastota-Peradeniya via Gohagoda road)*

| | *Cost* *Rs. c.* | *Date of commencement* | *Date of completion* |
|---|---|---|---|
| 1. Weeding and patching | 37 8 | 16. 9.67 | 30. 9.67 |
| 2. Weeding, patching znd stamping 3 cubes metal piling 2″ cubes metal and repair to culvert | 679 39 | 1.11.66 | 30.11.66 |
| 3. Weeding, patching, general upkeep tar patching, metal stamping, cutting new drains reducing high sides and removing wet soil and clearing checked culverts | 640 20 | 1.12.66 | 31.12.66 |
| 4. Weeding, patching and removing wet soil | 297 84 | 1. 1.67 | 31. 1.67 |
| 5. Weeding and patching | 236 84 | 1. 2.67 | 28. 2.67 |
| 6. Weeding, patching, including clearing, deepening side drains, surface drainage, reducing high sides and opening side drains | 1,485 0 | 1.3.67 | 31. 3.67 |
| 7. Weeding, patching stamping in patching, reducing high sides and opening drains | 1,393 29 | 1. 4.67 | 30. 4.67 |
| 8. Weeding, patching and stamping in patching road surface | 271 12 | 1. 5.67 | 31. 5.67 |
| 9. Weeding, patching, surface drainage, clearing and deepening side drains, excavation in widening and construction direction pillars | 559 67 | 1. 6.67 | 30. 6.67 |
| 10. Weeding, patching and premix patching | 203 76 | 1. 9.67 | 31. 7.67 |
| 11. Weeding, patching, premix patching, lettering sign boards | 190 95 | 1. 8.67 | 31. 8.67 |
| 12. Weeding, patching, clearing and deepening side drains, preparing stock piles of premix | 319 18 | 1. 9.67 | 15. 9.67 |
| | 6,314 32 | | |
| Cost of Tar | 2,478 72 | | |
| | 8,793 4 | | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සෙනෙවිරත්න මයා.]

The item of work for which the resurfacing funds were utilized are as follows:—

| *Item No.* | *Amount paid* Rs. c. | *Date of commencement* | *Date of completion* |
|---|---|---|---|
| 2" and ¾" Metal piling 4 cubes .. .. | 1,947 52 | 1.12.66 | 31.12.66 |
| 2" Metal piling .. .. .. | 373 30 | 1. 1.67 | 31. 1.67 |
| Rubble paving metal piling and spreading—first coat | 1,126 95 | 1. 3.67 | 31. 3.67 |
| 2nd Coat tarring .. .. | 1,366 82 | 1. 4.67 | 30. 4.67 |
| do. | 383 75 | 1. 5.67 | 31. 5.67 |
| Metal spreading and 1st coat .. .. | 356 3 | | |
| Metal consolidation, 1st coating and 2nd coating | 438 35 | 1. 7.67 | 31. 7.67 |
| Metal piling 2nd coating .. .. | 1,028 77 | 1. 9.67 | 15. 9.67 |
| | 1,704 1 | | |
| | 8,725 50 | | |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කරඩුවාවල පාසල, අකුරණ

அக்குறணை கரண்டுவாவல பாடசாலை

KARANDUWAWALA SCHOOL, AKURANA

8. ද සොයිසා සිරිවර්ධන මයා. (හේම චන්ද්‍ර සිරිසේන මයා. වෙනුවට)

(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ஹேமச்சந்திர சிரிசேன சார்பாக)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Hemachandra Sirisena)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අකුරණ ඡන්ද කොට්ඨාශය තුල පිහිටි මහ/කරඩුවාවල පාසැලේ දැනට ඉගෙණුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව කොපමණද? (ආ) එහි කීවෙනි ප්‍රමාණය දක්වා පන්ති පැවැත්වෙන්නේද? (ඉ) එහිම ප්‍රධානාචාර්‍ය ඇතුළුව සේවයේ නියැලී සිටින ගුරුවරුන් සංඛ්‍යාව නම් වශයෙන් කවරේද? (ඊ) එකී ගුරුවරු ගුරුවරියන්ගේ ගම් ප්‍රදේශයන්, දිස්ත්‍රික්කය, ආදායම් පාලක නිළධාරි කොට්ඨාශය හා ග්‍රාමසේවක කොට්ඨාශය අනුව වෙන් වෙන් වශයෙන් එතුමා දක්වනවාද? (උ) ඔවුන්ගේ අධ්‍යාපනික සුදුසුකම් හා ලබා ඇති වෘත්තීය සහතික කවරේදැයි යන වග එතුමා සඳහන් කරනවාද? (ඌ) එකී ගුරුවර ගුරුවරියන්ගේ, යථෝක්ත පාසැලේ සේවා කාලය වෙන් වෙන් වශයෙන් දක්වනවාද?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) அக்குறணைத் தேர்தல் தொகுதியில் உள்ள மஹ/கரண்டுவாவல பாடசாலையில் இப்போது கல்விபயிலும் மாணவ மாணவிகளின் எண்ணிக்கை என்ன? (ஆ) அங்கு எந்த வகுப்புவரை, வகுப்புகள் நடாத்தப்படுகின்றன? (இ) அங்கு தலைமையாசிரியர் உட்பட சேவையாற்றும் ஆசிரியர்களின் எண்ணிக்கையும் அவர்களின் பெயர்களும் யாவை? (ஈ) அவ்வாசிரிய, ஆசிரியைகளின் ஊர், மாவட்டம், இறைவரி உத்தியோகப் பிரிவு ஆகியவற்றைக் கிராம சேவக வட்டார அடிப்படையில் வெவ்வேறாக அவர் தெரிவிப்பாரா? (உ) அவர்களின் கல்வித்தகைமைகளையும், அவர்களது தொழில் சான்றிதழ் விபரங்களையும் அவர் குறிப்பிடுவாரா? (ஊ) அவ்வாசிரிய, ஆசிரியைகள் அப்பாடசாலையில் சேவைசெய்துள்ள காலத்தை அவர் வெவ்வேறாகக் குறிப்பிடுவாரா?

asked the Minister of Education and Cultural Affairs: (*a*) How many students are at present on the roll at the මහ/Karanduwawala School in the Akurana electorate? (*b*) Up to what grade are classes held in this school? (*c*) Will he state the number of teachers on the staff including the head teacher, together with their names? (*d*) Will he state the home station, the district, the D. R. O's division and the gramasevaka division in respect of each teacher on the staff? (*e*) Will he state their educational qualifications and their professional qualifications? (*f*) Will he state how long each of these teachers has been in service in the above school?

**ගාමිණී ජයසූරිය මයා.**

(திரு. காமினி ஜயசூரிய)

(Mr. Gamani Jayasuriya)

(*a*) 168. (*b*) Grade I to Grade VII. In respect of (*c*), (*d*), (*e*) and (*f*), the particulars are tabled.

**සභාමේසය මත තබන ලද විස්තර මෙසේයි:**

சபாபீடத்தில் வைக்கப்பட்ட விபரம் வருமாறு:

*The particulars tabled are as follows:*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

| (ඉ) ගුරුවරුන්ගේ නම | | (ඊ) ගම ප්‍රදේශය | දිස්ත්‍රික්කය | ආදායම් පාලක කොට්ඨාශය | ග්‍රාම සේවක කොට්ඨාශය | (උ) අධ්‍යාපනික සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් | (ඌ) එම පාසලේ සේවා කාලය |
|---|---|---|---|---|---|---|---|
| 1. කේ. බී. ඩී. මීගස්වත්තේ මයා. | වැ.බ. මුල්ගුරු ... | මතුරට නාපටවෙල ... | නුවරඑළිය ... | උඩහේවාහැට | නාපටවෙල ... | දස අවුරුදු සේවා සහතිකය, උසස් වීමෙන් ලැබූ I වන පෙළ සහතිකය | 65.7.1 සිට |
| 2. ඇම්. ඊ. දයාවතී මිය. ... | උපගුරු ... | කරඩුවාවල ... | මහනුවර ... | හාරිසිය පත්තුව | මහ/වල්ගම ... | සි. පුහුණු I වන පෙළ ... | 61.6.1 සිට |
| 3. ඒ. ජී. ජයසිංහ මයා. ... | උපගුරු ... | වල්ගම ... | මහනුවර ... | හාරිසිය පත්තුව | මහ/වල්ගම ... | ඉංග්‍රීසි III පෙළ සේවා සහතිකය ... | 59.5.1 සිට |
| 4. එච්. එම්. බණ්ඩිමැණිකේ මිය. | උපගුරු ... | මීගස්දෙනිය ... | මහනුවර ... | හාරිසිය පත්තුව | තිත්තපජ්ජල ... | සිංහල III වන පෙළ සේවා සහතිකය ... | 60 8.1 සිට |
| 5. ඩබ්. ජී. ආර්. වීරසිංහ මයා. | උපගුරු ... | මරවනාගොඩ ... | මහනුවර ... | හාරිසිය පත්තුව | මරවනාගොඩ ... | සහතික නොලත් ගුරුවරියෙකි ... | 67.6.1 සිට |

| (இ) ஆசிரியர்கள் பெயர்கள் | (ஈ) சொந்த இடம் | மாவட்டம் | காரியாதிகாரியின் பிரிவு | கிராம சேவகரின் பிரிவு | (உ) கல்வித் தராதரங்களும் உயர் தொழில் தராதரங்களும் | (ஊ) அங்கு செய்த சேவைக்காலம் |
|---|---|---|---|---|---|---|
| 1. திரு. கே. பி. டி. மீகஸ்வத்த பதில் தலைமையாசிரியர் | மத்துறட்ட நபத்தவல .. | நுவரேலியா .. | உடகவகெற்ற .. | நப்பத்தவல .. | 10 வருட சேவைத்தராதரப் பத்திரம் பதவி உயர்ச்சியின்பின் 1 ந் தர ஆசிரியர்தராதரப் பத்திரம் | 1.7.65 இலிருந்து |
| 2. திருமதி எம். இ. தயாவதி உதவி ஆசிரியர் | கரடுவாவல .. | கண்டி .. | சரசியபத்து .. | க/வல்கம .. | 1 ந் தர சிங்கள பயிற்றப்பட்ட தராதரப் பத்திரம் | 1.6.61 இலிருந்து |
| 3. திரு. ஏ. ஜி. ஜயசிங்க உதவி ஆசிரியர் .. | வல்கம .. | கண்டி .. | சரசியபத்து .. | க/வல்கம .. | 3 ந் தர ஆங்கில ஆசிரிய தராதரப் பத்திரம் | 1.5.59 இலிருந்து |
| 4. திருமதி எச். எம். பண்டிமெனிக்க உதவி ஆசிரியர் | மீகஸ்தெனிய .. | கண்டி .. | சரசியபத்து .. | தித்தபாஜல .. | 3 ந் தர சிங்கள சேவை த்தராதரப் பத்திரம் | 1.8.60 இலிருந்து |
| 5. திரு. டபிள்யு. ஜி. ஆர். வீரசிங்க உதவி ஆசிரியர் | மாவனகொட .. | கண்டி .. | சரசியபத்து .. | மாவனகொட .. | தராதரப்பத்திரமற்ற ஆசிரியர் .. | 1.6.67 இலிருந்து |

| (c) Names of Teachers | | (d) Home Station | District | D.R.O's Division | Gramasevaka's Division | (e) Educational and Professional Qualifications | (f) Period of Service there |
|---|---|---|---|---|---|---|---|
| 1. Mr. K. B. D. Meegaswatte .. | Acting Head master | Maturata .. Napatawela | Nuwara Eliya | Udahewaheta .. | Napatawela | Ten years service certificate, 1st Class Certificate on promotion | from 1.7.65 |
| 2. Mrs. M. E. Dayawathie .. | Asst. Teacher | Karaduwawala | Kandy .. | Harasiya Pattu | K/Walgama | 1st Class Sinhalese Trained Certificate | from 1.6.61 |
| 3. Mr. A. G. Jayasinghe .. | do. .. | Walgama .. | Kandy .. | do. .. | K/Walgama | 3rd Class English Teachers Certificate | from 1.5.59 |
| 4. Mrs. H. M Bandimenike .. | do. .. | Meegasdeniya | Kandy .. | do. .. | Tittapajjala | 3rd Class Service (Sinhala) Certificate | from 1.8.60 |
| 5. Mr. W. G. R. Weerasinghe .. | do. .. | Marawanagoda | Kandy .. | do. .. | Marawanagoda | Uncertificated teacher .. | from 1.7.67 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Question No. 9.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

I require one month's time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**ශිෂ්‍ය ගුරුවරු**

*மாணவ ஆசிரியர்*

**PUPIL TEACHERS**

**10. ද සොයිසා සිරිවර්ධන මයා.** (රාජා කුලතිලක මයා.—තෙල්දෙණිය—වෙනුවට)

*(திரு. டி சொய்சா சிறிவர்தன—திரு. ராஜ குலத்திலக்க—தெல்தெனிய—சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Raja Kulatillake—Teldeniya)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ශිෂ්‍ය ගුරුවරුන් සේවය කරන්නේ ඉතා දුෂ්කර තත්ත්වයක බැව් එතුමා දන්නවාද ? (ආ) එබඳු දුෂ්කර තත්ත්වයක සේවය කරන ශිෂ්‍ය ගුරුවරුන්ට අවුරුදු 5 ක් ඇතුළත උසස් විභාගයකින් සමත් නොවුවහොත් සේවයෙන් අස්වීමට සිදුවන බැව් දන්නවාද ? (ඉ) මෙම ශිෂ්‍ය ගුරුවරුන්ට නියමිත අවුරුද්ද ඇතුළත අභ්‍යාස විද්‍යාලවලට ඇතුලු වීමට ඒවායේ ඉඩකඩ නොමැති බැව් එතුමා දන්නවාද ? (ඊ) මේ නිසා සෑම ශිෂ්‍ය ගුරුවරයෙකුගේ සේවය ස්ථිර කිරීමට එතුමා අදහස් කරනවාද ? (උ) එසේ අදහස් කරන්නේ නම් ඒ කවද සිටද ? (ඌ) කුමන වේතනයක් යටතේද ? (එ) ස්ථිර කිරීමට අදහස් නොකරන්නේ නම්, ඒ මන්ද ?

கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா : (அ) மாணவ ஆசிரியர்கள் பெருந் துன்பச் சூழ்நிலையில் சேவை செய்வதை அவர் அறிவாரா ? (ஆ) அவ்வாறு துன்பச் சூழ்நிலையில் சேவை செய்யும் மாணவ ஆசிரியர்கள் 5 ஆண்டு காலத்துக்குள் உயர்தரத் தேர்வில் தேர்ச்சி பெறுவிடில் சேவையில் இருந்து விலக வேண்டும் என்பதையும் அவர் அறிவாரா ? (இ) இம் மாணவ ஆசிரியர்கள் குறிப்பிட்ட ஆண்டிற்குள் பயிற்சிக் கல்லூரிகளில் சேர அவற்றில் இடவசதியில்லையென்பதை அவர் அறிவாரா ? (ஈ) எனவே, மாணவ ஆசிரியர்கள் அனைவரது நியமனத்தையும் உறுதிப்படுத்த அவர் கருதியுள்ளாரா ? (உ) இங்ஙனமாயின், எப்பொழுதிருந்து ? (ஊ) எச் சம்பள அளவுத்திட்டப்படி அவர்கள் உறுதிப்படுத்தப்படுவார்கள் ? (எ) உறுதிப்படுத்தும் எண்ணமில்லையெனில் ஏன் ?

asked the Minister of Education and Cultural Affairs : (*a*) Is he aware that it is under very difficult conditions that pupil teachers work ? (*b*) Is he aware that these pupil teachers who work in such conditions have to leave the service if they fail to pass a higher examination within five years ? (*c*) Is he aware that there is no accommodation in training colleges to enable these pupil teachers to enter them within the prescribed year ? (*d*) Does he, therefore, intend to confirm every pupil teacher in his or her appointment ? (*e*) If so, from what date ? (*f*) On what salary scale will they be placed ? (*g*) If he does not intend to confirm them, why ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

(*a*) No. (*b*) No. (*c*) Yes. (*d*) No. (*e*) Does not arise. (*f*) Does not arise. (*g*) As it has been provided for pupil teachers to obtain permanent appointments not only by passing the training colleges entrance examination but also the Teachers' Certificate examination, the General Certificate of Education (Advanced Level) Examination or the University Intermediate Examination with subjects as specified by the Commissioner of Examinations.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

## උප තැපැල් ස්ථානාධිපතීන් ස්ථිර කිරීම

உப தபால் நிலைய அதிபர் : நிரந்தரமாக்கல்

**SUB-POSTMASTERS : PERMANENCY**

12. ටී. බී. තෙන්නකෝන් මයා. (දඹුල්ල—ප්‍රින්ස් ගුණසේකර මයා.—වෙනුවට)

(திரு. ரீ. பி. தென்னகோன்—தம்புளை—திரு. பிறின்ஸ் குணசேக்கர சார்பாக)

(Mr. T. B. Tennekoon—Dambulla—on behalf of Mr. Prins Gunasekera)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උප තැපල් ස්ථානාධිපතීන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු යොදන ලෙස අගමැතිතුමා එතුමාට දැන්වීද? (ආ) එසේ නම් ඒ අනුව ක්‍රියා කළාද? (ඉ) නොකළා නම්, ඒ මන්ද? (ඊ) උප තැපැල් ස්ථානාධිපතිවරුන් රජයේ ස්ථිර සේවකයින් ලෙස පත් කිරීමට අවශ්‍ය පියවර ගන්නවාද? (උ) 1968 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන අයුරු එම වෙනස ඇති කිරීමට එතුමා පොරොන්දු වෙනවාද?

அரசாங்கக் கட்டுவேலை,தபால், தந்திப்போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) உப-தபால் நிலைய அதிபர்களின் சேவையை நிரந்தரமாக்குவதற்கு நடவடிக்கை எடுக்குமாறு பிரதம அமைச்சர் அவருக்கு அறிவித்தாரா? (ஆ) அவ்வாறெனில், அதன்படி நடவடிக்கை எடுக்கப்பட்டதா? (இ) இன்றேல், ஏன்? (ஈ) உப தபால் நிலைய அதிபர்களை அரசாங்க நிரந்தர ஊழியர்களாக நியமிக்க அவர் வேண்டிய நடவடிக்கை எடுப்பாரா? (உ) 1968 ஆம் ஆண்டு சனவரி மாதத்தில் இருந்து நடைமுறைக்கு வரக்கூடியதாக அம்மாற்றத்தை யேற்படுத்த வாக்குறுதியளிப்பாரா?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Has the Prime Minister directed him to take steps to make the Sub-Postmasters' Service a permanent service? (*b*) If so, has he acted accordingly? (*c*) If not, why? (*d*) Will he take necessary steps to give permanent appointments to sub-postmasters? (*e*) Will he give an undertaking to make the change with effect from January 1968?

සෙනෙවිරත්න මයා. (රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමති වෙනුවට)

(திரு. செனெவிரத்ன—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர் சார்பாக)

(Mr. Seneviratne—on behalf of the Minister of Public Works, Posts and Telecommunications)

(අ) නැත. (ආ) පැන නොනගී. (ඉ) පැන නොනගී. (ඊ) නැත. (උ) පැන නොනගී.

## බටගොල්ලේ මුලහල්කැලේ වත්ත අත්පත් කර ගැනීම

பட்டகொல்லை முலஹல்கெலேவத்தையைச் சுவீகரித்தல்

**ACQUISITION OF MULAHALKELEWATTA, BATAGOLLA**

13. ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)

(திரு. ரீ. பி. எம். ஹேரத்—வலப்பனை)

(Mr. T. B. M. Herath—Walapane)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වලපනේ, බටගොල්ල ගමේ පිහිටි මුලහල්කැලේ වත්ත යන ඉඩමින් අක්කර අටක් ගම් පළල් කිරීම සඳහා අත්පත් කර ගැනීමට ක්‍රියා කරන ලද්දේද? (ආ) එම ඉඩමේ අයිතිය රජයට පැවරීම 1966. 5. 6 දින සිට සිදුවන බව එතුමා විසින් අංක ජේ 61/62 එල් 318 (වී. ඊ.) හා 1966.4.7 දින ලිපියෙන් වලපනේ මන්ත්‍රීවරයාට දන්වන ලද්දේද? (ඉ) මෙම ඉඩමේ අයිතිය පවරා ගැනීමට 1966.5.6 දින ගැසට් නිවේදනයක් නිකුත් කරන ලද්දේද? (ඊ) එසේ නම් මේ ඉඩම මෙතෙක් රජයට පවරා නොගත්තේ මන්ද? (උ) මෙම ඉඩම වහාම පවරා ගෙන ගම් වාසීන්ට බෙදා දෙන්නේද? නො එසේ නම්, ඒ මන්ද?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) வலப்பனை, பட்டகொல்லைக் கிராமத்தில் உள்ள முலஹல்கெலேவத்தை என்னும் காணியிலிருந்து 8 ஏக்கர் காணியை கிராம விரிவாக்கத்துக்காகச் சுவீகரிப்பதற்கு நடவடிக்கை எடுக்கப்பட்டதா? (ஆ) 6.5.1966 முதல் அந்தக் காணியின் உரிமை அரசாங்கத்தைச் சார்ந்ததாயிருக்குமென, அவரால் 7.4.1966 ஆந் தேதியிடப்பட்ட இல. ஜே 61/62 எல். 318 (நீ. ஈ.) கடிதத்தின் மூலமாக வலப்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பனைப் பாராளுமன்ற உறுப்பினருக்குத் தெரிவிக்கப்பட்டதா? (இ) இக்காணியைச் சுவீகரிப்பதற்கான அறிவித்தல் 6.5.1966 ஆந் தேதி "கெசற்" இதழ் மூலம் அறிவிக்கப்பட்டதா? (ஈ) ஆமெனில், இக்காணியை இன்னும் அரசாங்கத்திற்கெடுக்காமலிருப்பதேன்? (உ) இக்காணியை உடனடியாக எடுத்துக் கிராம வாசிகளுக்குப் பங்கிடப்படுமா? இல்லையெனில், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) Was action taken to acquire eight acres of land from a land called Mulahalkelewatta in the village of Batagolla in Walapane for village expansion? (*b*) Did he inform the Member of Parliament for Walapane by letter No. J 61/62 L 318 (T.E.) dated 7.4.1966 that the vesting of that land in Government will take place on 6.5.1966? (*c*) Was a gazette notification made on 6.5.1966 to vest this land? (*d*) If so, why has it not been vested yet? (*e*) Will he acquire this land immediately and alienate it among the villagers; and if not, why?

**සෙනෙවිරත්න මයා.**
*(திரு. செனெவிரத்ன)*
(Mr. Seneviratne)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) ඔව්. (ඊ) වැඩි දුරටත් ලැබුණු විරුද්ධතාවයන් සළකා බැලීමට සිදුවූ නිසා පවරා ගැනීම පමා වී ඇත. (උ) ඔව්. 1968.2.9 දින ඉඩම් කච්චේරියක් පැවැත්වීමට ක්‍රියා කර ඇත.

**එච්. විල්බට් පීරිස් මහතා, කම්කරු, බ්ලෙයාර් ලෝමන්ඩ් වත්ත, උඩපුස්සැල්ලාව**

உடபுசல்லாவை பிலயர் லோமண்டி தோட்டத் தொழிலாளி திரு. எச். வில்பட் பீரிஸ்

**MR. H. WILBERT PIERIS, LABOURER, BLAIR LOMOND ESTATE, UDAPUSSELLAWA**

14. **ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

සමාජ සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උඩපුස්සැල්ලාව, බ්ලෙයාර් ලෝමන්ඩ් වත්තේ කම්කරු එච්. විල්බට් පීරිස් මහතා 1965 දෙසැම්බර් 4 වන දින සේවයෙහි යෙදී සිටියදී හදිසි අනතුරකට භාජනය වූ බව එතුමා දන්නවාද? (ආ) මෙම අනතුර නිසා ඔහුට සිදුවූ තුවාල කවරේද? (ඉ) මේ සම්බන්ධයෙන් කම්කරු වන්දි කොමසාරිස්වරයාට දැන් වූ බව එතුමා දන්නවාද? (ඊ) කම්කරු වන්දි කොමසාරිස්වරයා විසින් මෙතෙක් මේ ගැන කුමක් කර තිබේද? (උ) මොහුට ඉක්මණින් වන්දියක් ලබා දීමට එතුමා ක්‍රියා කරනවාද? නොඑසේ නම්, ඒ මන්ද?

சமூக சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) உடபுசல்லாவையிலுள்ள "பிலயர்லோமண்டி" தோட்டத்தில் வேலை செய்த திரு. எச். வில்பட் பீரிஸ் என்ற தொழிலாளி 1965 ஆம் ஆண்டு டிசம்பர் 4 ஆந் தேதியன்று சேவை செய்து கொண்டிருக்கும் பொழுது திடீர் விபத்துக்குள்ளானார் என்பதை அவர் அறிவாரா? (ஆ) இந்த விபத்தின் காரணமாக அவருக்கேற்பட்ட காயங்கள் யாவை? (இ) இது சம்பந்தமாகத் தொழிலாளர் நட்ட ஈட்டு ஆணையாளருக்குத் தெரிவிக்கப்பட்டதென்பதை அவர் அறிவாரா? (ஈ) தொழிலாளர் நட்டஈட்டு ஆணையாளர், இதுவரை என்ன நடவடிக்கை எடுத்திருக்கிறார்? (உ) இத்தொழிலாளிக்குக் கூடிய விரைவில் நட்ட ஈட்டைப் பெற்றுக்கொடுப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? இன்றேல், ஏன்?

asked the Minister of Social Services: (*a*) Is he aware that Mr. H. Wilbert Pieris, labourer at Blair Lomond Estate, Udapussellawa, met with an accident on 4th December 1965 while on duty? (*b*) What injuries did he sustain as a result of this accident? (*c*) Is he aware that the Commissioner of Workmen's Compensation was notified of this matter? (*d*) What has the Commissioner of Workmen's Compensation done so far in regard to this matter? (*e*) Will he take action to have compensation paid to this person early; and if not why?

**ජයසූරිය මයා. (සමාජ සේවා ඇමති වෙනුවට)**
*(திரு. ஜயசூரிய—சமூக சேவைகள் அமைச்சர் சார்பாக)*
(Mr. Jayasuriya—on behalf of the Minister of Social Services)

(අ) ඔව්. (ආ) ජනනේන්ද්‍රියන්ට බර පතල තුවාල සිදුවීම. (ඉ) ඔව්. (ඊ) මෙය විමසා බලන ලදී. ඉල්ලුම්කරු සිය වන්දි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයසූරිය මයා.]
ඉල්ලුම් පත්‍ර 67.7.19 වන දින ඉල්ලා අස් කරගෙන ඇත. (උ) ඉහතින් "ඊ" අක්‍ෂර යට දී ඇති පිළිතුර නිසා මෙය පැන නොනගී.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

වෙනත් වුවමනාවක් සඳහාය කියා මේ වන්දි ඉල්ලුම්කරු නොදන්නා භාෂාවකින් පිළියෙළ කළ කඩදාසියකට මේ ඉල්ලුම් කරුගේ අත්සන ගැනීමෙන් ඔහුගේ වන්දි ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස් කර ගත්තාය කියා රැවටිලි සහගත වැඩ පිළිවෙළක් මෙතැන සිද්ධ වී තිබෙනවාය කියා මේ තැනැත්තා මට පැමිණිලි කර තිබෙනවා. මේ තැනැත්තා නොදැනුවත්ව එවැනි දෙයක් කර තිබෙන බව දැන්වුවහොත් නැවත විභාගයක් පවත්වන්නට ගරු ඇමතිතුමා ක්‍රියා කරනවා ද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

මා ඒ කාරණය ගරු ඇමතිතුමාට දන්වනවා.

## ඒ. එම්. පුංචිබණ්ඩා මහතා, උපස්ථායක, උඩපුස්සැල්ලාව රෝහල

உடபுசல்லாவை மருத்துவமனை பணியாளர் திரு. ஏ. எம். புஞ்சி பண்டா

MR. A. M. PUNCHI BANDA, ATTENDANT, UDAPUSSELLAWA HOSPITAL

15. **ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

සෞඛ්‍ය ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) උඩපුස්සැල්ලාව රජයේ රෝහලේ උපස්ථායක ඒ. ඇම්. පුංචිබණ්ඩා මහතාට, 1957 ට පෙර ගෙවිය යුතු හිඟ වැටුප් මුදලක් ඇතී බව එතුමා දන්නවාද? (ආ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකතුමාගේ අංක පීඊආර්(ටී)ඩී 2170/බී.ඩී.අයි හා 12. 8. 57 දරණ ලිපිය එතුමා ඉදිරිපත් කරනවාද? (ඉ) බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි වරයාගේ අංක බීඩී/ඊබී/එම්ඒ/120 සහ 20. 2. 1957 දින දරණ ලිපිය එතුමා ඉදිරිපත් කරනවාද? (ඊ) එම උපස්ථායක තැනගේ පූර්වෝක්ත හිඟ වැටුප් වහාම ගෙවීමට එතුමා ක්‍රියා කරනවාද? නොඑසේ නම්, ඒ මන්ද?

*சுகாதார அமைச்சரைக் கேட்ட வினா: (அ) உடபுசல்லாவை அரசினர் மருத்துவமனையில் பணியாளராகக் கடமைபுரியும் திரு. ஏ. எம். புஞ்சிபண்டாவுக்கு 1957 க்கு முன் செலுத்தப் பட வேண்டிய பாக்கிச் சம்பளத் தொகை உள்ளதை அவர் அறிவாரா? (ஆ) சுகாதார சேவை அதிபரின் பி. ஈ. ஆர். (ரீ) டி 2170. பீ. டீ. ஐ. இலக்க 12.8.57 தேதியக் கடிதத்தை அவர் சமர்ப்பிப்பாரா? (இ) பதுளை சுகாதார சேவை அதிபரின் பீ. டீ./ஈ. பீ./எம். ஏ./120 ஆம் இலக்க 20.2.1957 நாட் கடிதத்தை அவர் சமர்ப்பிப்பாரா? (ஈ) அப்பணியாளரின் மேற் கூறிய பாக்கிச் சம்பளத் தொகையை உடனே வழங்க அவர் நடவடிக்கை எடுப்பாரா? அன்றேல் ஏன்?*

asked the Minister of Health: (*a*) Is he aware that there was a sum of money due to Mr. A. M. Punchi Banda, attendant at Udapussellawa Government Hospital, as arrears of salary in respect of a period prior to 1957? (*b*) Will he table letter No. PER (T) D 2170/B.D.I. dated 12.8.57 of the Director of Health Services? (*c*) Will he table letter No. BD/EB/MA/120 dated 20.2.1957 of the Superintendent of Health Services, Badulla? (*d*) Will he take action to pay immediately the above arrears of salary of this attendant; and if not, why?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (සෞඛ්‍ය ඇමති)**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—சுகாதார அமைச்சர்)*
(The Hon. M. D. H. Jayawardena—Minister of Health)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) ඔව්. (ඊ) ඔව්. මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි විසින් ක්‍රියා කරගෙන යනු ලැබේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

දැනට අවුරුදු දහයකට පමණ කලින් ගෙවිය යුතුව තිබුණු මේ මුදල තව කොපමණ කාලයකින් ගෙවන්නට අදහස් කරනවා ද? මේ සේවකයා විශ්‍රාම ලබා දැන් අවුරුදු හතරක් පහක් ගතවී තිබෙනවා. ඔහුට විශ්‍රාම වැටුපත් නැහැ; හිඟ වැටුපත් නැහැ. එම නිසා ජීවත්වෙන්නට ක්‍රමයක් නැතිව සිටින මේ සේවකයා කෙරෙහි විශේෂ අනුකම්පාවක්වත් දක්වා මේ මුදල ඉතා ඉක්මණින් ගෙවන්නටය කියා ගරු ඇමතිතුමා නියෝගයක් කරනවාද?

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**
*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*
(The Hon. M. D. H. Jayawardena)

හිඟ වැටුප් ඉක්මණින්ම දෙනවා.

## බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පනත් කෙටුම්පත

*பௌத்த சிராவக்க தர்மபீட மசோதா*

BUDDHA SRAVAKA DHARMAPITHAYA BILL

**කල් තබන ලද විවාදය නව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [ජනවාරි 9. ]**

**"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු ඊරියගොල්ල]**

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

*ஜனவரி 9 ஆம் தேதிய விஞ மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப் பிக்கப்படுமாக"—[கௌரவ ஈரிய கொல்ல]

*விஞ மீண்டும் எடுத்தியம்பப் பெற்றது.*

*Order read for resuming Adjourned Debate on Question—[9th January.]*

"That the Bill be now read a Second time."—[*The Hon. Iriyagolle.*]

*Question again proposed.*

අ. භා. 2.18

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු කථානායකතුමනි, පෙරේදා මිනිත්තු දහයක පමණ කාලයක් තුළ මා කථා කළා. ඒ අවස්ථාවේදී මා එක් කරුණක් ගැන පමණයි කථා කරමින් සිටියේ. මේ බුද්ධ ධර්ම පීඨය පිහිටුවීමේ පරමාර්ථ හිතකර බව මා කියා සිටියා. ඒ සමගම, මේ බුද්ධ ධර්ම පීඨයට අදාළ වන පරිදි මේ ධර්ම පීඨයට ඇතුළු කර ගන්නා භික්ෂූන් වහන්සේලා ඉගෙන ගන්නා පිරිවෙන්වල වෙනස් කිරීම් රාශියක් ගරු ඇමතිතුමා කරගෙන යනවාය කියා මා සඳහන් කළා. මා එය සඳහන් කෙළේ මේ නිසයි. මෑතක දී ගරු ඇමතිතුමා හතර වැනි චක්‍රලේඛය නමින් පිරිවෙන්වලට එක්තරා චක්‍රලේඛයක් යවා තිබෙනවා. එය පිරිවෙන්වලට ලැබුණායින් පසුව ඒ පිළිබඳව විශාල ආන්දෝලනයක් ඇති වුණා. පරිවේණාධිපතින් වහන්සේලාගේ සංගමයත්, සමහර ස්වාමීන් වහන්සේලාත් මේ ගැන විරෝධය ප්‍රකාශ කර තිබෙනවා. ඒ හතර වැනි චක්‍රලේඛයෙන් යෝජනා කර තිබෙන පරිදි වෙනස් කිරීම් සිදු කරන්නට එපා යයි උන්වහන්සේලා ප්‍රකාශ කර තිබෙනවා. ඔය විධියේ චක්‍ර ලේඛයක් යවන්නට ප්‍රථමයෙන් එහි යෝග්‍ය අයෝග්‍යතාව ගැන කල්පනා කළ යුතුව තිබුණා.

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*
(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

මේ සාකච්ඡා වන්නේ පිරිවෙන් ගැන නොවෙයි. මේ සාකච්ඡා වන්නේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය ගැනයි. This Bill has nothing to do with pirivena education. This is a new university for bhikkhus.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඒක දෙන්නට යන්නේ භික්ෂූන් වහන්සේලාටයි. ඒ භික්ෂූන් වහන්සේලා මෙම ආයතනයට ඇතුළු වන්නට පෙර ඉගෙනීම ලබන්නේ පිරිවෙන්වලිනුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එහෙම නම් උන්වහන්සේලා මහණ වන්නට පෙර ගිහියන් නේද කියලත් කල්පනා කරන්නට එපායැ? ලොකු ගිහියන් වන්නට පෙර කුඩා ළමයින් බවත් ඊට පෙර අත දරුවන් බවත් යනාදී වශයෙන් කල්පනා කරන්නට වෙනවා නොවැ. ?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඔය විධියට පෙර ආත්මයටත් ගියා නම් ඇමතිතුමාට බොහොම ලේසියි නේ ද?

පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධයෙන් දැන් වෙනස් කිරීම් රාශියක් ඇති කර ගෙන යනවා. ඒ වෙනස් කිරීම් ක්‍රියාත්මක වුණොත් තමුන්නාන්සේලා පිහිටුවන්නට බලාපොරොත්තු වන බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයෙන් කිසිම ප්‍රයෝජනයක් නැති වෙනවා. කොටින්ම ඒ ධර්ම පීඨයේ ඉගෙනීම ලබන්නට ශිෂ්‍යයන් නැතිව යනවා. සිංහල, පාළි, සංස්කෘත යන භාෂාත් ඊට පසුව බුද්ධාගමත් අනිවාර්ය විය යුතු බව ඒ චක්‍රලේඛයේ සඳහන් වෙනවා. බුද්ධාගම අනිවාර්ය නොවිය යුතු බව ඊයේ පෙරේදා සමහර භික්ෂූන් වහන්සේලා කියා තිබෙන වාලු.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔව්.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඒ විධියට ප්‍රකාශ කළ භික්ෂූන් වහන්සේ කවුරුන් ද? පරිවේණාධිපතීන් වහන්සේලාගේ සංගමය නම් එවැන්නක් කියා නැහැ. කරුණාකර එසේ කී ස්වාමීන් වහන්සේලාගේ නම් සඳහන් කරන්න. ඒ විෂයයන් උගන්වන්නේ නැති ආයතන පිරිවෙන් නොවන බව පිළිගන්නටත් ඒවා වෙනම අංශයක් හැටියට සලකන්නටත් ඇමතිතුමාට සිදු වෙනවා. අද සෑම ප්‍රදේශයකම වාගේ ඇති පිරිවෙන් භික්ෂූන් වහන්සේලාට පමණක් සීමා වී නැහැ. උසස් අධ්‍යාපනයක් ලබා ගැනීම සඳහා ගිහි ශිෂ්‍යයන්ද පිරිවෙන්වලට ඇතුළත්ව සිටිනවා. ගිහි ශිෂ්‍යයන් පිරිවෙන්වල ඉගෙන නොගත යුතු බවට ඇමතිතුමා තුළ හැඟීමක් තිබෙනවා ද? ගිහි පැවිදි සම්බන්ධතාව වැඩි දියුණු වන්නට නම් පිරිවෙන්වල ගිහි ශිෂ්‍යයන් හා පැවිදි ශිෂ්‍යයන් ඉගෙන ගත යුතුයි. ඒ නිසා 10 වැනි වගන්තිය යටතේ නිකුත් කර තිබෙන 4 වැනි චක්‍රලේඛය ඉවත් කර ගන්නා ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ මාසයේ 19 වැනිදා මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු ඇගමැතිතුමා මුණ ගැසී සාකච්ඡාවක් කර බේරුමක් කර ගන්නට ස්වාමීන් වහන්සේලා බලාපොරොත්තු වන බව දැන ගන්නට තිබෙනවා. මේ අතර 4 වැනි චක්‍රලේඛය සුදුසු බව එක්තරා පිරිසක් කියනවාලු. එසේ කියන අය සිටිනවා නම් ඒ අය පරිවේණාධිපතීන් වහන්සේලා නොවන බව මතක් කරන්නට කැමතියි. පිරිවෙන් සම්බන්ධයෙන් මෙවැනි පියවරක් ගන්නට යනවා නම් වෙනත් ආගමික ආයතන සම්බන්ධයෙන්ද ඒ සමානම පියවරවල් ගන්නට ඇමතිතුමාට සිදු වෙනවා ඇති. සෙමනේරිවලටත් ඒ විධියට කරන්නට ඇමතිතුමා බලාපොරොත්තු වෙනවා ද? හොඳයි, "ඇක්වයිනාස්" එකට ඒ විධියට කරනවාද? ඒ ආයතන සම්බන්ධයෙන් ඒ විධියට ක්‍රියා කිරීම සුදුසු නැහැ. ඉතින් මේ රටේ පිරිවෙන් නැති වුණාට පසුව බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් මොකට ද? අන්න ඒකයි, මට තිබෙන ලොකුම බිය.

ගරු කථානායකතුමනි, මේ බුඩ ශ්‍රාවක ධර්ම පීඨය පිහිටුවන්නට යන්නේ කොයි ස්ථානයේද කියා පැහැදිලි වශයෙන්ම කියා නැහැ. ගරු ඇමතිතුමා කිව්වෙත් නැහැ. මා දන්නවා සමහර උදවිය මහනුවරට ඉල්ලුවා. තවත් කොටසක් අනුරාධපුරයට ඉල්ලුවා. වෙනත් නොයෙකුත් තැන්වලටත් ඉල්ලුවා. [බාධා කිරීමක්] කොහේ තිබ්බත් කියා හරි යන්නේ නැහැ. ගොඩනැගිලි තිබෙන්නේ කොහේද මේ සඳහා සුදුසු ප්‍රදේශය කුමක් ද කියන එක අඩු වශයෙන් මේ මොහොතේවත් ගරු ඇමතිතුමා ස්ථිර වශයෙන් තීරණය කරගන්නට ඕනෑ. අඩු වශයෙන් එය ගැනවත් කල්පනා කර තීර

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ණයකට බැස සිටින්නට ඕනෑ. ගරු ඇමතිතුමා මේ මොහොත වන තුරුත් ඒ කාරණය ගැන කල්පනා කර නැහැ.

හොඳයි ගුරුවරුන් ගැන කල්පනා කර තිබෙනවාද? පසුගිය ආණ්ඩු කාලයේ මේ කාරණය මතු වූ විට ස්ථානය තෝරා ගැනීමේ ප්‍රශ්නයටත් වඩා ප්‍රධාන වශයෙන් පැන නැඟී තිබුණු ප්‍රශ්නය නම් මූලික වශයෙන් ගුරුවරුන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කරන්නට ඕනෑය කියන එකයි. බුඩ ශ්‍රාවක ධර්ම පීඨයේ ත්‍රිපිටකය, බෞද්ධ සංස්කෘතිය, දර්ශනවාදය, තර්ක ශාස්ත්‍රය ආදිය උගන්වන්නට යනවා නම් ඒවා උගන්වන්නට ගුරුවරුන් සිටිනවාද කියාවත් අඩු වශයෙන් කල්පනාවට භාජන කර නැහැ. පසුගිය ආණ්ඩුව ඔය කරුණ ගැන සොයා බැලූ අවස්ථාවේ එක්තරා ස්ථානයක් මේ සඳහා සුදුසු ස්ථානය හැටියට අදහස් කළ බව මා හොඳින්ම දන්නවා. ඒ ස්ථානය නම් ගැටඹේ රාජෝපවනාරාමයයි. එය තිබෙන්නේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය අසලයි. ධර්මදූත කටයුතු වතාවත් ආදී ඒ ඒ දේවල් සම්බන්ධව එම විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරුන්ගේ හා කථිකාචාර්යවරුන්ගේ මාර්ගයෙන් කටයුතු කළ හැකි වන පරිදි සුදුසු අන්දමට ස්ථානයක් සකස් කරන්නට ඕනෑය කියා දැනට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයිතිව තිබෙන ගොඩනැගිලි වගයක් අරගෙන ඒ කටයුත්තට යෙදීමට එක්තරා වැඩ පිළිවෙලක් සකස් කර තිබුණා. එසේ කළේ ගුරුවරුන් නැතිවේය කියා බියක් තිබුණු නිසයි. එයට හේතුව මේකයි. මේ බුඩ ශ්‍රාවක ධර්ම පීඨය පිහිටුවන්නට යන්නේ හීනයාන ක්‍රමයටද, මහායාන ක්‍රමයටද, සෙන්වාදී ක්‍රමයටද එහෙම නැත්නම් වෙන යම් ක්‍රමයකටද කියා ආගම් කෙරෙහි ගෞරවයක් ඇති, ඒවා ගැන සොයා බලන කෙනෙක් හැටියටවත් ගරු ඇමතිතුමා සොයා බලා නැහැ. ඒ අන්දමට අවශ්‍ය ගුරුවරුන් ලබාගැනීමට වැඩ පිළිවෙලක් සකස් නොකළහොත් මේ ධර්ම පීඨයේ වැඩ කටයුතු ගෙනයෑම ඉතාමත්ම අමාරු තත්ත්වයකට පත් වෙනවා.

ගරු කථානායකතුමනි, විද්‍යොදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාල දෙක පිහිටුවීමේ දී මූලික පරමාර්ථයන් දෙකක් තිබුණා. සිංහල භාෂාව වර්ධනය කිරීම හා බෞද්ධ දර්ශනය ඉගැන්වීම සඳහා මේ විශ්ව විද්‍යාල දෙක ඇති කරනවාය කියා එම පනතේ පැහැදිලි කර තිබුණා. මේ පනතේ එවැනි කිසිවක් සඳහන් කර නැහැ. පරමාර්ථයන් දෙස බලන විට එහි ඉතා වැදගත් කොටස වන සිංහල භාෂාව සම්බන්ධව මෙහි සඳහනක් කර නැහැ. එහි උගන්වන පාඨමාලාව දෙස බලන විට අඩු වශයෙන් ඉතිහාසයවත් උගන්වන්නට අදහසක් නැති බව පෙනී යනවා. එහෙත් වුවමනා කරන අනිකුත් විෂයයන් වන සූත්‍ර, අභිධර්ම, විනය ආදී පිටකත් බෞද්ධ දර්ශනයත් ගැන සඳහන් වෙනවා. ඉතිහාසය ගැන සඳහන් කර නැහැ. අඩු වශයෙන් ලංකා ඉතිහාසය ගැන මූලික දැනීමක්වත් දිය යුතුයි. එය විෂය මාලාවට ඇතුළත් වී නැහැ. මා මෙය කියන්නේ වැදගත් හේතුවක් උඩයි. අපි ඉගෙන ගන්නා කාලයේදී ඉතිහාසය ඉගැන්නුවේ fපාදර් එස්. ජී. පෙරේරාගේ හා ජී. සී. මැන්ඩිස් මහතාගේ පොත්වලිනුයි. පෘතුගීසි යුගය, ඕලන්ද යුගය, බ්‍රිතාන්‍ය යුගය යන යුගයන් තුන බෙදා වෙන් කර පළමු වරට ඉතා විශිෂ්ඨ ඉතිහාසය පොතක් මේ රටට බිහි කළේ අගලවත්තේ ගරු මන්ත්‍රීතුමා වන ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා බව කියන්නට අපට පුළුවන්. මෙහි දැක්වෙන අන්දමට එතුමාගෙ පොත වුණත් හඳුරන්නට පුළුවන්කමක් ඇත්තෙ නැහැ.

පසුගිය දවස්වල උසස් අධ්‍යාපන පනත සම්බන්ධයෙන් විවාද කරන අවස්ථාවේදී අප කරුණු ඉදිරිපත් කළා, තර්ක කළා, ඒ වාගේම විශෙෂ කාරක සභාවේදී ද අප කියා සිටියා, මෙම විද්‍යා පීඨවලට උප කුල පතීන් වහන්සේලා පත් කිරීමේ කාර්යය ඇමතිතුමා භාර ගන්න එපාය කියා. අප තවදුරටත් පෙන්නා දුන්නා, උප කුලපතීන් වශයෙන් පත් කරන්නෙ පැවිදි අය හෝ ගිහි අය හෝ වේවා, එම කාර්යය ඇමතිතුමා භාර ගැනීම සුදුසු නැති බව. ඒ අන්දමට කරුණු පෙන්නා දුන්නේ වී නමුත් ඇමතිතුමා ඒ කාර්යය භාර ගෙන තිබෙනවා. එම පනත ගැන විවාද වන අවස්ථාවේදී අප සඳහන් කළා. ගරු ඇමතිතුමා එමගින් ගිහියන්ගෙන් පමණක් නොවෙයි පැවිදි පිරිසගේ පවා බෙල්ල කපා දැමීමට කටයුතු කරාවිය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

භයක් අප තුළ ඇති බව. ඒ අවස්ථාවේදී අප විරුද්ධත්වය දක්වුවත් මෙහිදීත් ඇමතිතුමා ඒ කාර්යයම භාර ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, ලංකා ගමනා ගමන මණ්ඩල පනත ඉදිරිපත් කළ අවස්ථාවේදී අපට පැහැදිලිව පෙනී ගියා, ඇමතිවරයාට ඇඟිලි ගහන්නට පුළුවන් කම ඇත්තෙ, ඇමතිවරයාට නියෝග නිකුත් කරන්න පුළුවන්කම ඇත්තෙ එකම වගන්තියක්—7 වන වගන්තිය—යටතේ පමණක් බව. එය එසේ වුණත් අධ්‍යාපන ඇමතිතුමා විසින් ඉදිරිපත් කළ උසස් අධ්‍යාපන පනතේ වගන්ති 54 කටම ඇමතිතුමාට ඇඟිලි ගසන්න පුළුවන්කම තිබෙනවා. මේ පනත කියවා බැලුවාමත් අපට පෙනී යනවා ඇමතිතුමාට ලුණු පොල්කට්ටටත් ඇඟිලි ගහන්න පුළුවන් අන්දමට මෙය සකස් කර ඇති බව. එම නිසා මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ වාගේ උසස් පත්වීම් වලට ඇඟිලි ගසන්න එපාය කියා. එය වෙනස් කළොත්, ඇඟිලි ගැසීමට ඇති ඉඩ කඩ නැති කළොත්, මෙම ධර්ම පීඨයේ අධිපතින්වහන්සේට විශාල සහනයක්, සෙතක් වෙනවා යයි මා විශ්වාස කරනවා.

අනික් කාරණය, ගරු කථානායකතුමනි, මා ඇත්තවශයෙන්ම විරුද්ධයි, මල්වතු පාර්ශ්වයේ මහානායක ස්වාමීන්වහන්සේට මෙම අධ්‍යාපන අනුශාසක මණ්ඩලයේ සභාපති පදවිය පවරනවාට. ඇමතිතුමාට පෞද්ගලික වශයෙන් උන්වහන්සේට ගරුත්වයක් කරන්න වුවමනා නම් එසේ කළාට කමක් නැහැ. නමුත් මෙවැනි තත්ත්වයක් ඇති කිරීමෙන්, තමුන් නාන්සේ කරන්නෙ සංඝයා භේද කිරීමක්. [බාධා කිරීමක්] එය මහා පාප කර්මයක්. මා හිතනවා, බුඩාගමේ උගැන් වීමේ හැටියට පංචානන්තරිය පාප කර්ම යන්ගෙන් එකක් එය. බුදුන්ගේ ලේ සෙලවීම, පියා මැරීම, මව මැරීම, රහතුන් මැරීම සහ සංඝ භේදය පංචානන්තරීය පාප කර්මයට ඇතුළත් වෙනවා. මෙයින් මා කලින් කීවා වාගේ කරන්න යන්නෙ සංඝයා භේද කිරීමක්.

ගරු කථානායකතුමනි, මෙම අනුශාසක මණ්ඩලයට පත් කරන්න යන මහා නායක ස්වාමීන්වහන්සේලා උසස් උදවිය බව අප කවුරුත් අවිවාදයෙන් පිළි ගන්නවා. සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ සභාපතීන් වහන්සේ, රාමඤ්ඤ නිකායේ මහානායක ස්වාමීන්වහන්සේ අනුරාධපුර අටමස්ථානයේ නායක ස්වාමීන්වහන්සේ යන ස්වාමීන්වහන්සේලා අනුශාසක මණ්ඩලයට පත් කිරීමට ඉතාමත් සුදුසු උසස් උදවිය බව අප කවුරුත් පිළිගන්නවා. ඒ සමගම මෙහි තිබෙනවා, " ඇමතිවරයා විසින් නම් කරනු ලබන තුන් නමකට නොවැඩි වෙනත් ස්වාමීන් වහන්සේලා ගණනක් " කියා. එයින් කියන්නෙ ඇමතිවරයාගේ අභිමතය පරිදි තුන් නමක් පත් කරන්න යන බවයි. එහෙම නම් මා තමුන් නාන්සේට මතක් කරන්නෙ ඒ තුන් නම පත් කිරීම නොකරන ලෙසටයි. එසේ පත් නොකොට ඒ කටයුත්ත ඒ ඒ නිකාය වලට භාර දෙන්න. මන්ද? ඒ ඒ නිකාය වල ලේඛකාධිකාරී ස්වාමීන් වහන්සේලා ඉන්නවා. එමනිසා එසේ පත් කිරීම තුන් නිකායට බෙදා දෙන්න. ඒ අන්දමට බෙදා දුන්නොත් අනිවාර්යයෙන්ම ඒ කටයුත්තෙන් තමුන්නාන්සෙ ගැළවෙනවා. ඒ හැරෙන්නට සභාපතිත්වය දැරීමට වඩා සුදුසු කව්රුන්ද කියා විනිශ්චය කර ගැනීමට ඒ ස්වාමීන්වහන්සේලාටම ඉඩ දෙනවා නම් වඩාත් හොඳයි. අපි හිතමු භික්ෂූන්වහන්සේලා දහ නමක් ඉන්නවාය කියා. එහෙම නම් ඒ දහ නමට භාර දෙන්න සුදුසු කෙනෙකු පත් කර ගන්න. මා එසේ කීමට හේතුව මෙයයි. මා කිසිම ස්වාමීන්වහන්සේ නමකට මගේ කියමනෙන් අගෞරවයක් කිරීමේ බලාපොරොත්තුවක් නැහැ. සමහර විට මල්වතු පාර්ශ්වයේ මහා නායක ස්වාමීන්වහන්සේ, වයෝවෘධ භාවය නිසා ඥණශක්තියෙන් දුර්වල වෙන්න ඉඩ තිබෙනවා. තමන්ට කැමති පරිදි නියම සුදුසු ස්වාමීන් වහන්සේ කෙනකු පත් කර ගැනීමට උප දේශක සභාවට ඉඩක් තිබෙන්න ඕනැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔය තර්කය දැන් කීපවරක්ම ඉදිරිපත් කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
Do you accept that?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
තමුන්නාන්සේ ඒ අදහසට එකඟ වනවා නම් මා ඒ ගැන ඊට වඩා කථා කරන්නේ නැහැ. එකඟ වන්නේ නැත් නම් මට ඒ ගැන තව කරුණු ඉදිරිපත් කරන්න තිබෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
But you should not repeat the same argument.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
දායක සභාව ගැන කරුණු ස්වල්පයක් කියන්නට තිබෙනවා. ඇත්ත වශයෙන්ම දායක සභාව සම්බන්ධයෙන් තිබෙන කොටසට සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරන්න සිද්ධ වෙනවා. මෙහි ඉතාමත්ම භයානක පියවරක් වී තිබෙන්නේ, දායක සභාව ගිහියන්ගෙන් සමන්විත වීම සහ එම ගිහියන්ගෙන් වැඩි කොටසක් පත් කිරීම ගරු ඇමතිතුමා විසින් කරනු ලැබීමයි. ඒ හේතුකොටගෙන මෙහි මුදල් ගසා කෑමේ වැඩ පිළිවෙළක් ඇති වෙනවාමයි කියා මා කියන්න කැමතියි. එසේ සිදු වීමට හේතුව මේකයි. දායක සභාවේ කැමැත්ත පරිදි ඒ ඒ ස්වාමීන් වහන්සේලාට මුදල් දීමට මෙම දායක සභාවට බල තල දෙන්නට යනවා. මෙම පනතේ එක් තරා තැනක තිබෙනවා ස්වාමීන් වහන්සේලාට මුදල් නොගෙවිය යුතුය කියා. ඒ ගැන මම දෙවනුව කියන්නම්. දායක සභාවට බල තල දීමට යනවා තමන් සතුටු පරිදි ඒ මුදල් යොදවන්න. කාගේ සල්ලි ද මේවා? මෙම පනතෙම තිබෙනවා, එක එක්කෙනාගෙන් ලබාගන්නා මුදල්වලින් ය මෙම වැඩ කටයුතු පවත්වාගෙන යන්නේ කියා. සමහර විට රජයෙන් ලබාගත් මුදල් වෙන්න පුළුවන්. සමහර විට තෑගි වශයෙන් ලබාගත් මුදල් වෙන්න පුළුවන්; එසේත් නැත්නම් යම් කිසි උපාසකම්මා කෙනෙක්, මෙය දියුණු වේවායි ප්‍රාර්ථනා කරමින් තමන්ගේ කණකර විකුණා ශ්‍රද්ධාවෙන් දුන් මුදල් වෙන්න පුළුවන්. අන්න ඒ නිසා මෙසේ මුදල් දීම ගැන කවදාවත් දායක සභාවට බලයක් දෙන්න එපා. අපේ ආගමේ හැටියට යම් දෙයක් භික්ෂූන් වහන්සේලාට දෙන්නේ සතරදිගින් වඩින මහා සංඝයාට පූජා වේවා කියායි. "ඉමං භික්ඛං සපරික්කාරං භික්ඛු සංඝස්ස දෙම" යනුවෙනුයි කියන්නේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
සාදු.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
කරුණු එසේ තිබියදී තමුන්නාන්සේ මොකක්ද කරන්න යන්නේ? "මාලේවත ඤාණිස්සර ථෙරස්ස දෙම" වේවි. එසේ නැත් නම් "ඇවමොට්ටාවේ අමරවංශ ථෙරස්ස දෙම" වේවි. එසේත් නැත් නම් "කඳුබොඩ ශීලක්ඛන්ධ ථෙරස්ස දේම" වෙන්න පුළුවන්. එතකොට මොකද වෙන්නේ? එසේ සිදුවේය කියන බයක් අප තුළ තිබෙනවා. සමහර උදවිය කුට්ටි කඩාගන්න ලැහැස්ති වේවි. එක් තරා භික්ෂූන් වහන්සේලා පිරිසක් පිරිවෙන් නියෝගවලට විරුද්ධයි. සමහර උදවිය ජනවාරි 31 වන දා වන විට අස් වෙන්න සූදානම් වෙනවාලු. සමහර කොටසක් කියනවාලු බොහොම හොඳයි කියා. ඒ මොකද? සංඝ භේදය ඇති කර කුට්ටි කඩා ගන්න පුළුවන් වන නිසා.

කථානායකතුමනි, මට ලොකුම කණගාටුවක් තිබෙන තවත් කාරණාවක් තිබෙනවා. බුද්ධාගම දියුණු කිරීම සඳහා පිරිවෙන් විශ්ව විද්‍යාල පනතක් 1959 දී සකස් කරන ලද්දේ අද ස්වදේශ කට යුතු භාර ඇමතිතුමායි. එතුමාගේ යුගයේත් ඊට පසු යුගයේත් වූ සේවාවන් දෙස බලන විට පිරිවෙන් විශ්ව විද්‍යාලවල ඉගැන්වීම සඳහා රජයේ මුදල් වැය කර රජයේ ගුරුවරුන් යවා තිබෙනවා. මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

කියන්නේ නැහැ, විද්‍යෝදය සහ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලවලිනුත් දියුණුවක් ඇති වුණේ නැත කියා. අද සැහෙන විධියේ ඉගෙනීමක් ලත්, අවබෝධයක් ඇති, ඔළුව තිබෙන භික්ෂූන් වහන්සේලා කොටසක් බිහි වී සිටිනවා. එදා වාගේ පඩික්කම් පුරව පුරවා සිටි අය වාගේ නොවෙයි, අර මතක පදය පමණක් කියන භික්ෂූන් වහන්සේලා වාගේ නොවෙයි.

මෙම බෞද්ධ ශ්‍රාවක ධර්ම පීඨයෙන් පර්යේෂණ අංශය දැනට වඩා දියුණු කිරීමට ගරු අධ්‍යාපන ඇමතිතුමා අදහස් කරනවා වෙන්න පුළුවන්. එසේ නම් විද්‍යෝදය සහ විද්‍යාලංකාර විශ්ව විද්‍යාලවලින් උගත් භික්ෂූන් වහන්සේලාගේ ඥාන ශක්තිය උඩය එය කරන්න පුළුවන් කියන එක පිළිගැනීමට තමුන්නාන්සේලාට සිද්ධ වෙනවා. එදා ඒ ශ්‍රේෂ්ඨ ක්‍රියාව කරන ලද්දේ බණ්ඩාරනායක ආණ්ඩුව විසිනුයි. එහෙත් කිරි දෙන මව්ගේ පයෝධර සපා කෑවාක් මෙන් 1965 මාර්තු 22 වෙනිදා එම පිරිවෙන් විශ්ව විද්‍යාල උඩින් කන කොකා පියාසර කරගෙන ගියා. ඒකයි වුණේ. මුදල් හදල් අතගෑමේ ප්‍රශ්නයේදී ටිකක් පරිස්සම් වන ලෙසයි, මා විශෙෂයෙන් මතක් කරන්නේ රජයෙන් දෙන මුදල් වේවා, පුද්ගලයන් ගෙන් ලැබෙන මුදල් වේවා, නිසියාකාර ඒ අයට නොලැබෙන්නට පුළුවනි. සමහරුන් ඒවායින් කුට්ටි කඩා ගන්නට පුළුවනි. ඒ ස්වාමීන් වහන්සේලාට කෙලින්ම පඩියක් ගෙවන්න බැරි මන්ද? එම මුදල් ඒ අයගේ අතට දෙන්නට වුවමනා කරන්නේ නැහැ. යම් කෙනෙක් මහණ වුණාම ඒ අය වෙනුවෙන් කප්පිය කාරකයෙක්—කැපකරු දායකයෙක්—පත් වෙනවා. කෙලින්ම ඔහු අතට දෙන්නට පුළුවනි, මේ මුදල්. ඔහු ලවා ඒ ස්වාමීන් වහන්සේගේ නඩත්තුව පවත්වාගෙන යන්නට පුළුවනි. අතට නොදී එසේ කළාම ප්‍රශ්නය ඉවරයි. 1954-55 බෞද්ධ කොමිෂන් සභා වාර්තාවේත් ඉන් පසු ශාසන කොමිෂන් සභා වාර්තාවේත් මේ ගැන සඳහන් වෙනවා. කෙලින්ම කැපකරු දායකයාට එම මුදල් දුන්නාම ඉවරයි. එහෙත් ඊයෙ පෙරේදා බෞද්ධ සම්මේලනයේ වයසක ඔළු ටිකක් කොහේ හරි කෙරෝලකට ගිහින් සාකච්ඡා කරලා විශාල යෝජනා වගයක් සම්මත කර ගන්නට ඇති. "හාමුදුරුවරුන්ට සල්ලි දෙන්නට එපා; හාමුදුරුවරුන් විසින් කරනු ලබන සේවය නිකම් කරන්නට ඕනෑ; ඒක සේවයක් හැටියටම කරන්නට ඕනෑ" යනුවෙන් යෝජනා කරන්නට ඇති.

යම් සේවාවක් කළ විට ඒ සඳහා යම් මුදලක් දෙනවා නම් එය වැරදියි කියනවා. එහෙත් රබර් වතු අක්කර සිය දහස් ගණන්වලින් ලැබෙන සල්ලි සල්ලි නොවෙයිද? ඒකයි, අපේ හිතේ අමාරුව. මේ බෞද්ධ සම්මේලනයේ සමහර අය අපේ ආගම පිරිසිදු කිරීම පිණිස ගන්න යම් යම් පියවරවල් දෙස බැලූ විට කණගාටු හිතෙන්නේ ඒකයි. තරුණ භික්ෂූන් වහන්සේලාගේ යම්කිසි සුළු වරදක් දුටු විට කෙන්ද කන්ද කර පෙන්වන්නා වාගේ කතා කිරීම ගැන ඇත්ත වශයෙන්ම අප විරුද්ධයි. කැපකරු දායකයාට මේ සල්ලි ටික දෙන්නය කියන එකයි අප කියන්නේ. භික්ෂූන් වහන්සේලා සල්ලි අත ගෑ යුතුද නොගෑ යුතුද කියන එක නොවෙයි ප්‍රශ්නය. ඒක උන්වහන්සේලා අනුගමනය කරනු ලබන නීති රීතිවලට අනුව පවතින දෙයක්. එහෙත් රජය මගින් මුදල් දෙන විට කැපකරු දායකයාට දෙන්න වැඩ පිළිවෙළ සකස් කළොත් ගසාකෑමේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම වෙනස් වී යනවා.

24 වන වගන්තියෙහි මෙසේ සඳහන් වෙනවා :

"A Bhikkhu who is appointed to any post in the University shall not be paid any emoluments."

ඒක කෙලින්ම කියනවා.

"Persons, other than Bhikkhus, in the employ of the University may be paid such emoluments as may be determined by Statute."

අනුරාධපුරයෙහි වේවා, වෙන කොහේ හරි වේවා, භික්ෂූන් වහන්සේලාට නඩත්තු වෙන්නට නිසි මුදලක් නිසි වැඩ පිළිවෙළක් ඇති නුනොත් මේ බෞද්ධ ශ්‍රාවක පීඨයේ භික්ෂූන් වහන්සේලාට නියම නත්ත්වයක් ලැබේවිද යන්න සැක සහිතයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා ඉතා වැදගත් කථාවක් කළා. 32 වන වගන්තිය යටතේ පවතින තත්ත්වය කුමක්ද? යමෙක් විශ්ව විද්‍යාල භූමියට ඇවිත් අසු වුණොත් ලිපියක් පමණක් ඔහු අතට දී උසාවියකට ගෙන ගොස් එක්තරා දඬයක් ගසන්නට පුළුවනි. ගිහියෙක්ද පැවිද්දෙක්ද කියාවත් වෙන් කර පෙන්වා දී නැහැ. සමහරවිට මේ ධර්ම පීඨය බලන්නට යාමට කැමති භික්ෂූන් වහන්සේ නමක් ඉන්නට පුළුවනි. මෙය ඇතුළේ කෙරෙන්නේ කුමක්ද කියන එක දැන ගන්නට එවැනි අය කැමැත්තෙන් සිටින්නට පුළුවනි. එහෙත් එවැනි භික්ෂූන් වහන්සේ නමකටවත් මෙම විශ්ව විද්‍යාල භූමියට ඇතුල් වන්නට බැහැ. මෙම පනතේ තිබෙන 33 සහ 34 වන වගන්ති යටතේ එය පැහැදිලි වෙනවා. මොන හේතුවක් උඩ මේ වගන්ති ඇති කර තිබෙනවාද කියා මට තේරෙන්නෙ නැහැ. බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය ඇතුළේ කෙරෙන වැඩ මොනවාද කියා බලන්නට යන්නවත් බැරි නම් මේ රටේ භික්ෂූන් වහන්සේලා මේ ධර්ම පීඨය ගැන විශ්වාසයක් තබයිද? මේ වාගේ සමිති සමාගම් කීපයකුත් ලංකාවේ තිබෙනවා. ඒවා කව්රුත් නොදන්නා සමිති සමාගම්. ඒවායින් ඉතාමත් ශ්‍රේෂ්ඨ වැඩ කොටසක් කෙරෙනවා. එහෙත් ඒවාට ඇතුළුවීම ටිකක් අපහසුයි. රාජකීය ආසියාතික සංගමය තිබෙනවා. ඉතාමත්ම පැරණි සංගමයක් වූ ඒ සංගමය මගින් පුරා විද්‍යාව සම්බන්ධයෙන් ඉතාමත් ශ්‍රේෂ්ඨ වැඩ කොටසක් කර තිබෙනවා. එහෙත් මේ රටේ ජීවත් වන අප, තමුන්නාන්සේලා බොහෝ දෙනෙක් ඒ සමිතියෙන් මොනවා කරල තිබෙනවද කියා දන්නෙ නැහැ. සමහර අය එවැනි සමිතියක් තිබෙනවාද කියාවත් දන්නෙ නැහැ. එහි සාමාජිකත්වය එක්තරා පිරිසකට පමණක් සීමා කර තිබෙනවා. පුරාවිද්‍යාව සම්බන්ධව වැඩ කටයුතු කිරීමටයි, ඒ සංගමය තිබෙන්නේ. එහෙත් එයින් කෙරී තිබෙන වැඩ මොනවාද කියා කව්රුවත් දන්නෙ නැහැ. එසේම මේ ධර්ම පීඨයත් භික්ෂූන් වහන්සේලා එක්තරා කොටසකට පමණක් සීමා වූ සැඟවුණු ස්ථානයක් වෙයිදෝ කියන භයක් අප තුළ තිබෙනවා. මෙතැනට ඇතුළු වන්නට කැමති යම් ගිහියකු සිටිනවා නම් ඔහුට එහි දොර සම්පූර්ණයෙන්ම වැසී තිබෙනවා. ධර්මානුකූලව, විනයානුකූලව ජීවත් වන්නට කැමති ගිහියන් රාශියක් මේ රටේ සිටිනවා. අනගාරික පිරිස්ය කියා ඉන්නවා. ඒ අය පැවිදි නොවූ ගිහියන්. ඒ නිසා කරුණාකර මේ වගේ වගන්ති මෙහි ඇතුළත් කරන්නට එපා.

අවසාන වශයෙන් තවත් එක කාරණයක් ගැන කියන්නට කැමතියි.

"Where a Bhikkhu who has received any degree, diploma or other distinction of the University ceases to be a Bhikkhu, he shall be deprived of such degree, diploma or other distinction and of all the privileges of the University which he enjoys."

ගරු කථානායකතුමනි, මේ වගන්තිය කොහෙත්ම සුදුසුය කියා මා නම් හිතන්නෙ නැහැ. බුරුම රට දෙස බලන්න. බුරුම රටේ කෙනකු අඩු ගණනේ තුන් මාසයකටවත් භික්ෂූන් වහන්සේ කෙනකු වී විනයානුකූලව, ධර්මානුකූලව ජීවත් වුණේ නැත්නම් ඔහුට විවාහ වන්නටවත් බැහැ. ඒකත් විශාල අඩුවක් හැටියට සලකනවා. [බාධා කිරීමක්] ඉස්සෙල්ලා අපේ ඇමතිතුමා මහණ කර ගත් තරමට හොඳයි. එතුමාගේ විවිධ මත දෙස බැලුවාම එතුමා බෞද්ධයකුද නැද්ද කියා අපට පැහැදිලි නැහැ. අඩු ගණනේ මේ විවාදයේදීවත් එතුමා දන්න බෞද්ධාගම ටිකක් ඉහළ මට්ටමෙන් අපට කියා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. බෞද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ පර්යේෂණ අංශයට එය ලොකු උපකාරයක් වෙනවා. මේ විවාදයේදී වල්පල් දොඩවන්නෙ නැතිව එතුමාගේ හැඟීම් ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔය වල්පල් නැවැත්වුවොත් මම කියන්නම්.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඇයි, මේ කොටස ඇතුළත් කළේ? සමහරවිට තමුන්නාන්සේ දන්නවත් ඇති, දන්නෙ නැතුවත් ඇති, විද්‍යෝදය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විශ්ව විද්‍යාලයේ, උප කුලපති පදවියට පත් කිරීමට වූවත් සුදුසු භික්ෂූන් වහන්සේ නමක් සිටියා. උන්වහන්සේ මහාචාර්යවරයෙක්; අපේ ගමේ කෙනෙක්. වල්පොල රාහුල ස්වාමීන් වහන්සේ පත් වන්නට පෙර උන්වහන්සේගේ නමත් උප කුලපති පදවිය සඳහා යෝජනා වෙලා තිබුණා. කුමන හේතුවක් නිසා හෝ එතුමාට සිවුරු හරින්නට සිද්ධ වුණා. සිවුරු හැරීමෙන් පසුවත් එතුමාගේ සේවය අවශ්‍ය වුණා. සිවුරු හැරියත් කමක් නැහැ. අද එතුමා මහාචාර්ය තනතුරක කටයුතු කරනවා. විශ්ව විද්‍යාලයකම එවැනි තත්වයක් තිබෙනවා නම් එහි තේරුම කුමක් ද? බුද්ධිය කියන එක කෙනකුට නැති කරන්නට පුළුවන් දෙයක් නොවෙයි. දක්ෂකම තිබෙනවා නම් ඊට ලැබිය යුතු නියම තැන කෙනකුට ලැබෙනවා. සිවුරු හැරියාය කියා—ඒ හේතුවෙන්ම, සිවුරු හැර ගිය පලීයටම—යම් කෙනකුට තිබෙන බුද්ධියවත් එයින් විදහාපාන හැකියාවත් නැති කරන්නට පනතකින් උත්සාහයක් දරතොත් එය කිසිසේත් සුදුසු නැහැ. ඊයේ හැන්දෑවේ මනුෂ්‍යත්වය පිළිබඳව දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) කළ දීර්ඝ දේශනයට පහරක් ගැහැව්වා වෙනවා, එවැනි ක්‍රියාවක්. ඒ නිසා එම වගන්තිය සම්පූර්ණයෙන් නැති කළ තරමට හොඳයි. ඒ වගන්තිය නැති කළොත් බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ වැඩ කටයුතු වඩාත් හොඳින් කරගෙන යාමට පහසුකම් ඇති වන බවයි මා නම් කල්පනා කරන්නේ.

මේ ගැන දැන් මීට වඩා කථා කරන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. මේ ගැන වැඩිපුර කථා කරන්නට වුවමනාවක් නැහැ. මෙය හොඳ පනතක් කාටවත් එය එසේ නොවේය කියන්නට බැහැ. එහෙත් මෙහි යම් යම් අඩුපාඩුකම් තිබෙනවා. ඒ අඩුපාඩුකම් සම්බන්ධයෙන් එක් ඉල්ලීමක් කරන්නට සිදු වී තිබෙනවා. කාරක සභාවේදී එය ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. කාරක සභාවේදී මේ ගැන හොඳ සම්පූර්ණ විවාදයක් කරන්නට අවස්ථාවක් දෙන්න. මේ රටේ ඉන්න ගරුතර භික්ෂූන් වහන්සේලාටත් කරුණා කර දැන්වීමක් කරන්න. දින ගණනාවක් තුළ අපට මේ ගැන සම්පූර්ණ විවාදයක් කරන්නට ඉඩ සලසා දී ඉන්පසු මෙය සම්මත වුණොත් විශාල සේවයක් සිදු වෙනවා ඇති. ඒ සේවය භික්ෂූන් වහන්සේ වෙනුවෙන් වන සේවයක් පමණක් නොවෙයි. සමහර විට පනතේ යම් යම් වැරදි තිබෙනවා. ඒවා ඉවත් කර පිරිසිදු කළොත් ඉන් පසු එය ක්‍රියාත්මක වන විට පිරිවෙන්වලින් එන්නට බලාපොරොත්තු වන්නන්ට හොඳ බෞද්ධාගමික පසුබිමක් ඇතිව විශිෂ්ඨ සේවයක් කර දෙන්නට, උපාධිය නිසාම නොව වෙනත් නොයෙකුත් කරුණු අනුව, ඉඩ සැලසෙනවා ඇති.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I should like to mention that it was agreed yesterday to take up the next item on the Order Paper. I was hoping that the Debate on Item 1 would be concluded by 4 o'clock. I was told that there were only two other Members who wanted to speak, but I find three others getting up.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.** (දොම්පෙ)
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)*
(Mr. F. R. Dias Bandaranaike—Dompe)

That is right. Religion is important.

**ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)
*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை)*
(Dr. N. M. Perera—Yatiyantota)

I do not think they will take long.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

Many will speak. They will not take long.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 2.48

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennakoon)

ගරු කථානායකතුමනි, දවස් ගණනාවක් තුළ වුවත් කථා කරන්නට තරම් වටිනාකමක් මේ පනත් කෙටුම්පතේ තිබෙන බව පළමුවෙන්ම සඳහන් කරන්නට කැමතියි. විවාදය කරගෙන යායුතු ආකාරය සම්බන්ධයෙනුත්, කාල සීමාව සම්බන්ධයෙනුත් අපේ නායකයින් මොන මොන විධියේ පොරොන්දු දී ඇද්දැයි කියන්නට මා දන්නේ නැහැ. ඒ පොරොන්දු ගැන එතුමන්ලා අපට සමහර විට කිසිම දෙයක් කියන්නේ නැහැ. ඒ නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් අපට මංමුළා වූවන්ගේ තත්ත්වයට වැටෙන්නට සිදු වෙනවා. කථා කරන බලා පොරොත්තුවෙන් අප මේ ගරු සභාවට පැමිණෙනවා. ඒ අතර, අපේ නායකයන් අපට හොරෙන් රහස් ගිවිසුම් ගහගෙන ඉන්නවා වාගේ පෙනෙනවා. සමහර විට ඒවාත් අර ෆේඩරල් පක්ෂයත් යූ. එන්. පී. එකත් එකට එකතුවෙලා ගහගෙන ඉන්න රහස් ගිවිසුම වැනි ඒවා වන්නට ඇති. අපේ අයිතිවාසිකම් නැති කර දමන්නටයි එවැනි ගිවිසුම් කෙරෙතොත් කෙරෙන්නේ.

මේ පනතේ තිබෙන වටිනාකම ගැන, අගය ගණ තේරුම් යන්නේ අපේ රට ගැනත්, බෞද්ධාගම ගැනත්, ගරුතර මහා සංඝරත්නය ගැනත් කල්පනා කරන විටයි. ඒ අනුව සලකා බලන විට මේ වැදගත් පනත ගැන දවස් ගණනාවක් වුවත් කථා කරන්නට, සාකච්ඡා කරන්නට ගත කළටා කමක් නැහැ. මෙහි විශේෂයෙන් සාකච්ඡා කරන්නට ඕනෑ දේවල් හුඟක්ම තිබෙනවා. මේ පනත ගැන කථා කළ ඇතැම් ගරු මන්ත්‍රීතුමන්ලා අපේ පක්ෂයේ අය වුවත්, වෙනත් පක්ෂවල අය වුවත්, බොහෝ දෙනා මෙහි නියම තත්ත්වය තේරුම් නොගෙන කථා කළ බවයි මට පෙනී ගියේ. යම් යම් කාරණා පටලැවිලි සහිතව හිතට ගැනීම නිසා හරියාකාර තේරුම් නොගෙන ඇතැම් ගරු මන්ත්‍රීන් කථා කළ බව මට පෙනී ගියා. අපේ පක්ෂයේ අය වුවත් කළ කථාවලින් ඒවාට සවන් දීගෙන සිටි මට තේරුම් ගියේ හරි අවබෝධයක්, වැටහීමක් නැතිව කථා කළ බවයි. ඒ බව මට ඉතාමත් පැහැදිලිව පෙනී ගියා.

මෙය දේශපාලන පක්ෂයකට අයිති ප්‍රශ්නයක් නොවෙයි. ඒ නිසා මෙය දේශපාලන පක්ෂයකට අයිති පනතකුත් නොවෙයි. වෙනත් වෙනත් පාටින් යුත් කණ්ණාඩිවලින් එක් එක් පුද්ගලයාට බලන්නට පුළුවන්කම තිබෙනවා. තමන් බලන කණ්ණාඩියේ පාට අනුව දකින දේවලටත් ඒ පාට වැටෙනවා. එහෙම බැලිය යුතු දෙයක් නොවෙයි මේ පනත. බෞද්ධ ධර්මය ඒ ඒ පුද්ගලයාට තම තමන්ගේ නැණැසේ පමණටයි තේරුම් යන්නේ. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද විනය පිටකයේ තිබෙන ක්‍රියා පිළිවෙළ අනුව ඒ දෙස බලන්නට ඕනෑ බව කියන්නට මා කැමතියි. මෙම පණත ගැන වැඩිපුර කථා කරන්නට මේ අවසථාවේදී වුවමනාවක් නැතැයි මා කලින් කීවේ, ස්ථාවර කාරක සභාවකදී මෙය තව දුරටත් විවේචනය කොට අප හැම දෙනාගේම අදහස් අනුව සාකච්ඡා කොට අපගේ සැක දුරු කර ගන්නට අවස්ථාවක් ලැබෙන නිසායි. දවස් ගණනක් මේ ගැන කථා කරන්නට වටිනවායයි මා පසුව කිව්වත් කාරක සභාවකදී ඊට ඉඩ ලැබෙන නිසා දැන් ඒ තරම් කථා කරන්නට වුවමනාවක් නෑ.

"බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය" යන නම ගැන මා වචනයක් කියන්නට ඕනෑ. "බුද්ධ" යන වචනයෙන් ලැබෙන්නේ "අවබෝධ කළ උත්තමයා" යන තේරුමයි. "දැනගත් උත්තමයා" යන තේරුමයි එයින් ලැබෙන්නේ. මොනවා දැන ගත් උත්තමයා ද? ආර්යයන් විසින් දැන ගත යුතු දේ දැන ගත් උත්තමයායි, "බුද්ධ" යන වචනයෙන් ඇඟෙන්නේ. මෙසේ දැන ගත යුතු, අවබෝධ කර ගත යුතු කරුණු මොනවාද? කිසිම කෙනකුට කවදාවත් කොයිම හැටියකින්වත් බොරුය කියන්නට බැරි "ඇත්ත හතරක්" ලෝකයේ තිබෙනවා. ඒ ඇත්ත හතර අවබෝධ කර ගත් දැන ගත් උත්තමයා "බුද්ධ" යන්නෙන් හැඳින්වෙනවා. දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යනු ඒ ඇත්ත හතරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

"ශ්‍රාවක" යනුවෙන් හැඳින්වෙන්නේ අසන, ශ්‍රවනය කරන, සවනට ගන්න තැනැත්තායි. මේ ශ්‍රාවකයින් සවනට ගන්නේ මොනවාද? බුදුන් වහන්සේගේ ධර්මයයි. ඒ අනුව, රහත්ව නිවන් දකින්නට උත්සාහ කරන උත්තමයාට ශ්‍රාවකයා යි අප කියනවා. මේ කරුණු තේරුම් ගත්තා නම් මේ පණත අවබෝධ කර ගැනීම එතරම් අමාරු වන්නේ නැහැ. මේ ධර්ම පීඨය මගින් ඇති කරන්නට යන්නේ බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා පිරිසක් මිස රක්ෂා කරන අයවත් පඩි ගන්නා අයවත් වෙනත් කෙනකුවත් නොවෙයි. ගරු ඇමතිතුමාගේ අදහස ඒක නම්——

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒක තමයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennakoon)
එය රටට ඉතාමත් අවශ්‍ය දෙයක්. එහෙම නම්, "අරයා සල්ලි අල්ලන්න හොඳද, අනෙක් තැනැත්තා පඩි ලබන එක හොඳද, තව කෙනකු රක්ෂාවක් කරන එක හොඳද" යන දේවල් තේරුම් කරන්නට අපට වුවමනාවක් නැහැ. ඒවා බුදුහාමුදුරුවන් විසින් විනය පිටකයෙහි තේරුම් කර දී තිබෙනවා. ඒ අනුව කට යුතු කරන්නට ඕනෑ. ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ පණත අනුව ඒවා කරන්නට බලයක් නැහැ. මේ විශාල කාර්යය කළ යුතුව තිබෙන්නේ භික්ෂූන් වහන්සේලා විසිනුයි. කාගේවත් අණක් නැතිව, පාර්ලිමේන්තුවක සම්මතයක් නැතිව භික්ෂූන් වහන්සේලා විසින් මෙය කළ යුතුව තිබෙනවා. ඒ වාගේම, මෙතැන ගුරු තත්ත්වයකට හෝ වෙන මොනයම් දේකට හෝ ගිහියන් ගැනීම වැරදියි. ගුණ සම්පන්න භික්ෂූන් වහන්සේලා, බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා ඇති කිරීම සඳහා එය ඉතාමත් අවශ්‍ය දෙයක්.

ඊළඟට ගරු කථානායකතුමනි, "ධර්ම" යන වචනයෙන් තේරුම් කීපයක් අපට ලැබෙනවා. ත්‍රිපිටකය, ස්වභාවය, ඥානය, යුක්තිය, සත්‍යය, ප්‍රකෘතිය, පින දත යුතු දේ යන මේ සියලුම අදහස් ධර්ම යන වචනයෙන් ලැබෙනවා. දැන් අපට මේ "බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය" යන නාමයෙන් තේරෙනවා, ගරු ඇමතිතුමා මේ ඇති කරන්නට යන්නේ, බුදු හාමුදුරුවන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය ඒ අයුරු පිළිගෙන, පිළිපැද රහත් මාර්ගයේ ගමන් කිරීමට සුදුසු පිරිසක් ඇති කරන ස්ථානයක් බව. එවැනි බුද්ධ ශ්‍රාවක පිරිසක් ඇති කරන ස්ථානය "බුද්ධ ශ්‍රාවක ධර්මපීඨය" යි. එවැනි පිරිසක් ඇති කිරීම විශේෂයෙන් සංඝ පරම්පරාවක් මඟින් කළ යුතුව තිබෙනවා. අද සංඝයා වහන්සේලා කොයි තරම් හිටියත් නියම විධියට පිළිවෙත් රකින සංඝයා වහන්සේලා සොයා ගැනීම දුර්ලභ බව අප සියලු දෙනාටම පිළිගන්නට සිදු වී තිබෙනවා. තමන්ට පන්දම් අල්ලන, තමන් වෙනුවෙන් මැතිවරණ රැස්වීම්වල කථා කරන උදවියට කාර් පූජා කරනවා නම්, ඉඩම් පූජා කරනවා නම්, ඒ අය ඉල්ලන රක්ෂා සපයනවා නම් අපේ බුද්ධ ශාසනයත්, ශීල්වත් භික්ෂු පරපුරත් ආරක්ෂා කිරීම බොහොම අමාරුයි. ඒ උදවිය එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් කටයුතු කළත් එකයි, මා වෙනුවෙන් නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් කටයුතු කළත් එකයි, සමසමාජ හෝ කොමියුනිස්ට් පක්ෂ වෙනුවෙන් කටයුතු කළත් එකයි. භික්ෂූන් වහන්සේ නමක් තුළ බුද්ධ පිළිවත නැත්නම් "තමුන්නාන්සේට සංඝයක් නැහැ" කියන්නට පුළුවන් තත්ත්වයක් අපට තිබිය යුතුයි. අපේ දේශපාලන වාසිය තකා භික්ෂූන් වහන්සේලාගෙන් ඒ විධියට ප්‍රයෝජන ගන්නවා නම් අපේ රටත්, බුද්ධ ශාසනයත් ආරක්ෂා කිරීම අමාරුයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
රට නොවෙයි, ශාසනය.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennakoon)
රාජ්‍ය ඇමතිතුමා කී දේ හරි. කෑම කාමරේදී මා අධ්‍යාපන ඇමතිතුමා සමඟ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සාකච්ඡා කළා. කථානායකතුමා දන්නේ නැතිව ඇති අපට තිබෙන කරදරය නැත් නම් අමාරුව. සතුන් මැරීමෙන් වැළැකීම, හොරකම් කිරීමෙන් වැළැකීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම, බොරු කීමෙන් වැළකීම, සුරා පානයෙන් වැළකීම, යනුවෙන් ශීල පහක් තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමාටත් මටත් ඒ ශීල පහෙන් එකක් දෙකක්වත් තිබෙන්නට පුළුවනි. සමහර විට අගමැතිතුමාටත් ඒ පහෙන් එකක් දෙකක් තිබෙන්නට පුළුවනි. අපට වී තිබෙන කරුමය නම් එයින් එකක්වත් නැති මනුෂ්‍යයකුට වැඳගෙන අප අර පහම ගත යුතුව තිබීමයි. ඉතින් මේ බොරුව හැම දාම කළේ නැත්නම් "මේකා බෞද්ධ විරෝධියෙක්, මූ බෞද්ධයෙක් නොවෙයි, සංඝයා වහන්සේට සලකන්නේ නැහැ, මූ බෞද්ධයෙක් නොවන නිසා ඡන්දය දෙන්නට එපා" කියා කියනවා. ඉතින් ඊට ඇති භය නිසා ඡන්දය ලබා ගැනීම සඳහා අප මේ බොරුව කරනවා. මා විතරක් නොවෙයි අගමැතිතුමාගේ සිට කවුරුනුත් දැන දැනම මේ වැරැද්ද කරනවා. මගේ කීම ඇත්ත බව අධ්‍යාපන ඇමතිතුමා පිළිගන්නවා ඇති.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඇත්ත, ඇත්ත.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennakoon)

එහෙත් ශාසනය හදන්නට නම් අප මේ ආත්ම වංචාවෙන් තොරව කටයුතු කරන්නට ලෑස්ති විය යුතුයි. අප ඇමතිවරුන් වුණත් මන්ත්‍රීවරුන් වුණත් අපේ ආගමේ හැටියටත්, ස්වභාව ධර්මයේ හැටියටත් අප සියලු දෙනාම මේ තනතුරුවලින් පමණක් නොවෙයි ජීවිතයෙනුත් පහ වන දවසක් කවදා හෝ තිබෙනවා. එවැනි තත්ත්වයක් ඇති අප විසින් මේ බෞද්ධ ධර්ම පීඨය ඇති කිරීම ඉතාමත් අවශ්‍යව තිබෙනවා. එම නිසා, මේ ගැන කෙසේ ක්‍රියා කළ යුතුදැයි ස්ථාවර කාරක සභා අවස්ථාවේදී අපි තවදුරටත් සලකා බලමු.

ගරු කථානායකතුමනි, මම මේ ළඟදී දවසක් ගුවන් විදුලියට සවන් දෙන අවස්ථාවක—ඔය වැවිලි ආදිය ගැන කථා කරන්ට ඉස්සරවෙලා—මට ඇහුන, ගුවන් විදුලිය මගින් මෙහෙයවන ධර්ම සාකච්ඡාවක්. මට නම් වශයෙන් මතක නැහැ. උසස් සංඝයා වහන්සේලා ඒ සාකච්ඡාවට සහභාගි වුණා. ඒ සංඝයා වහන්සේලාගෙන් කෙනෙක් අසා එවා තිබුණා, මේ කාලයේ මාර්ගඵලවල පිහිටන්න පුළුවන්ද කියා. සාකච්ඡාවට සහභාගි වූ සංඝයා වහන්සේලා තුන් නමම කෙලින්ම පිළිතුරු දුන්නේ, මේ කාලයේ මාර්ගඵලවල පිහිටන්න බැහැ, කියායි. ඒ නිසා වෑයම් කරන්ට වුවමනාවක් නැති බව උන්වහන්සේලා කියා සිටිය. එහෙත් මේ ඊයෙ පෙරේද ආරණ්‍ය සේනාසනයක වැඩ වසන සංඝයා වහන්සේ නමකගෙන් මම ඇසුව, ඒ කාරණය ඇත්තද කියා. අපට මේවා පිළිබඳව හරි අවබෝධයක් නැති නිසා අපි මේව සොයා බලන්න එපාය. අපි මේව ගැන ආධුනිකයො. පොතපතෙන් දැන ගත්ත දෙයක් හැරුණු කොට ඒව ක්‍රියාත්මක කරල ඒ සත්‍ය ධර්ම පිළිබඳව ලොකු අවබෝධයක් ලබා ගත් අය නොවෙයි. ඇයි ඒ නිසා අපි අපට වඩා මේවා ගැන තේරුම් ඇති අයගෙන් අහල බලල දැන ගන්න එපාය. මම ඒ ස්වාමීන් වහන්සේගෙන් ඇහුව, මේ කාලයේ මාර්ගඵලවල පිහිටන්න පුළුවන්ද කියා. උන්වහන්සේ කිව්ව, ඒකට කාල නියමයක් නැහැ කියා. බුද්ධ ධර්මය නෛර්‍යාණික ධර්මයක් බව වැඩි දුරටත් උන්වහන්සේ ප්‍රකාශ කළා. ඒ නිසා උත්සාහ කළොත් මාර්ග ඵලවල පිහිටන්න පුළුවන් බව ඒ ස්වාමීන්වහන්සේ කිව්ව. ඔය වගේ මතභේද තිබෙනවා. එහෙත් මිනිසුන් කොයි දවසේ ගුණධර්ම පිරුවත් ඒ ආරක්ෂා කරන ගුණධර්මවල අගය, වටිනාකම, බලය, කවදාවත් නැති නොවන බව අපට වැටහෙනව. ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ කොහොම අදහස් කළත්, ඒ ගුණධර්මවල වටිනාකම අදත් මම පිළිගන්නව.

අපේ පොත පතේ උගන්වා තිබෙනව, බුදුරජාණන් වහන්සේ පාරමිතා පිරූ බව. උන්වහන්සේ දස පාරමිතා පිරුව. ඒ පරමිතා පිරීමේ බලයෙන් තමයි උන්වහන්සේ බුදු වුණේ. අදත් සංඝයා වහන්සේලාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

සිව්පස ලැබෙන්නෙ, ගෞරවය ලැබෙන්නෙ, තත්ත්වයක් තිබෙන්නෙ එදා බුදු රජාණන් වහන්සේ පිරූ පාරමිතා ධර්මවල බලයෙනුයි. ඒ නාමයටත් අද භික්ෂූන් වහන්සේලාට සිව්පසය ලැබෙන ව කියා, ගරු සම්මාන ලැබෙනව කියා, අපට හිතන්ට පුළුවන්. ඒ නිසා එවැනි පිළිවෙලක් ඇති කිරීම බොහොම වැදගත් දෙයක් බව අපි කියනව.

අපේ දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ජයකොඩි මයා.) කථා කරද්දී ඇමතිතුමා ප්‍රකාශ කළා, මේ පීඨය කොහේ තිබුණත් කමක් නැහැ කියා. ඒකට නම් අපට එකඟ වන්ට බැහැ, මේ පීඨය සුදුසු ස්ථානයක පිහිටුවන්න ඕනැ. මම කියන්නෙ නැහැ, පේරාදෙනියේ අර ගඟ අයිනේ මේක පිහිටුවන්න ඕනැ කියා. එහෙත් මේ පනතෙ මූලික අදහසට ගැළපෙන——

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගැළපෙන තැනක. බොහොම හරි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

මූලික අදහසට ගැළපෙන තැනක මේක පිහිටුවන්න ඕනැ බව අප කවුරුත් පිළිගන්න දෙයක්. ඒ වගේම බෞද්ධ ධර්මය යනුවෙන් මෙතැන අදහස් කර තිබෙන දේ නම් මම අදහස් කර තිබෙන්නෙත්, ඒ ධර්මය මෙතෙක් පරිහාණිය කරායි ගමන් කර තිබෙන්නෙ. පිරිවෙන් ක්‍රමය වුණත්, සංඝයා වහන්සේලා වුණත්, අද ප්‍රපාතය කරා ගමන් කරන බව අපට පෙනී යනව. බුද්ධ ධර්මය අනිවාර්ය කරනවාට විරුද්ධ ඇතැම් භික්ෂූන් වහන්සේලා පිරිවෙන්වල සිටිනවාය කියා මා අසා තිබෙනවා. ගරු ඇමතිතුමාත් එදා එම ප්‍රකාශය කළා. තුන් සූත්‍රය අපේ ආගමේ ප්‍රධාන ස්ථානයක් ගන්නවා. මංගල සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය හා රතන සූත්‍රය යනු ඒ සූත්‍ර තුනෙයි. භික්ෂූන් වහන්සේ නමක් වුණොත් ඒවා දැනගෙන කට පාඩමෙන් කියන්නට පුළුවන් කම තිබෙන්නට ඕනැ. නමුත් මේ තුන් සූත්‍රයවත් නොදන්නා සංඝයා වහන්සේලා දැන් පිරිවෙන්වලත් විශ්ව විද්‍යාලවලත් ඉඳින බව අපට දැනගන්නට ලැබී තිබෙනවා. සාමාන්‍යයෙන් කල්පනා කර බලන විට අද සංඝයා වහන්සේ කෙනෙකු වන එකක් ෆැෂන් එකක් වී තිබෙන බව අපට පෙනෙනවා. බුද්ධ ධර්මය අනුව සියලු දුක් නැති කිරීම පිණිස මම මේ බුදු රජාණන් වහන්සේගේ චීවරය භාර ගන්නවාය කියන අදහස ඇතිව මහණ වීමේ සිරිත දැන් සම්පූර්ණයෙන්ම නැතිවී තිබෙනවා. සමහරු දේපොළ නිසා සමහරු පරම්පරාව නිසා මහණ කරනවා. ඇත්ත වශයෙන්ම බෞද්ධයින් හැටියට අපට කියන්නට ලජ්ජා වන කරුණු තිබෙනවා. පරම්පරාවේ කෙනෙකු හැර වෙන කිසිම කෙනෙකු මහණ නොකරන සමහර පන්සල් තිබෙනවා. තමන්ගේ නෑයකු, බෑණා කෙනෙකු නැත්නම් පුතකු වෙන්නට ඕනැ මහණ කරන්නට. අක්කගෙ පුතකු නැත්නම් මල්ලිගෙ පුතකු වෙන්නට ඕනැ. නැත්නම් එම කුලයේම කෙනෙකු වෙන්නට ඕනැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

පුතකු වන්නේ කොහොමද ?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඥාති පුත්‍රයකු වෙන්නට ඕනැ. නැත්නම් තමන්ගේම පුතකු වෙන්න ඕනැ. තමන්ගේම පුතා මහණ කර තිබෙන තැනුත් තිබෙනවා. එහෙම තැනුත් තිබෙන බව මම දන්නවා. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය ගැන කථා කරන්නටත් ලැජ්ජයි.

ගරු කථානායකතුමනි, අප ගුණවත් කමට සලකන්නට පුරුදු වී නැහැ. ඒක ප්‍රධාන කාරණයක්. "ඇයි අපි තමුන්නාන්සේලාට සලකන්නෙ? මට වඩා තමුන්නාන්සේ තුළ තිබෙන ගුණවත්කම මොකක්ද?" කියා මා සංඝයා වහන්සේලාගෙන්ම ප්‍රශ්න කර තිබෙනවා. මා එක්තරා ස්ථානයකදී, පාරෙ අයිනක හාමුදුරු නමක් සමග කථා කර කර සිටියා. එතැනින් යන එන මිනිසුන් මට වැඳ වැඳ ගියා. නමුත් අර හාමුදුරුවන්ට වැන්දේ නැහැ. සමහර විට මේ හාමුදුරුවෝ මා තරම් වත් ගුණවත් කෙනෙකු නොවන්නට ඇති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එමනිසා මේ මිනිසුන් හාමුදුරුවන්ට නො වැඳ මට වැඳ වැඳ යනවා වෙන්නට ඇත කියා මා කල්පනා කළා.

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

මන්ත්‍රීතුමාට ලොකු වැරදීමක් වී තිබෙනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரி. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

පාර්ලිමේන්තු ලේකම්තුමාට තරම් මිනිසුන්ට වැරදී නැහැ.

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ)*

(Mr. S. de S. Jayasingha)

හාමුදුරුවන්ට වැඳපු එක මන්ත්‍රීතුමා භාර ගෙන තිබෙනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரி. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

එමනිසා අප සියලු දෙනාම ගුණවත්කම ට සලකන්නට පුරුදු වෙන්නට ඕනෑ. දේශපාලන ව්‍යාපාර නිසා තමයි හුඟක් දුරට ගුණ ධම් පිරිහී තිබෙන්නෙ. එය අප පිළිගත යුතුයි. මේ තත්ත්වය නැති කරන්නට කුමක් කළයුතුද යන්න ගැන අප කිසිවකු කල්පනා කරන්නේ නැහැ. ඇමතිතුමාගේ අදහස මේ ධම් පීඨය පිහිටුවා නියම සංඝයා වහන්සේලා පිරිසක්, බෞද්ධ ධර්මය උගත්, බෞද්ධ ප්‍රතිපත්ති රකින සංඝයා වහන්සේලා පිරිසක් ඇති කිරීම නම් අප බොහොම කැමති වෙනවා. ඇමතිතුමාගේ අදහස මෙය නම් අප මේ පනත් කෙටුම්පතට සම්පූර්ණ සහයෝගය දෙනවා. දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා වාගේ ලුණු පොල් කටුවටත් ඇඟිලි ගසන්නට පුළුවන් වන තරමට මේ පනතින් ඇමතිතුමාට බලය ලබා ගෙන තිබෙනවා. ඉතින් මොකද කරන්නෙ? බලය දෙන්න වෙන කෙනෙකු නැති නම් එතුමාවත් බලය අරගෙන අවංකව ඒක කරනවා නම් හොඳයි. බුද්ධාගම ආරක්ෂා කර ගන්නට යයි කියමින් පොළොන්නරු, අනුරාධපුර, මහනුවර හා සීතාවක යුගවලදී සමහරුන් එය විනාශ කිරීමට කටයුතු කළ බව අපට අමතක කරන්නට බැහැ.

තවත් කාරණයක් කිව යුතුව තිබෙනවා. යම් යම් උදවිය බුදු හාමුදුරුවන් වහන්සේගේ ධර්මය තමන්ට වුවමනා හැටියට, තමන්ට වාසි වන අන්දමට වෙනස් කර ගෙන තිබෙන බව බණ පොත්වලින් පේන බවත් අපට අමතක කරන්නට බැහැ. මා මේවා කියන විට සමහරුන් මා සමඟ අමනාප වන්නට පුළුවනි. එහෙත් ඇත්ත නොකියා බැහැ. අපේ අධ්‍යාපන ඇමතිතුමාත් ඒ කාලයේ සිටම ආගමික ප්‍රශ්න ගැන කෙළින්ම අදහස් ප්‍රකාශ කර ඇති බව මා දන්නවා. ඒ නිසා සමහර ස්වාමීන් වහන්සේලා එතුමා සමඟ අමනාප වී සිටියා. 1956 දී එතුමාත් අපත් එකට වැඩ කරද්දී පවා එතුමා ආගමික ප්‍රශ්න සම්බන්ධයෙන් සිය අදහස නොබියව ප්‍රකාශ කළා.

අද ඇත්ත වශයෙන් පිළිගැනෙන දෙය සමහර විට හෙට බොරු විය හැකියි. ඒ වාගේම අද බොරුවක් වශයෙන් පවතින දෙය හෙට ඇත්තක් විය හැකියි. කෙසේ වෙතත් අද අපට ඇත්ත යයි හිතෙන දේ ඒ හැටියෙන්ම ප්‍රකාශ කරන්නට අපට පුළුවන් විය යුතුයි. බොරුව ඉවත් කර ඇත්ත තෝරා ගන්නට අසන්නන්ට අවස්ථාවක් දෙන්නට ඕනෑ. ඇත්ත කථා කරන්නට අපට අවස්ථාවක් තිබෙන්නටත් ඕනෑ. හිතේ එකක් තියාගෙන තවත් එකක් කියන්නට හොඳ නැහැ. මෙවැනි ප්‍රශ්නවලදී විශේෂයෙන්ම අප ඒ ගැන ප්‍රවේශම් විය යුතුයි. ඒ නිසා නියම හැඟීමක් ඇතිව නියම ශ්‍රාවකයන් වහන්සේලා බිහි කිරීමට මෙම බුද්ධ ශ්‍රාවක ධම් පීඨය පිහිටුවනවා නම් එය ඉතාමත්ම වැදගත් කාරණයක් බව අප සියලු දෙනාම පිළිගත යුතුයි. මේ ලෝකයෙහි දැනට නම් එවැනි ආයතනයක් නැති බව දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ජයකොඩි මයා.) පවා ප්‍රකාශ කළා. බෞද්ධාගම පවතින කුමන රටකවත්, මේ අදහස් කරන අන්දමේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

ධර්ම පීඨයක් තිබෙන බවක් දැන ගන්නට නැහැ. අපත් සාමාන්‍යයෙන් බුද්ධාගම ගැන අසා තිබෙනවා. පොතපත කියවා තිබෙනවා. අපටත් සාමාන්‍ය අවබෝධයක් තිබෙන හෙයින් නියම බුද්ධාගමේ සහ අද ක්‍රියාත්මක වන බුද්ධාගමේ වෙනසක් තිබෙන බව පෙනී යනවා. එසේ හෙයින් නියම බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා බිහි කිරීම පිණිස කිසියම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරතොත් එය ඉතාමත්ම ප්‍රසංශනීය කටයුත්තක් බව මතක් කරන්නට කැමතියි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව තිබෙද්දීත් මෙවැනි කටයුත්තක් ගැන හිත යොමු වී පැවතුණා. එදා සිටි අධ්‍යාපන ඇමතිතුමාත් එතුමාගේ පාර්ලිමේන්තු ලේකම් වශයෙන් සිටි මාත් මෙවැනි ආයතනයක් පිළිබඳව යම් යම් අදහස් ඇතිව සිටියා. මෙම පනත කියවාගෙන යන විට මට හැඟී ගියේ එදා අප කල්පනා කරන ලද අදහස් මෙම පනතෙහිත් අඩංගු වී තිබෙන බවයි. අපට වුවමනා කෙළේත් නියම බුද්ධ ශ්‍රාවකයන් පිරිසක් ඇති කිරීමටයි. මෙම පනතේ පරමාර්ථයත් එයම බව පේනවා.

ගරු කථානායකතුමනි, භාෂා ශාස්ත්‍ර ගැනවත් ආගමික වැඩ පිළිවෙළවල් ගැනවත් අපට හුඟක් දුරට සතුටු වන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. පොළොන්නරුව, මහනුවර, කෝට්ටේ ආදී ප්‍රදේශයන්හි පිරිවෙන්වලින් ඉගෙන ගත් අය සිටියා. අදත් පිරිවෙන්වලින් ඉගෙන ගන්නා අය සිටිනවා. පිරිවෙන්වලින් ඉගෙන ගත් අය, එහෙම නැත්නම් පන්සලෙන් ඉගෙන ගත් අය තුළ විශේෂ හික්මීමක් තිබෙනවා. අනිකුත් අයට වඩා ඒ අයගේ පැවතුම්වල විශේෂයක් තිබෙනවා. ඒ අය අනෙක් අයට වඩා වෙනස් ආකාරයට හැදුණු අය යයි කියන්නට පුළුවනි. අපේ සභ්‍යත්වය අනුව ඒ අය හැඩ ගැසී සිටිනවා. පන්සලේ දී අකුරු ඉගෙන ගැනීමේ එක්තරා පිළිවෙළක් තිබෙනවා. අ.... ක...... බ...... යනුවෙන් පන්සලේදී ඉගෙන ගන්නේ නැහැ. ඒ කාලයේ "සවස්ති සිද්ධම්" කියා ලියන්න කියන්නේ සයන්නේ සයනු බැඳි වයන්නේ, සයන්නේ ඒ සයනු බැඳි තියන්නේ, සයන්නේ ඉස්පිල්ල ලියාලුයෙන් සියන්නේ...... සඤ්ඤක මහාප්‍රාණ දමන්නේ ......ඔන්න ඔය විධියටයි. අයන්නම කියනවා නම්, අයනු කී අයන්නේ, අයනු ආයනු කී ආයන්නේ, ඇලපිල්ල ලියාලුයෙන් ආයන්නේ...... ඔය විධියට බොහොම අමාරුවෙනුයි කියන්නේ. අපට ඒ කාලයේ සිංහල හෝඩිය කියවන්නට පුළුවන් වුණේ ඔය විධියට එක අකුර තුන් හතර වරක් කියවලයි.

ගරු කථානායකතුමනි, හුඟ දෙනෙක් දැන් ඉංගිරිසිය ගැන නහින්න හදනවා. දැන් සිටින ගුරුවරුන්ගෙනුත් හුඟ දෙනෙක් සිංහල අකුරුවත් දන්නේ නැති අය. අපට විශ්ව විද්‍යාල නම් හුඟක් තිබෙනවා. පිරිවෙන් විශ්ව විද්‍යාල, අර විශ්ව විද්‍යාල, මේ විශ්ව විද්‍යාල කියා විශ්ව විද්‍යාල නම් තිබෙනවා. ගරු ඇමතිතුමාට එක්තරා කරුණක් කියන්නට කැමතියි. යම්කිසි සාකච්ඡාවක් සඳහා මා පාසැලකට ගියා. එහි මූලාසනය මට බාර දී න්‍යාය පත්‍රයකුත් දුන්නා. මා එය කියවාගෙන යන විට මට පුදුම හිතුණා. රැස්වීම අවසානයේ මා ඒ න්‍යාය පත්‍රය සාක්කුවේ දමා ගත්තා. ගරු කථානායකතුමනි, එහි හත්වැනි අංකයට සාකච්ඡා කියන වචනය ලියා තිබෙනවා. එය ලියා තිබෙන්නේ මෙන්න මෙහෙමයි. සායන්නයි මහාප්‍රාණ බයන්නයි හල් වයන්නයි මහාප්‍රාණ ඡායන්නයි. මෙය බලාගන්නට ගරු ඇමතිතුමාට දෙන්නට මා කැමතියි. ඔන්න මුල් ගුරුවරයකු විසින් ලියා මට දෙන ලද සටහන. අවස්ථාවක් ආවොත් කියන්නට හිතාගෙන මා එය සාක්කුවේ දමා ගත්තා.

ගරු කථානායකතුමනි, අපේ කැම කාමරයේදී එක්තරා මහා විද්‍යාලයක විද්‍යාලයාධිපතිවරයෙක් මට මංගල්‍යාරාධනා පත්‍රයක් දුන්නා. එහි තිබෙන්නේ විද්‍යාලයාධිපතිතුමා මහත්මයා, විද්‍යාලයාධිපතිතුමාගේ භාර්යාව මැතිණිය, මමයි මගේ භාර්යාවත් ටී. බී. තෙන්නකෝන් යුවල. එවා තිබෙන්නේ නිකම්ම සෙරෙප්පු කුට්ටම කියා කිව්වා වාගේ පළාතේ මන්ත්‍රීවරයාත් මන්ත්‍රීවරයාගේ භාර්යාවත් නිකම්ම යුවල. අර අය මහත්මයා හා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැතිණිය. එසේ ලියා ඇත්තේ නූගත් කමට; භාෂාව පිළිබඳව නොදන්නාකමට. ඉංගිරිසි එකේ නම් "මිස්ටර් ඇන්ඩ් මිසිස්" කියා තිබෙනවා. මගේ නම එතැනට දම්මා නම් බේරෙන්න තිබුණා. මේක ඔහුගේ වරදක් නොවෙයි. භාෂාව ගැන නොදන්නාකම. ඒ තැනැත්තා අපේ ළමයින් දහස් ගණනකට උගන්වන මහා විද්‍යාලයක විද්‍යාලයාධිපතිවරයෙක්. මේ අයද ඉතින් උගන්වන්නේ? මේ අයද ගුණ ධර්ම උගන්වන්නේ? මේ අයද අකුරු උගන්වන්නේ? මේ අයද අපේ ශිෂ්ටාචාරය උගන්වන්නේ? මේ අයද භාෂාව පිළිබඳව ළමයින්ට උගන්වන්නේ? ඔය තත්ත්වයෙන් මේ රට මුදා ගන්නට ඕනෑ. ගුණධර්මවලින් එක පිළිවෙළක්. අනික දැනීම. රටේ තිබෙන භාෂාවත් පාවිච්චි කරන අන්දම දැන ගන්නට ඕනෑ. ඒ නිසයි මේ පිළිවෙළට කියන්නේ.

වැඩිදුර කථා කරන්නට වුවමනාවක් නැහැ. ගරු කථානායකතුමනි, පිරිවෙන්වල ඉගැන්වීම ඉතාම හොඳින් කෙරී ඇති බව අපේ සන්දේශ පොත් ආදී පොත් බොහොමයක තිබෙනවා. මෙන්න හංස සන්දේශය: ඒ අවදියෙ කැරගල පත්මාවතී පිරිවෙණේ සංඝයා වහන්සේලා උගෙන ගත් ආකාරය ගැන මෙම පොතේ පැහැදිලි විස්තරයක් කරනවා. නිකවැරටියෙ මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) මේ ගැන කථා කරන්න බලාපොරොත්තු වන නිසා දීර්ඝ වශයෙන් මා කථා කරන්න යන්නෙ නැහැ. කෙසේ වුණත් ඒ අවදියේදී භික්ෂූන් වහන්සේලා උගත් ආකාරය ගැන මෙහි විස්තර කර ඇති අන්දම මෙහෙමයි:

සරණ වැඳ ගුරුන් කියවා දිනෙන් දින
පරණ අලුත් පොත් පෙරළා පතින් පත
දරණ කරන ලෙස ඉඳ ගෙන වෙනින් වෙන
හෙරණ සික කියති හෙරණෝ තැනින් තැන

විවරණ:—

එම පිරිවෙන්හි හෙරණසික ඉගෙන ගන්නා සාමණේර වහන්දෑලා ගුරුවරුන්ගේ දෙපා වැඳ දිනපතා එය අස්වාගෙන පරණවූද අලුත්වූද ඒ පොත් පත්තිරුවක් පත්තිරුවක් පාසා පෙරළමින් තැන් තැන්වල තනිතනිවම ඉඳගෙන කටපාඩම් කෙරෙති.

හෙරණසික:—

සාමණේර තැන් විසින් පළමුකොට හික්මිය යුතු කරුණු ඇතුළත් ග්‍රන්ථය හෙරණ සිඛ නමින් දනුදු ප්‍රසිද්ධයි.

ඒ කාලයේදී සාමණේරයන් වහන්සේලා පළමුකොට හික්මිය යුතු ආකාරය ගැන විස්තර ඇතුළත් ග්‍රන්ථයටයි හෙරණ සිඛ කියන්නෙ. සාමනේර ශික්ෂාව ඉස්සෙල්ලාම ඉගෙන ගන්න ඕනැ, පිරිවෙන්වල. දැන් පිරිවෙන්වල මොනවා ඉගෙන ගන්නවාද කියන්න මා මා දන්නෙ නැහැ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

දැන් හු කියනවා.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

මෙන් සක කිරඹ පිරිසිදු කැරැ සිල් ගු ණය
ඉන් සැක නොවී කරනුව සසර තර ණය
නන් සික පද නිබඳ රකිනා ලෙස ප ණය
මුන් සික සිකවළඳ විමසන සඟ ග ණය

විවරණ:—

හක් ගෙඩියෙහි වත් කළ කිරි මෙන් පිරිසිදු සීල ගුණයෙන් යුක්තව නිසැකව සංසාර සාගරයෙන් එතරවීම පිණිස නානා විධ ශික්ෂා පදයන් පණ මෙන් රකින්නාවූ මුලුසික හා සිඛවළඳවිනිස ඉගෙන ගන්නා භික්ෂු සමූහයක් ද ඇත.

ඔන්න ඕවයි ඒ කාලයෙ උගන්වා තිබෙන්නෙ. ගරු ඇමතිතුමා දන්නවා ඇති මා විස්තර නොකළාට මේවා ගැන. තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

එසමන් බදුරු මුනි සදහම් පෙළෙහි ඇ ති
ලෙස සන් සඳ සමස් ඈ දැනුමට පැවැ ති
අසමින් නැස ටීකා විනිස සැක නැ ති
කසයින් විරිත සමහරු වන පොත් කෙරෙ ති

විවරණ:—

ඇතැම් ශිෂ්‍යයෝ පින වචනයෙහි හෙවත් බුද්ධ ධර්මයෙහි සඥ සන්ධි සමාසාදිය දැනීමට කච්චායන වුත්තිය හෙවත් කච්චායන ව්‍යාකරණය න්‍යාස ටීකාවන්ගේ විනිශ්චයත් සහිතව පුහුණු කෙරෙති.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. තෙන්නකෝන් මයා.]

ඔන්න ඒ කාලයෙ ඉගෙන ගත් ඒවා. දැන් කාලයෙ අය ඒ ව්‍යාකරණය තබා ජෝහැන්නස්ගේ ව්‍යාකරණ පොතෙන් වත් ව්‍යාකරණ උගෙන ගෙන තිබෙනවා දැයි කියන්න දන්නෙ නැහැ. තවදුරටත් මෙසේ සඳහන් වෙනවා :

සසරණ පිවිස විදිනා දුක් ඉමෙක් නැ ති
තිසරණ පිණිස වඩමින් තම සිතෙහි බැ ති
දෙසරණ සිරස කැරැ වැඳි ගුරුවරුන් නි ති
නිසබණ විනිස සමහර සඟ ගණ අස ති

විවරණ :—

ඇතැම් භික්ෂූහු සසර දුකෙහි සීමායෙක් නැතැයි යන සැලකීමෙන් සරණ සිලයෙහි භක්තිමත්ව ගුරුන් පාමුල වැඳ වැටී නිසබණ ඇසීම හා විචාරී මත් කෙරෙති.

පසිඳු නොයෙක් වත පිළිවෙතැ තිර සරහු
මුනිඳු සසුන් වැඩ වැඩුමට වැර සැරහු
පුබුදු නැණින් තෙර පදවියට වී තරහු
පුරුදු කෙරෙති තෙර බණ එහි සම හරහු

විවරණ :—

ඇතැම් භික්ෂූහු වත්පිළිවෙත් සරුව බුද්ධශාසනයෙහි දියුණුව පිණිස උත්සාහවත්ව ප්‍රබෝධ වූ නුවණින් ස්ථවිරත්වයට සුදුසු බණ දහම් පුරුදු කෙරෙත්.

සොඳුරු පොරණ ඇඳුරෙල් නොහැර පිවිතු රු
විදුරු නැණින් පිරිසිඳ දුරර මොහඳු රු
මියුරු බසින් සැකහැර දෙසන විසිතු රු
ගැඹුරු විජම් පෙළරුත් අසති සමහ රු

ඇතැම් තියුණු නුවණැති භික්ෂූහු සර්වඥතාඥනයෙන් පිරිසිඳ මොහඳුරු දුර ලා මධුර වචනයෙන් සැක හැර දෙසූ ගැඹුරුවූ අභිධම්පාළිය හා පෞරාණික අර්ථවාචනාමාගීය වෙනස් නොකොට උගත් වන අර්ථය ද උගනිති.

මදක් ඇසුව සිදුවන සගමොක් කැම ති
නොයෙක් රඟින් මොක් සිදු නොකොට
නොනැව ති
උදක් දෙසැට මිසදිටු මුල් සිඳ පැව ති
අයෙක් සුතුරු පෙළදම් පදරුත් අස ති"

ගරු කථානායකතුමනි, මේ අන්දමට ඒ කාලයේ භික්ෂූන් වහන්සේලා උගත් ආකාරය ගැන මේ පොතෙහි විස්තර කර තිබෙනවා. අද සිද්ධ වී තිබෙන්නෙ මේවා ගැන දැනීමක් නැති කමයි. එතැනයි ලෙඩේ ඇත්තෙ. මෙයට වඩා දීර්ඝ වශයෙන් කථා කිරීමට මගේ අදහසක් නැහැ. ඒවා තේරෙන්නේ නැත්තේ උසස් පෙළය කියන අය අතර මේ රටේ ඌරුවට හැඩ ගැසුණු මිනිසුන් නැති නිසයි. මා එක් අතකින් සතුටු වෙනවා, අපේ අධ්‍යාපන ඇමතිතුමා ගැන. එතුමා ටිකක් අපේ ගමේ ඌරුවට හැදුණු මනුෂ්‍යයෙක් නිසා, කරුණු ගැන ටිකක් දන්නා, දැනුම් තේරුම් ඇති, ධර්මය ගැන අවබෝධයක් ඇති, විනයක් පිළිබඳ සලකන, සිංහල සිරිත් විරිත් ගැන හැඟීමක් සහ ආදරයක් ඇති ඇමතිවරයකු නිසා එතුමන්ට ටිකක් මේ කාරණා තේරෙනවා. ඒ ගැන මගේ සන්තෝෂය ප්‍රකාශ කරනවා.

කාරක සභා අවස්ථාවේදී තමුන්නාන්සේලාට දෙන්නට පුළුවන් සෑම උදව්වක්ම දෙන්නට අප අදහස් කරන අතර, මේ ගැන දීර්ඝ වශයෙන් කථා කිරීමට මා අදහස් කරන්නේ නැහැ. නියම පිළිවෙළේ බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් ඇති කිරීමට තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා නම් ඒ බලාපොරොත්තුව සර්වප්‍රකාරයෙන්ම සඵල වේවායිද, එහි ආශිර්වාදය රටට ලැබේවායිද, මේ රටේ සංඝයා වහන්සේලාගේ තත්ත්වයත්, අපේ බුද්ධ ශාසනයේ තත්ත්වයත් උසස් වීමෙන් බුදුන් වහන්සේ දෙසා වදාළ නිර්මල බුද්ධ ධර්මය අපේ රටේ විද්‍යමාන තත්ත්වයට පත් වේවායි ද ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 3.30

**වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන** (අම්බලන්ගොඩ)

*(வைத்திய கலாநிதி எம். எச். சத்தாசேன —அம்பலாங்கொடை)*

(Dr. M. H. Saddhasena—Ambalangoda)

ගරු කථානායකතුමනි, බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් පිහිටුවීම සම්බන්ධයෙන් පනතක් ඉදිරිපත් කිරීම ගැන අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට මුළු මහත් ජනතාවගේම—විශේෂයෙන්ම බෞද්ධ ජනතාවගේ—ගෞරවය හිමි වෙනවා. ඒ වාගේම දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා අවංකව ප්‍රකාශයක් කිරීම ගැන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් මා එතුමාට මගේ ගෞරවය පිරිනමනවා. එතුමා ප්‍රකාශ කළා, ශීලය නියම වශයෙන් රකින ඇත්තන් ටික දෙනාය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඉන්නේ, එම නිසා සමහර ස්වාමීන් වහන්සේලාට වදින්නට පවා සමහර උදවිය ටිකක් මැලි කරනවාය කියා. එම නිසා මේ අවස්ථාවේදී මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ විෂකුරු සර්පයන්ගෙන් ඉවත් වී අප හා සමග එක්වන්නය කියා. එවැනි අයට වදිනවා පමණක් නොවෙයි, දඹරාවේ රතනසාර වැනි චීවර ධාරකයන් පෙළපාලි ගොස් මැරුණාට පස්සේ දේශපාලන ප්‍රයෝජනය තකා, බෞද්ධයන් යයි කියා ගන්නා යම් යම් උදවිය, වර්ෂයක් වර්ෂයක් පාසා, ඒ චීවර ධාරකයා දිවි පිදූ වීරයෙක් වශයෙන් හඳුන්වා කටයුතු කරන බව පෙනෙනවා. ඇත්ත වශයෙන්ම අද බුද්ධාගම අන්ත ප්‍රපාතයට වැටී තිබෙනවා.

තමුන්නාන්සේලාගේ යුගයේදී විද්‍යෝදය විද්‍යාලංකාර විශ්ව විද්‍යාල බිහි වුණා. ඉතාමත් නිර්මලව තිබුණා වූ විද්‍යෝදය සහ විද්‍යාලංකාර පිරිවෙන්, විශ්ව විද්‍යාලය බවට පරිවර්තනය කර, එයට ඇතුළු වී උගන්නා සංඝයා වහන්සේලාට භූගෝල ශාස්ත්‍රය, ගණිත ශාස්ත්‍රය, අර්ථ ශාස්ත්‍රය ආදිය ඉගෙනීමට සලස්වා, අර මන්ත්‍රීතුමා කිව්වා වගේ සිංහල හරි හැටි ලියන්න කියන්න බැරි තත්ත්වයට පත් කළා. එපමණක් නොවෙයි, භික්ෂු සංහතියම අද නැති වේගෙන යනවා. ඒ මොකද? උපාධිය ලබාගත් වහාම විශ්ව විද්‍යාලයේදී ඇතිකර ගත් ප්‍රේම සම්බන්ධය නිසා චීවරය පසෙකට දමා ගෙදර යන තත්ත්වයක් අද ඇති වී තිබෙනවා.

මේ විධියේ තත්ත්වයක් ඇති වී තිබෙන අවස්ථාවකදී බුද්ධාගම ආරක්ෂා කර ගැනීමට නම් මෙවැනි බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයක් ඇති කිරීම ඉතාම අවශ්‍යයි. ඒ වාගේම එය පිහිටුවීම සඳහා පුරාණයේ පටන්ම ආගමික පරිසරයකින් යුත් අනුරාධපුර ශුද්ධ නගරය ඉතාමත්ම සුදුසුයි. මා හිතනවා මේ ගැන මුළු මහත් බෞද්ධ ජනතාවගේ ගෞරවය අධ්‍යාපන ඇමතිතුමාට ලැබෙනු ඒකාන්තයි. මෙහි පරමාර්ථ සම්පූර්ණයෙන්ම අප විසින්ද අනුමත කරන අතර මෙයින් ඉටු විය යුතු තවත් කරුණු කීපයක් කෙරෙහි ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ සැලකිල්ල යොමු කරන්න කැමතියි.

අද අපේ දරුවන්ට ඉගෙන ගැනීම සඳහා නියම බෞද්ධ පරිසරයෙන් යුත් පොත පත නැහැ. ඉතිහාසය සකස් කිරීම පමණක් නොව, විශේෂයෙන් බෞද්ධ පාසල්වල ඉගෙනීමට සුදුසු අන්දමේ පාඨමාලා අඩංගු පොත් සකස් කිරීමද මෙහි පරමාර්ථය විය යුතු බව මා යෝජනා කරනවා.

මෙහි අනුශාසක මණ්ඩලය පත් කිරීමේදී ගරු ඇමතිතුමා විසින් යෝජනා කර ඇති පිළිවෙළ අප පිළිගන්නවා. මෙම අනුශාසක මණ්ඩලය පත්කිරීම පිළිබඳව තමුන්නාන්සේ යෝජනා කරන ලද පිළිවෙළ අප පිළිගන්නා අතර එක් කාරණයක් පමණක් විශේෂයෙන් සඳහන් කරන්නට කැමතියි. සියම් නිකාය අමරපුර නිකාය යනාදී නිකායන්හි ප්‍රමුඛත්වය නැතිනම් නායකත්වය ඇතැම්විට පැවරෙන්නේ උගතුන්ට නොව වයොවෘද්ධ භික්ෂූන් වහන්සේලාට බව කවුරුත් පිළිගන්නා දෙයක්. විශ්ව විද්‍යාල පරිවෙනා ස්ථානයක් වශයෙන් පවත්වන හෙයින් මෙම ස්ථානයෙහි සභාපතිත්වය දිය යුත්තේ උගතකුටයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
සිල්වතකුටයි.

**වෛද්‍යාචාර්ය සද්ධාසේන**
*(வைத்திய கலாநிதி சத்தாசேன)*
(Dr. Saddhasena)
සිල්වත් උගතකුටයි. අපි හිතනවා, සේරම සිල්වත්ය කියා. අපේ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාත් මාත් සිල්වත් වන්නට උත්සාහ ගන්නවා වාගෙයි. දැන් පෙනෙන අන්දමට මෙහි බලය තිබෙන්නේ ඇමතිතුමා විසින් පත් කරන්නාවූ නව දෙනකුට පමණයි. ඇමතිතුමා ගැන අපේ කිසිම අවිශ්වාසයක් ඇත්තේ නැහැ. එහෙත් මේ යුගයේ බෞද්ධයැයි කියා ගන්නා ඇතැම් භික්ෂූන් වහන්සේලා බුද්ධ ධර්මයට වඩා මාක්ස් ධර්මය හොඳයැයි කල්පනා කරන බව අප දන්නවා. [බාධා කිරීම්] මල්වට්ටි අරගෙන කළුතර බෝධියට එහෙම යනවා. [බාධා කිරීම්] ආණ්ඩුව කවදා පෙරලේද දන්නේ නැහැ. එසේ වුණාම එවැනි මාක්ස්වාදියෙක් බලයට පත් වුණොත් මෙවැනි පත්කිරීම්වලට සිදු වන්නේ කුමක්ද යන ප්‍රශ්නයට මම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලාගේ අවධානය යොමු කර වනවා. එසේ හෙයින් සමස්ත ලංකා බෞද්ධ සම්මේලනයෙන් තිදෙනෙකුත් නිකාය තුනෙන් තිදෙනකුත් ඇමතිතුමා විසින් තිදෙනකුත් පත් කරන්නේ නම් බුද්ධ ධර්මය මාක්ස්වාදයට යටවීමේ භයානක විපතින් මිදෙන්නට අවස්ථාව සැලසෙනවා.

ගරු කථානායකතුමා ප්‍රකාශ කළා, මෙම විවාදය 4 ට ඉවර කරන්නට වුවමනා බව. එසේ හෙයින් මා මේ සම්බන්ධයෙන් මීට වඩා කාලය ගත කරන්නට කල්පනා කරන්නේ නැහැ. පරිහානියෙන් පරිහානිය කරා ගමන් කරන බුද්ධ සාසනය නගා සිටුවීමටත් බෞද්ධ භික්ෂූන් වහන්සේලා විනයානුකූලව හැඩගැස්වීමටත් බුද්ධ ධර්මය ලංකාවෙහි පමණක් නොව මුළු මහත් ලෝ තලයෙහිම ප්‍රචාරය කිරීමටත් මේ මගින් ආධාර ලැබේවා කියමින්, මේ බණ ඇසුවාවූ අපට දඹුල්ලේ ගරු මන්ත්‍රීවරයාගේ සහාය හැමදාම ලැබේවායි ප්‍රාර්ථනය කරමින් මගේ කතාව අවසාන කරනවා.

අ. භා. 3.36

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னக்கோன்)*

(Mr. M. Tennakoon)

මෙම භාරදූර වැදගත් පණත අවංක සිතින් ඉදිරිපත් කිරීම ගැන අධ්‍යාපන ඇමතිතුමාට අප ඉතාමත් ස්තුතිවන්ත වෙනවා. මට එක වෙලාවකට හිතෙනවා මේ රටේ කෙරෙන ඔක්කොම වීර ක්‍රියා කරන්නට සිදු වන්නේ සත්කෝරළේ ඇත්තන්ටමය කියා. තමුන්නාන්සේත් එහි කොටස් කාරයෙක්. වාරියපොල හාමුදුරුවන් ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. සත්කෝරළේ කොඩිය ගැන තමුන්නාන්සේ දනන්වා. ඒක වීරත්වය එඩිතරත්වය සහ නිර්භීතත්වය පෙන්වන කොඩියක්. කඩුව නැතුව සිංහයන් මෙන් සටනට යන ගතියක් ඇති සත්කෝරල වාසීන් අතර කෙනෙකු වූ අපේ ඇමතිතුමා මෙවැනි පනතක් ඉදිරිපත් කිරීම ගැන අපේ ස්තුතිය නැවතවරක් එතුමාටෙ පුද කරන්නට කැමතියි. මෙම පනත එක්තරා උසස් මට්ටමකින්ම ඉදිරිපත් කිරීම ගැන මා නැවත වරක් එතුමාට මගේ ස්තුතිය පුද කරනවා. මෙම පනතින් පහත් දේශපාලන වාසියක් ලබා ගන්නට එතුමා බලාපොරොත්තු වූයේ නැහැ.

අපේ දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. තෙන්නකෝන් මයා.) විසින් පවත්වන ලද කතාව ඉතා උසස් මට්ටමකින් කෙරුණා. අම්බලංගොඩ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය සද්ධාසේන) ඒ මට්ටම පහතට හෙලුවා. ඒ මන්ත්‍රීතුමා, අප සාකච්ඡා කරන වැදගත් පනතේ වැදගත්කම විවාදයේදී ආරක්ෂා කර ගැනීමට තරම් සුපරීක්ෂාකාරී නොවී, අවශ්‍ය නැති සිද්ධීන් මේ විවාදයට ඇද ගැනීම ගැන අපේ ගණගාටුව පළ කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ පනත ඉදිරිපත් කිරීමෙන් ඇමතිතුමා බලාපොරොත්තු වන්නේ බෞද්ධ ධර්මය, නියම බෞද්ධ ප්‍රතිපත්තිවලට හැකි තරම් අදාළ වන අයුරින් පුරුදු පුහුණු කිරීමට ස්ථානයක්—පීඨයක්—මේ රටේ ඇති කිරීමයි. ගරු ඇමතිතුමා පනත ඉදිරිපත් කරන අවස්ථාවේදී බොහොම වැදගත් විධියට, බොහොම ශ්‍රෙෂ්ඨ විධියට කිව්වා, මේ පනතේ අඩුපාඩු එමට ඇති, අපි එකතු වී ඒවා හරිගස්සා ගනිමු, එහෙත් භේදවලින් තොරව මේ පනත සම්මත කරමු කියා. ඒ වැදගත් අදහස ගැන අපි ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ පරමාර්ථයේ පිරිසිදුකම අපට එයින් පෙනෙනවා. තමා සර්ව සම්පූර්ණ කියා එතුමා කොහොමටවත් කියන්නෙ නැහැ. ඒ නිසා අඩුපාඩු තිබෙනවා නම් අපේ ඉලක්කය කරා යාමට හේතු වන පරිද්දෙන් අපි ඒවා හරිගස්සා ගනිමු කියා එතුමා කිව්වා. ඒ අනුව අප සංශෝධනය ඉදිරිපත් කළ විට ගරු ඇමතිතුමා ඒවා ඒ විධියට පිළිගැනීමට ලෑස්ති වෙනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, කථාවක් කෙරෙන අවස්ථාවේදී ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් කියවුණු වචනයක් මට මතක් වුණා. මේ පනත සකස් කරන්නේ ශාසන දියුණුව පිණිසය කියා එතුමා කිව්වා. මේ පනත ඇති කරන්නේ ශාසන දියුණුව පිණිස බව ඇත්තයි. එහෙත් ශාසනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇති වී තිබෙන්නේ කාගේ දියුණුව පිණිස ද යන්නත් ගරු රාජ්‍ය ඇමතිතුමා මට වඩා හොඳට අවබෝධ කරගෙන සිටිනවා ඇතැයි මා කල්පනා කරනවා. මා හිතන පිළිවෙළට බුද්ධ ධර්මය ගැන විශාල දැනීමක් ගරු රාජ්‍ය ඇමතිතුමාට තිබෙනවා. සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ධර්මය දේශනා කිරීමේ පරමාර්ථය වූයේ කුමක් ද යන්න ගැන පූජ්‍ය වල්පොල රාහුල හිමිපාණන් මේ පොතේ ලක්ෂණ විවරණයක් කර තිබෙනවා "ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය" නමැති මේ පොතේ එය බොහොම පැහැදිලිව මෙසේ කියා තිබෙනවා :

"ක්‍රිස්තු පූර්ව 6 වැනි ශත වර්ෂයෙහි බරණැස් ඉසිපතනයෙහිදී පස් වග තවුසන්ට බුදුන් දේශනා කළ ප්‍රථම ධර්ම දේශනාවෙන් පහළ වුණු බුද්ධ ධර්මය මුලදී බුද්ධිය හා සදාචාරය පෙරටු කොට ගත් ව්‍යාපාරයක් විය."

අද අපට වුවමනා වී තිබෙන වැදගත්ම දේ තමයි, මෙන්න මේ සදාචාරය. ඒකයි, අර මන්ත්‍රීතුමා උගත්කමය කියා කිවේ. සමහරවිට පොතපත ලියන්නට, විවේචනය කරන්නට උගත්කම තිබෙන්නට පුළුවන්. එහෙත් තමන්ගේ ජීවිතයට ඒ උගත්කම ගැබ් කර ගන්නෙ නැති අය ඉන්නවා. එවැනි උගතුන් අපට ඒ තරම් අවශ්‍ය වන්නෙ නැහැ. අපට වුවමනා කරන්නේ උගත්කම, විද්‍යාව, දැනීම යන දේ මොනවා ද කියා දැන ගෙන තමන්ගේ ජීවිතවලටත් ඒවා හරියාකාර ගැබ් කරගෙන තමන්ගේ එදිනෙදා ජීවිත ශීලවන්තව ගත කරන ඇත්තනුයි. අපේ ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන පනතේ අන්තිම පරමාර්ථය වන්නේ එයයි. ඒ නිසා මේ ධර්ම පීඨය මගින් මාර්ගෝපදේශකයන් සකස් කරගෙන ඉන්පසු අපේ රටේ අප බලාපොරොත්තු වන සාමය, සමාදානය, සදාචාරය ආරක්ෂා කර ගැනීම සඳහා අවස්ථාවක් ඇති කර ගැනීමට අප බලාපොරොත්තු වෙනවා. එම නිසා ගරු ඇමතිතුමා මුලින්ම ප්‍රකාශ කළ පරිදි මේ පනතේ වචනවල තිබෙන යම් යම් දුර්වල තැන් සහ අඩුපාඩුකම් සකස් කර සම්මත කරවා ගන්නට ලැස්ති වනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ඒ අනුවම ඇති වන යම් යම් වැදගත් කරුණු තිබෙනවා නම් ඒවාත් විධිමත් ලෙස විවේචනයට භාජන වීමට ඉඩ හැර වඩාත් පිරිසිදු ලෙස සකස් කර ගැනීමට ඉඩ දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

යෝජනා කර තිබෙන මේ පීඨයෙන් කොයි තරම් දුරට ප්‍රයෝජන ලබා ගැනීමට හැකි වන පරිදි මෙය සකස් වන්නේ දැයි අප විසින් ඉතාම ඕනෑකමින් කල්පනාවට භාජන කළ යුතු වෙනවා. ධර්මාශෝක රජතුමා තරම් බෞද්ධාගමේ නිර්මල ප්‍රතිපත්තීන් තමන්ගේ රාජ්‍ය පාලන කටයුතුවලට පාවිච්චි කරන්නට උත්සාහ කළ තවත් භූපාලයකු සිටියේ දැයි සොයා ගැනීම අපහසු දෙයක්. අශෝක රජතුමන් ගැන ඉතා වැදගත් කරුණු රාශියක් රාහුල හිමිපාණන් වහන්සේ විසින් ලියන ලද පොතක සඳහන් වී තිබෙනවා. මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කළ යුතු දේවල් හැටියට මා මේවා ගණන් ගන්නා නිසයි මෙසේ සඳහන් කරන්නට බලාපොරොත්තු වන්නේ. ඒ කොයි හැටි වෙතත් මා ප්‍රශ්නයෙන් පිට යතැයි තමුන්නාන්සේ කල්පනා කරනවා නම් ඒ අනුව ඔබතුමා දෙන ඕනෑම තීරණයකට මා යටත් වෙනවා. කාලය ගෙවා දැමීමේ ද්වේෂසහගත සිතකින් නොවෙයි මා කථා කරන්නේ. ම විසින් මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මතු කරනු ලැබිය යුතු වැදගත් කරුණු පමණයි මා සඳහන් කරන්නේ. කාලය මදිය කියා ඒවා නොකියා අත්හරින්නට බැහැ.

"අශෝක රජ රාජ්‍යප්‍රාප්තියෙන් අවුරුදු සවල්පයකට පසු බෞද්ධෝපාසකයෙක් විය. එහෙත් අවුරුදු දෙකක් තුනක් ගත වන තෙක් ඔහු තමාගේ මේ අලුත් ආගම කෙරෙහි දැක්වූයේ උදාසීනකමකි. ඔහු සැබවින්ම සැදැහැවත් බෞද්ධයකු වී ධර්ම ජීවිතයට කැප වුණේ සංඝයා සමග කුලූපග ආශ්‍රයට පැමිණි තැන් සිටයි."

මේ ඡේදයේ සඳහන් වී තිබෙන "කුලූපග ආශ්‍රය" වරදවා තේරුම් ගන්නටවත් පාවිච්චි කරන්නටවත් සුදුසු නැහැ. එය හරියාකාර තේරුම් ගෙන පාවිච්චි කළොත් ජීවිතයේ පරමාර්ථයන් ඉෂ්ට කර ගන්නට පුළුවනි. කුලූපග ආශ්‍රය ඇති වුණේ භික්ෂු තත්ත්වය ආරක්ෂා කරගෙන, ශ්‍රමණ ධර්මයත් ආරක්ෂා කරගෙන සිටින භික්ෂූන් වහන්සේලා සමගයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

භික්ෂූන් වහන්සේලා හැටියට සැලකෙන්නේ කොයි විධියේ අය දැයි විස්තර කරන්නට වුවමනා නැහැ. අද පවතින යම් යම් දුර්වල තත්ත්වයන් යම් යම් අංශ වල, යම් යම් කොටස්වල මීට පෙරත් තිබුණා. අද පමණක් නොවෙයි මේවා ඇති වී තිබෙන්නෙ. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) මතක් කළ සිද්ධීන් වැනි දේවල් මීට පෙර අපේ සම්මා සම්බුදු සමයේදීත් ඇති වුණා. එක් අවස්ථාවක අපගේ සම්මා සම්බුදු රජාණන් වහන්සේගෙන් ආනන්ද මහ රහතන් වහන්සේ යම් ප්‍රශ්නයක් ඇසූ විටෙක මේ විධියට කියා තිබෙනවා.

“ආනන්දය, නුඹ මේ ධර්මයන්හි වෙන් වෙන් වාද ඇත්තාවූ භික්ෂූන් දෙදෙනකු දක්නෙහි දැ ?” යි බුදුහු ඇසූහ.

“මම නොදනිමි” යි ආනන්ද ස්ථවිරයෝ පිළිතුරු දුන්න.

බුදුන්ට හා ධර්මයට ගෞරව නොකරන ශ්‍රමණයන් ලෙස සැලකෙන්නේ පහත දැක්වෙන්නන් බව අනතුරුව බුදුහු කීහ.”

ඒ අය ගැන මෙසේ සඳහන් වෙනවා :

“ක්‍රෝධ කරන, වෛර බැඳ ගන්නා ශ්‍රමණයා ; ගුණමකු වූ එකටෙක කරන ශ්‍රමණයා ; ඊර්ෂ්‍යා කරන මසුරු වූ ශ්‍රමණයා ; කෛරාටික මායා ඇති ශ්‍රමණයා; ලාමක ආශා ඇති මිථ්‍යාදෘෂ්ටි ශ්‍රමණයා.”

ගෞතම සම්මා සම්බුදු සමයේදී, බුදු රජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටිය දී, තත්ත්වය එහෙම නම් අද තත්ත්වය ගැන අපේ ගරු මන්ත්‍රීතුමා කී දේවල් සම්බන්ධයෙන් අටුවා අවශ්‍ය නැහැ. එම නිසා, අපේ සමාජ තත්ත්වය හොඳ කර ගැනීම පිණිස මේ පීඨයෙන් පිට වන භික්ෂූන් වහන්සේලාගෙන් නිර්මල තත්ත්වයක් අප බලාපොරොත්තු විය යුතුයි.

ඉතිහාසයෙන් අපට නොයෙක් දේවල් දකින්නට ලැබෙනවා. එක්තරා අවස්ථාවකදී භික්ෂූන් වහන්සේලාගෙන් පවා පුදුම දේවල් සිදු වී තිබෙනවා. අපේ භික්ෂූන් වහන්සේලාගේ සිල්වත්කම එක්තරා යුගයකදී කොතරම් පිරිසිදුව පැවතුණාද කියතොත්, එක් ඉංග්‍රීසි මහත්මයකුට උන්වහන්සේලා ගැන මෙසේ ලියන්නට සිදු වී තිබෙනවා. මහනුවර කාලයේදී පවා සංඝයා වහන්සේගේ උපස්ථානයට ස්ත්‍රීන් යෙදී සිටි බව ජේම්ස් කෝඩිනර් නම් ඉංග්‍රීසි මහත්මයා විසින් ලියන ලද ලංකා විස්තරයේ මෙසේ දැක්වෙනවා :

“භික්ෂූන් වහන්සේගේ සියලුම ඕනෑකම් මිනිසුන් විසින් සපයනු ලැබේ. එසේම රටේ සිටින ඉතාම ලක්ෂණ ස්ත්‍රීහු පන්සල්වලට පැමිණ වැටුප් නොමැතිව උන්වහන්සේලාට උපස්ථාන කරති. උන්වහන්සේලාගේ චරිතය කොතරම් පවිත්‍රද කිවහොත් ආරාමයක සේවය කළ තරුණියක්, පැතිය යුතු භාර්යාවක් හැටියට තරුණයින් විසින් සලකනු ලැබේ.”

කොහොමද වැඩේ හැටි. භික්ෂූන් වහන්සේලාගේ පවිත්‍රකම මේ තරම් පිරිසිදු භාවයකින් ආරක්ෂා වී තිබුණේ මා මුලින් සඳහන් කළ සිල්වත්කම නිසයි. අන්න ඒ සිල්වත් තත්ත්වයට පත් වීමට අපේ මහා සංඝරත්නයට අවස්ථාවක් සලසා දීමටයි මේ භාරදූර පීඨය අප විසින් පාවිච්චි කළ යුතු වන්නේ. භික්ෂූන් වහන්සේ කවදාවත් අයුක්තියට නමන්නට පුළුවන් කෙනකු නොවන බව දැක්වෙන කරුණු ඒ පුරාණ කාලය සම්බන්ධයෙන් සමහර තැනැවල සඳහන් වී තිබෙනවා. එක් තැනෙක මෙසේ කියා තිබෙනවා :

“භික්ෂූන් වහන්සේ රජුන්වත් අස්ථානයේ ගරු නොකොළෝය. කිසිවකුටවත් භය නොවූහ. වරක් මහා විහාරයේ කැමැත්තට පටහැනිව ක්‍රියා කිරීම නිසා දෙවන දාඨොපතිස්ස රජුට විරුද්ධ වූ භික්ෂුහු ඔහුට පත්තනික්කුජ්ජන කර්මය කළෝය.”

එය මොකක්දැයි විග්‍රහ කරන්නට වෙයි.

“භික්ෂූන් විසින් ගිහියකුට කළ හැකි බලවත්ම නින්දාවත් දඬුවමත් මේ පත්තනික්කුජ්ජන කර්ම යයි. ගිහියාගෙන් සංඝයා සිවුපසය බලාපොරොත්තු නොවන බැව් එයින් ප්‍රකාශ කරනු ලැබේ.”

එදා භික්ෂුවගේ ගරුත්වය කොයි තරම් දුරට ආරක්ෂා කරගෙන තිබුණාදැයි මේ අවස්ථාවේදී අප ආඩම්බරයෙන් මතක් කර ගත යුතුයි. මේ රටේ වර්තමාන භික්ෂු පරපුරත් ඒ තත්ත්වයටම ගෙන ඒමයි මේ පනත් කෙටුම්පතේ පරමාර්ථය. එම නිසා, අධ්‍යාපන ඇමතිතුමා විසින් අරඹන්නට බලාපොරොත්තු වන මේ පීඨය අර තත්ත්වයෙන් පවතියයි අප විශ්වාස කරනවා.

දේශපාලනය අප නොයෙක් විධියට පාවිච්චි කරනවා. සම්මා සම්බුදු රජාණන් වහන්සේ තරම් උසස් දේශපාලනඥයෙක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලෝකයේ පහළ වී ඇත් දැයි අපට කල්පනා කරන්නට සිදු වී තිබෙනවා. අප දේශපාලනයෙන් බලාපොරොත්තු විය යුත්තේ සිල්වත්කමයි, සදාචාරයයි, හොඳකමයි. එහෙත් සමහර විට අද ඒ තත්ත්වය වෙනස් වී ඇති. මට හොඳ ලස්සණ කියමනක් හමු වුණා. කාලය ගත වුණත් එය ප්‍රයෝජනවත් වෙයි.

"දේශපාලනය නම් පිරිසුදු චරිතයෙන් යුත් සිල්වත් ගුණවත් උතුමන් විසින් අත නොගැසිය යුතු පහත් දෙයක් හැටියට, අපරාධයක් දුශ්චරිතයක් හැටියට, කුට ප්‍රයෝගකාරයන්ට අයත් රක්ෂාවක් හැටියට ඇතැම් අය කල්පනා කරන බැව් මෑත දී පළ වූ සමහර ලියකියමන්වලින් පෙනේ."

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මොකක්ද, ඔය පොත?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

"භික්ෂුවගේ උරුමය—රාහුල."

"දේශපාලනය තක්කඩියන්ගේ අන්තිම රක්ෂාවයි."

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

දේශපාලනඥයන්ගෙන් ගුටි කෑ කාලයේ කියූ ඒවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

".........අමනෝඥ ක්‍රියා නිසා දේශපාලනය තක්කඩියන්ගේ අන්තිම රක්ෂාස්ථානයයි' කීමට සැබවින්ම අද අවකාශ ලැබී තිබේ. එසේම මන්ත්‍රී තරඟවලදී දක්නට ලැබෙන දාමරික සැහැසිකම් නිසාත්, කලකෝලාහල නිසාත්, දේශපාලනය 'පොර පිටිය කැයි' බොහෝ නූගත් අය ලියති; කියති. එක්තරා නායක ස්ථවිරයන් වහන්සේ නමකගේ අදහසේ හැටියට නම් දේශපාලනය සොරකමකි.

එහෙත් මේ අපකීර්තිය ඇනට දේශපාලනයට බැස සිටින සමහරුන්ගේ අමනෝඥ වැඩ පිළිවෙළ නිසා ඇති වූවක් මිස දේශපාලනයෙහි වරදක් නොවේ."

ඒක දේශපාලනයෙහි වරදක් නොවන බව තමුන්නාන්සේ වුණත් පිළිගන්නවා.

"කොතරම් යහපත් දෙයක් නමුත් නරක මිනිසුන්ගේ ආශ්‍රය නිසා අපකීර්තියට භාජන වෙයි. මේ ගැන අද දේශපාලනයෙහි යෙදී සිටින්නවුන් වග කියයුතුයි."

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended till 4.30 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු කථානායකතුමනි, සම්මා සම්බුදු රජාණන් වහන්සේ "බහු ජන හිතාය බහු ජන සුඛාය" කිව්වේ මනුෂ්‍ය වර්ගයාගේ යහපත පිණිස මේ සියල්ල දේශනා කළ නිසයි. ඒ නිසා දේශපාලනය අපේ ගරුතර මහා සංඝරත්නයෙන් ඈත් කර තබන්න අපි බලාපොරොත්තු නැහැ. අපි අවංකව අපේ ජාතියේ නායකත්වය දැරීමේ වගකීම දරනව නම් මේ වගේ අවස්ථාවල අපි මේ කාරණා සැලකිල්ලට භාජනය කළ යුතුයි. ඒ පොතේ තවදුරටත් මෙහෙම තිබෙනව:

"මෙපරිද්දෙන්ම දේශපාලනය තක්කඩියන්ගේ අන්තිම රක්ෂාස්ථානය'යි මේ රටේ ඇතැම් අය කියන්නේත් අද දේශපාලනයට බැස සිටින සමහරුන්ගේ චරිතයත් වැඩ පිළිවෙළත් ගැන කලකිරීම නිසා විය හැක. මන්ත්‍රී තරඟවලදී රා අරක්කු ආදි මත්පැන් දීම, ඡන්දය ගැනීමට අල්ලස් දීම, මැරවර දාමරිකයන් යොදා අහිංසක ඡන්දදායකයන්ට හිරිහැර කිරීම, මෙසේ අයුතු අපරාධ කොට මන්ත්‍රණ සභාවට——"

මේ ස්ථානයට. ඔබතුමා ඉදිරියට.

"—ඇතුල්වූ සමහර මන්ත්‍රීන් එහිදී අල්ලස් ගැනීම, අගතියට ගොස් අයුතු කිරීම, නොහික්මුණු දාමරිකයන් මෙන් හැසිරීම ආදි අමනෝඥ ක්‍රියා නිසා දේශපාලනය තක්කඩියන්ගේ අන්තිම රක්ෂාස්ථානය'යි කීමට සැබැවින් ම අද අවකාශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ලැබී තිබේ. එසේම මන්ත්‍රී තරඟවලදී දක්නට ලැබෙන දාමරික සැහැසිකම් නිසාත්, කලකෝලාහල නිසාත්, දේශපාලන 'පොරපිටියකැ'යි බොහෝ නූගත් අය ලියති; කියති. එක්තරා නායක ස්ථවිර යන්වහන්සේ නමකගේ අදහසේ හැටියට මේ දේශපාලනය සොරකමකි."

ගරු කථානායකතුමනි, මේ රටේ පාලක යන් හදන්නෙත් අපේ ගරුතර මහා සංඝරත්නයයි. ඒ නිසා සංඝරත්නයේ ගෞරවය රැකීම පිණිස මේ ආරම්භ කරන්ට යන පීඨය අපේ වැදගත් සැල කිල්ලට භාජන විය යුතුයි. අප බෞද්ධ සින් හැටියට සෑම ආගමකටම ගරු කළ යුතුයි. නියම බෞද්ධ ප්‍රතිපත්ති ගරු කළ රජ කෙනෙකු හැටියට අශෝක රජතුමා හඳුන්වා තිබෙනවා. අශෝක රජතුමා ගැන මෙහෙමයි සඳහන් වෙන්නෙ:

"අශෝක අධිරාජයා, බුද්ධ ධර්මයෙහි අභිවෘද්ධිය තකා වෙහෙසෙමින් මහත් උද්‍යෝගයක් හා දැඩි භක්තියක් දැක්වූ නමුත්, අනිකුත් ආගම් ධර්ම වලට නින්දා අපහාස කළ කෙනෙක් නොවේ."

අද බොහෝ දෙනා තමන් ලොකු බෞඬ සින්යයි කියා ගන්නවා. බොරුවට ප්‍රසිද් ධිය පිණිස තමන් බෞද්ධයින්යයි කියා ගන්නවා. මොකක්ද ඒ අය තුළ තිබෙන බෞද්ධකම? අන්‍ය ආගම්වලට ගරහමින්, අන්‍ය ආගම් පහත් කොට සලකමින් තමන් ලොකු බෞද්ධයින්යයි කියා ගන්නවා. ඒකද බෞද්ධකම?

"..........සැබැවින්ම ඔහු සියලුම ආගම්වලට ගරු කොට ලෞකික සැප සම්පතින් සංග්‍රහ කෙළේය.

අන් ආගම් ගරු කොට සලකා ඒවාද ඉවසිය යුතු බව බුදුන් විසින්ම තමන් වහන්සේගේ ශ්‍රාවක යන්ට දේශනා කරන ලද්දකි."

විශේෂයෙන්ම මෙවැනි ධර්ම පීඨයක් පිහිටුවන මේ අවස්ථාවේ දී අප මේ කරුණු විශේෂ සැලකිල්ලට භාජනය කළ යුතුයි. මේවා වැදගත් උදාහරණ නිසයි මා මේ කොටස් උපුටා දක්වන්නට අදහස් කළේ.

ඒ වාගේම දේශපාලනය කිරීමේදීත් ආදර්ශමත් විය යුතුයි. අශෝක රජතුමා කොහොමද දේශපාලනය කළේ?

"...ස්වකීය ප්‍රජාවගේ සදාචාර හා ආධ්‍යාත්මික අභිවෘද්ධිය පිණිස ඇති කරන ලද ධර්ම මහාමාත්‍ර අදිකාරිය අශෝක අධිරාජයා අතින්ම පිහිටුවුණු අමුතුම පිළිවෙළේ සංවිධානයකි."

අපේ මහා මාන්‍ය අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල මැතිතුමන් පිහිටුවන මේ පීඨයත් එවැනිම සංවිධානයක් වේවායි අප ප්‍රාර්ථනා කරනවා.

"...දඩ කෙළිය හා විනෝද යාත්‍රා පෙර රජවරුන් ගේ සිරිත වුවද, ඔහු ඒ වෙනුවට ධර්ම යාත්‍රාවන් හි යෙදුණේය."

මේවා ගැන ටිකක් සිත යොමු කළොත් ප්‍රයෝජනවත් වේවිය කියා මා විශ්වාස කරනවා. 1956 වර්ෂයේදී මේ මන්ත්‍රී මණ් ඩල ගොඩනැගිල්ලේ තිබුණු මත්පැන් හල වසා දැමුවා. නමුත් උත්තර මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ලේ තිබෙන මත් පැන් හල වසා දැමීමට අපට තවම බැරිවී තිබෙනවා. මේවා ගැන අපේ සැලකිල්ල යොමු විය යුතුයි. ගරු කථානායකතුමාගේ පාලනය යටතේ තිබෙන මේ උතුම් පීඨයේ නම් මත්පැන් පාවිච්චියට අවසරයක් නැහැ. ඒ විධියට අනික් ස්ථානවලත් කට යුතු කරාවියයි අප බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම හික්මීම නැතිවන්නේ කොහොමද? හික්මීම නැතිවන්නට කරුණු කීපයක් තිබෙනවා.

"දුප්පත්කම අපරාධයන්ට දුශ්චරිතයන්ට මුල් වන බැව් දීඝනිකායේ චක්කවත්සීහනාද සූත්‍රයේ පැහැදිලිවම දක්වා තිබේ. මේ සත්‍යය තේරුම් ගැනීම නිසා ධන සැපයීමේ අගය, ආර්ථික දියුණුව මනුෂ්‍යයාගේ යහපතට අවශ්‍ය බව, බුදුන් වහන් සේත් භික්ෂූන් වහන්සේලාත් රටවැසියන්ට කියා දුන්හ. දඬුවම් කිරීමෙන් සොරකම් ආදී අප රාධ නැවැත්විය නොහැකි බවත්, ඒවා හරි ආකාර නතර කිරීමට නම් මිනිසුන්ට තම තමන්ගේ රැකී රක්ෂා හොඳින් කරගෙන සැපසේ ජීවත් වීමට වැඩ පිළියෙළ කළයුතු බවත් දීඝනිකායේම කූට දන්ත සූත්‍රයෙන් පැහැදිලි වෙයි."

ගරු කථානායකතුමනි, මේ රටේ හර කුන් මැරීම නතර කළ යුතුය කියා යෝජනාවක් මා ඉදිරිපත් කළා. ඒ යෝජ නාව මේ ගරු සභාව සම්මත කර ගත්තා. මේ ගරු සභාවෙන් සම්මතවූ ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්නට මේ ආණ්ඩුව කොයි තරම් දුරට බැඳී සිටිනවාද කියා මා දන්නේ නැහැ. හරකුන් මැරීම නතර කළ යුතු යයි මෙම ගරු සභාව යෝජනා වක් සම්මත කර ගත් බව ගරු අගමැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමා දන්නවාද ? අශෝක රජතුමා මිනිසුන්ට හා හරකුන්ට සැලකුවේ එක හා සමානව බව ඉතිහාසයෙන් පෙනී යනවා.

"හරකුන්ට හා මිනිසුන්ට සෙවන සැපයීම පිණිස මාගේ අණ පිට මංමාවත්වල නුග ගස් සිටුවන ලදී. අඹ ගස් ද සිටුවන ලදී. සෝෂ්ට භාගයෙන් භාගයට උයන් වතු වගා කර වන ලදි. හරකුන්ගේ හා මිනිසුන්ගේ ප්‍රයෝජනය පිණිස නැතින් නැන පැන් තොටවල් කර වන ලදැ" යි අශෝක අධිරාජයාගේ හත් වන ටැම් ලිපියෙන් කියැවේ.

අපේ ආර්ථික තත්ත්වය ආරක්ෂා කර ගන්නා ගමන්ම මෙම ධාර්මික ජීවිතයට අප හැඩ ගැසිය යුතුයි. ඒ සඳහා රජයෙන් උදව් ලැබිය යුතුයි. දැනට රටේ වගකීම භාරව සිටින පිරිසගේ සැලකිල්ලට මෙම කාරණා භාජන කොට අවශ්‍ය විධිවිධාන යොදනවා ඇතැයි අප අපේක්ෂා කරනවා.

මෙම රජයේ උදවිය නොයෙක් අවස්ථාවලදී ආදර්ශ දීමට නම් ලැස්තිව සිටිනවා. මේ අවස්ථාවේදී සෞඛ්‍ය ඇමතිතුමා මෙම ගරු සභාව තුළ සිටීම ගැන මා සතුටු වෙනවා. ජාතික පොළෝ ආදී කර්තෘවරයා එතුමායි. මේ ආණ්ඩුව සතර පෝය දින යන් නිවාඩු දින බවට පත් කළා. ඉරිදා නිවාඩුව නැති කොට පෝය දිනවල නිවාඩු දෙන්නට පටන් ගත්තා. ටික දෙනකුගේ ආගමික නිවාඩු දිනය වූ ඉරිදා නිවාඩුව නැති කොට වැඩි දෙනකුගේ පෝය දිනය නිවාඩු බවට පත් කරන බව ආණ්ඩුව ප්‍රකාශ කළා. පෝය නිවාඩුව ලබා දුන්නා නම් ඒ අනුව එදින ආගමානුකූල කටයුතු වල යෙදෙන්නට බෞද්ධයන්ට උදව් දිය යුතුව තිබුණා. එහෙත් පෝය දිනය නිවාඩු දෙමින් එසේ කිරීමේ වැදගත්කම නැති කිරීමට කටයුතු කරනවා නම් එය වංචාසහගත ක්‍රියාවක් බව කිව යුතුයි. මේ ආණ්ඩුව එක් පැත්තකින් පෝය දින නිවාඩු දුන්නා. අනෙක් පැත්තෙන් එදින ජාතික පොළ විවෘත කළා. මෙහි තේරුම මොකක්ද ? මෙම වැදගත් පනත ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මෙවැනි අදූරදර්ශී වැඩ වලින් වැළකෙන ලෙස අප ඉල්ලා සිටිනවා. මෙවැනි අදූරදර්ශී වැඩ වලින් ඒ යහපත් කටයුත්තෙහි පරමාර්ථය අහෝසි වී යනවා. ඒ නිසා ඒ අදූර්දර්ශී වැඩ වලින් වැළැකී සිටීමට සිතට ගන්නා ලෙස නැවතත් ඉල්ලා සිටිනවා.

තවත් එක කාරණයක් මතක් කළ යුතුයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
දැන් ඔය විධියට කාරණා කීපයක්ම කීවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
කියන්නට තිබෙන දේවල් කිව යුතුයි. මේවා කියන්නේ කාලය මිඩංගු කිරීමේ අදහස ඇතිව නොවෙයි.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
විහාරස්ථානයේ පවත්වන දේශනාවකදී ඔවා කියනවා නම් වඩා හොඳයි. ඔවා මේ යෝජනාවට අදාළ නැහැ. අදාළ නැති කරුණු කීපයක්ම දැන් කීවා. මන්ත්‍රීතුමාගේ කථාව නම් බොහොම හොඳයි. එහෙත් ඔය කියන කාරණා වැඩි හරියක් යෝජනාවට අදාළ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඉදිරිපත් කර තිබෙන පනතේ පරමාර්ථයන් සාර්ථක කර ගැනීමට උදව් දීමක් වශයෙනුයි, අප මේවා කියන්නේ. අපට වුවමනා කරන්නේත් ඒ පරමාර්ථයන් සාර්ථක වනවා දකින්නටයි.

ගරු කථානායකතුමනි, පෙර සිටි සමහර රජවරුන් භික්ෂූන් වහන්සේලාගේ සිවුරු ගළවා තිබෙනවා. සමහර භික්ෂූන් වහන්සේලා නියම විධියට විනය ආරක්ෂා කරගෙන කටයුතු නොකළ අවස්ථාවන්හිදී සමහර රජවරුන් ස්වකීය රාජ්‍ය බලය යොදවා ඒ අයගේ භික්ෂුත්වය නැති කළා. ධර්මාශෝක රජතුමා ඉන් එක් කෙනෙක්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
පරාක්‍රමබාහු රජතුමාත් එසේ කළා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ගරු ඇමතිතුමා හොඳ අදහසින් යම් යම් කටයුතු සඳහා බලය ලබා ගන්නවා නම් මගේ ඊට විරුද්ධත්වයක් නැහැ. එමෙන්ම ගරු කථානායකතුමනි, මේ රටේ උසස්ම පීඨය හදන්නට ගරු ඇමතිතුමා දැන් සූදානම් වෙනවා. ඒ උසස්ම පීඨයට යැමට කුඩා කාලයේ සිටම සූදානම් වෙන්නට ඕනෑ. ඒ නිසා ඒ පිළිබඳවත් යම්කිසි සංවිධානයක් ඇති කරන්නට ඕනෑ. උසස් තැන හදා තිබෙනවා නම් පහත් තැනත් හදන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, දහම් පාසැල් ගැනත් වචනයක් කියන්නට ඕනෑ. දහම් පාසැල් මගින් දූන් ධර්මය උගන්වනවා. එහෙත් ඒ ධර්මය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ජීවිතවලට ගැබ් වී නැහැ. අද විභාග සඳහා ක්‍රිෂ්තියානි ධර්මය හොඳින් ඉගෙන ගන්නා බෞද්ධයින් සිටිනවා. එහෙත් ඔවුන් ඒ ප්‍රතිපත්ති උඩ තම තමන්ගේ ජීවිත ගෙනයන්නේ නැහැ. සමහරවිට බෞද්ධ ධර්මය ඉගෙන ගන්නා ක්‍රිෂ්තු භක්තිකයින් සිටිනවා. ඔවුනුත් තම තමන් ගේ ජීවිතවලට ඒ ප්‍රතිපත්ති ගැබ් කර ගන්නේ නැහැ. එහෙත් දහම් පාසැල් වලින් ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගේ විනය හා වත් පිළිවෙත් හරියාකාර පුරුදු පුහුණු කිරීමට කටයුතු සංවිධානය කිරීම අවශ්‍යයි. ඒ නිසා මේ දහම් පාසැල් වලින් ඒ වතාවත් පුහුණු කිරීම කරන්නට ඕනෑ.

අපේ උපාධිධාරී භික්ෂූන්වහන්සේලා ගේ තත්ත්වය ගැන කියා මගේ කථාව නවත්වනවා. එක දවසක් රැස්වීමකදීත් මා ඒ සිද්ධිය කිව්වා. තත්ත්වය මේකයි. භික්ෂූන් වහන්සේලාට කළ යුතු වත් පිළි වෙත් ගැන මේ පොතේ 118 වැනි පිටුවේ සඳහන් වෙනවා. එදා සිටි ගුරු භික්ෂූන් වහන්සේලා විනය ආරක්ෂා කිරීමට කොයි තරම් මහන්සි ගත්තාද කියා මෙහි සඳහන් වෙනවා. එයට හේතුව හික්මීමක් ඇති කිරීමට එය අවශ්‍ය වීමයි. අද විශ්ව විද්‍යාල වලට පැමිණ උපාධි ලබන භික්ෂූන් වහන්සේලා තමන්ගේ ගුරු ස්වාමීන් වහන්සේට වඳින්නේත් නැහැ. ඒකයි ... ලැබෙන අධ්‍යාපනය ; උගත්කම.

නිදර්ශනයක් වශයෙන් ඇහැට දැක්ක දෙයක් කියන්නම්. යම් අවස්ථාවක තවත් හාමුදුරු නමකුත් සමග මා පන්සලකට ගියා. අපි යන විට ගුරු හාමුදුරුවෝ සිටියේ නැහැ. ගෝල හාමුදුරුවෝ පමණයි හිටියේ. ගෝල හාමුදුරුවන් විසින් මා සමග ගිය හාමුදුරුවන් පිළිගනු ලැබ පුටුවට ඇතිරිල්ලක් දමා දී බුලත් හෙප්පුව ගෙනැවිත් දුන්නා. එහෙත් වැන්දේ නැහැ. පාවහන් ගැනීම ආදී වත් පිළිවෙත් කිසිවක් කළෙත් නැහැ. ඒ උපාධිධාරී හාමුදුරුවන් උපසම් පදාව ලැබූ හාමුදුරු නමක් බව මා දන්නා නිසාත්, මා සමග ගිය අර වයෝවෘද්ධ හාමුදුරුවන් ඒ හාමුදුරුවන්ගේ ගුරු හාමුදුරුවන්ටත් වඩා ජ්‍යෙෂ්ඨ හාමුදුරු නමක් වන නිසාත් මේ හාමුදුරුවන්ට අර උපාධිධාරී හාමුදුරුවෝ වඳීවිය කියා මා බලාගෙන හිටියා. එහෙත් වැන්දේ නැහැ. ටික වේලාවක් යන විට අර උපාධිධාරී හාමුදුරුවන්ගේ ගුරු හාමුදුරුවෝ වැඩියා. ඒ හාමුදුරුවෝ පැරණි ක්‍රමයට වත් පිළි වෙත් රකින උපාධි ලබා නැති එහෙත් උගත් හාමුදුරු නමක්. ඒ හාමුදුරුවෝ පැමිණි විගසම අර මා සමග ගොස් සිටි වයෝවෘද්ධ හාමුදුරුවන්ට වැන්දා. ගෝලයා වැන්දේ නැහැ ; ගුරු හාමුදුරුවෝ වැන්දා. ඔන්න අද උපාධිධාරී භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය. ඒ නිසා මේ රටේ සමාජය සකස් කිරීමට නම් මෙවැනි පීඨයන් පිරිසිදුව පවත්වාගෙන යැම අත්‍යාවශ්‍යයි.

ඒ නිසා මේ ගරු සභාවට ඉදිරිපත් කර ඇති පනත්වලින් ඉතිහාසගත වන වැදගත්ම පනත මේ ඇමතිතුමා ඉදිරිපත් කර ඇති මේ බුඬ ශ්‍රාවක ධර්ම පීඨ පනත බව කියමින් එයින් නියම ප්‍රතිඵල රටටත් ජාතියටත් ආගමටත් ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 4.50

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)
*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய)*
(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ගරු කථානායකතුමනි, මේ බුඬ ශ්‍රාවක ධර්ම පීඨ පනත පිළිබඳව වචන කීපයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථා කළ යුතුව තිබෙනවා. මෙතෙක් වේලා කෙරුණු කථාවලින් යම් යම් කරුණු අපට හොඳ හැටි අවබෝධ වුණා. මට පෙර කථා කළ නිකවැරටියෙ ගරු මන්ත්‍රීතුමාගේත්, දඹුල්ලෙ ගරු මන්ත්‍රීතුමාගේත් කථාවලට සවන් දුන් අපට පෙනී ගියා, මෙම බුඩ ශ්‍රාවක ධර්ම පීඨය ඉතාම වැදගත් පරමාර්ථයන් රාශියක් ඉෂ්ට කර ගැනීමේ අදහසින් පිහිටුවනු ලබන්නක් බව. මෙම බුඩ ශ්‍රාවක ධර්ම පීඨය පිහිටුවා ලීම සඳහා ඉදිරිපත් කරන මෙම පනත විවාද නොකොට හදිසියෙන්ම සම්මත කර ගත යුතු පනතක් නොවන බව නමුන්නාන්සේ වුණත් පිළිගන්නවා ඇති. [බාධා කිරීමක්] සථාවර කාරක සභාවකට පවරන්වා යයි කියනවා නම් එය වඩාත්ම සුදුසු බවයි මගේ හැඟීම.

ගරු කථානායකතුමනි, අපේ ජාතිය රැකුණේ, බෞඩාගම රැකුණේ, අපට ආඩම්බර විය හැකි ඉතිහාසයක් ඇත්තේ බෞඩ භික්ෂූන් වහන්සේලා නිසා යයි කියනවා මා අසා තිබෙනවා. හැම සිංහලයකුම පාහේ, හැම බෞඩයකුම පාහේ, එය ආඩම්බරයෙන් කියන බව පෙනී යනවා. කොටින්ම, සිංහලයාගේ සිංහලකම, බෞඩයාගේ බෞඩකම භික්ෂූන්වහන්සේ නිසා රැක්ණු බව කියනවා. මෙය දේශපාලනඥයින් පමණක් නොවෙයි, මට ඉගැන්නු ගුරුවරයා පවා කියනවා මා අසා තිබෙනවා. එම නිසා මෙවැනි පනතකින් අපේ අනාගත ඉතිහාසය—බෞඩ ඉතිහාසය පමණක් නොවෙයි ජාතියේ ඉතිහාසය—වෙනස් අතකට හැරවීමට පුළුවන්කම තිබෙන බව කියන්න ඕනැ. අන්න ඒ කාරණය නිසා, බෙන්තර-ඇල්පිටිය ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයා වශයෙන් මගේ පෞද්ගලික ස්තුතියත්, ප්‍රදේශයේ ජනතාවගේ ගෞරවයත් අපේ අධ්‍යාපන ඇමතිතුමාට පුද කරන්න කැමතියි, මෙවැනි පනතක් සාර්ථක අන්දමින් ඉදිරිපත් කිරීම ගැන. ඒ හැරෙන්නට මෙබඳු භාරදූර කාර්යයක් අවංකව, එඩිතරව, කරට ගැනීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනැ.

මා එසේ කියන්නෙ මෙන්න මේ කාරණය නිසයි. ලෝකයේ යම් යම් ආගම්වල, නිකායවල පූජකවරුන් සිටිනවා නම්, ඒ අයගේ ක්‍රියාවලට දේශපාලනඥයින් නොවෙයි සාමාන්‍ය කෙනෙකු වුණත් අත ගැසුවොත් එය බරපතළ වරදක් හැටියට, විනය නීති කැඩීමක් හැටියට ඔවුන් එය හඳුන්වන බව අප අසා තිබෙනවා. එය එසේ බව ඉතිහාසයෙන්ද එළිදරව් වෙනවා. එනිසා, මෙබඳු කාර්යයකට අත ගැසීම නිසා සමහර විට අධ්‍යාපන ඇමතිතුමාට නොයෙකුත් ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙන්න පුළුවනි. ඒ කෙසේ වුණත්, හත් කෝරළයේ කොඩියෙ කඩුව නැති සිංහයා වාගේ—කඩුව නැතත් සිංහයා පිළිමලුන් සුණුවිසුනු කරන්නා වාගේ—අපේ අධ්‍යාපන ඇමතිතුමා මෙම වැඩ පිළිවෙල ඉදිරියටම ගෙන යනවා ඇතැයි මා විශ්වාස කරනවා.

මේ අතරම අප කල්පනා කළ යුතු තවත් පැත්තක් තිබෙනවා. බෞඩාගම රැඳී තිබෙන්නෙ මා කල්පනා කරන හැටියට සාමාන්‍ය පොදු බෞඩ මහජනතාව මතයි. බෞද්ධයෑ යයි කියන්නෙ හාමුදුරුවන්ට නොවෙයි. සමහර විට හාමුදුරුවොත් බෞඩයකු වන්න පුළුවනි; අපත් බෞඩයින් වන්න පුළුවනි; අගමැතිතුමා රාජ්‍ය ඇමතිතුමා, අධ්‍යාපන ඇමතිතුමා, ඔය ආදී මැති ඇමතිවරුන් බෞඩයින් වන්න පුළුවනි. සිවුරක් දරාගෙන සිටියත්, බෞඩ ප්‍රතිපත්ති නැති නම් බෞඩයෙක් යයි කියන්න පුළුවන් කමක් නැහැ. බෞඩ ධර්මය දේශනා කර තිබෙන්නෙ භික්ෂූන් වහන්සේලාට පමණක්ද කියා මා අහනවා. අප බොහෝ දෙනෙක් බලාපොරොත්තු වෙන්නෙ, මහා සංඝයාවහන්සේලා ලවා සිල් රක්කවා, ඒ සීලයේ බලයෙන් යම් යම් ඵලවලට පමුණුවා, ඒ අයගේ ශක්තියෙන් නිවන් ලබාගැනීමටයි. බෞඩ ප්‍රතිපත්ති රකින්නෙ නැතුව, භික්ෂූන්වහන්සේලාට බත් හැන්දක් පිළිගන්වා ඒ පිනෙන්—ඒ අය ලවා රක්ෂා කිරීමට අදහස් කරන සීලයේ බලයෙන්—තමන් නිවන් ලබාගැනීමටයි බොහෝ දෙනා කල්පනා කරන්නෙ. බෞඩයින් වශයෙන් පෙනී සිටින බොහෝ දෙනා එබඳු අදහසක් පෙරදැරි කරගෙනයි හැම අවසථාවලදීම කටයුතු කරන්නෙ. බෞඩයින් යයි කියන්නෙ බෞඩ ප්‍රතිපත්ති රකිමින් ජීවත් වන අයට බව බොහෝ දෙනා අමතක කර දමා ඇති බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

පෙනෙනවා. මේ ගරු සභාවෙ කථා කළ ඇතැම් මන්ත්‍රීවරුන්ගේ කථාවලින් පෙනී යනවා, ඒ අය බෞඩයින් යයි කියන්නෙ බෞඩ භික්ෂූන්වහන්සේලාට යයි සිතා ගෙන බව. බත් වේලක් දී, සිව් පසයෙන් උපස්ථාන කර, හාමුදුරුවන්ගෙන් නිවන් බලාපොරොත්තු වෙනවා නම්, එය බෞඩකමක් නොවෙයි. මේ අනුව කල්පනා කර බලන විට, මෙම බෞඩ විද්‍යා පීඨය බෞඩ භික්ෂූන්වහන්සේලාට පමණක් සීමා කිරීම හරි නැහැ. සාමාන්‍ය ගිහියන්ටත් එම විද්‍යා පීඨයේ ඉගෙන ගැනීමට, බෞඩ පර්යේෂණ කටයුතුවල නිරත වීමට, අවකාශ සලසා දෙන්න ඕනැ. මෙම බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය ගිහියන්ටත් බුද්ධාගම හරි හැටි ඉගෙන ගත හැකි තැනක් විය යුතුයි; විද්‍යාලයක් විය යුතුයි. එසේ නැතිව ස්වාමීන්වහන්සේලාට පමණක් මෙය වෙන් කිරීමට ගරු අධ්‍යාපන ඇමතිතුමා අදහස් කරන්නේ නම්——

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නැහැ, එසේ වෙන් කිරීමක් නැහැ. මෙහි ඒ බව සඳහන් වෙනවා:

"විශ්ව විද්‍යාලයේ පශ්චාත් පාඨමාලා පරිශීලනය කිරීමට ඇතුළු කරගනු ලබන, භික්ෂූන් වහන්සේලා නොවන තැනැත්තන්ගේ ගණන කිසිම විටෙක විසිපහකට වැඩි නොවිය යුතුය."

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)

හොඳමයි. ඒ ගැන බොහොම සන්තෝෂයි. ඒත් එය සීමා කිරීම ගැන අපේ කනගාටුව පළ කළ යුතුව තිබෙනවා. ඒ මොකද? අපේ ප්‍රදේශයේ වතුරුවිල ආරණ්‍ය සේනාසනය කියා සේනාසනයක් තිබෙනවා. රටේ නොයෙක් නොයෙක් පළාත්වලින් බෞද්ධයන් ඒ ස්ථානයට පැමිණ ධර්මය පිළිබඳ නොයෙක් විධියේ ඉගෙනීම් සහ භාවනා ක්‍රම ආදිය හදාරනවා. අවුරුදු පතා සිය ගණන් ඒ ස්ථානයට පැමිණෙනවා. ඒ නිසා මෙවැනි බෞද්ධ පීඨයකට ඇතුල් කර ගනු ලබන භික්ෂූන් වහන්සේලා නොවන අයගේ ගණන 25 කට පමණක් සීමා කිරීම සුදුසු නැත. ගරු ඇමතිතුමා මේ කාරණය ගැන තවදුරටත් කල්පනා කර මීට වඩා වැඩි සංඛ්‍යාවක් බඳවා ගන්නට හැකිවන පරිදි මෙහි ක්‍රියාකාරී මණ්ඩලයට උපදෙස් දෙනවා නම් එයින් රටට විශාල ප්‍රයෝජනයක් අත් වෙනවා.

ඒ වාගේම අප විසින් කල්පනා කළ යුතු තවත් කාරණයක් නම් අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය බෞද්ධ භික්ෂූන් වහන්සේ සම්බන්ධයෙන් ඇතිවන කුමන ආයතනයක හෝ තිබිය යුතු බවයි.

මා හිතන්නේ නැහැ, බුදුන් වහන්සේ තරම් ප්‍රජාතන්ත්‍රවාදියෙක් මේ ලෝකයේ බිහි වුණාය කියා. බෞද්ධ ධර්මය කියවා ගෙන යන විට අපට පේනවා බුදුන් වහන්සේ ප්‍රජාතන්ත්‍රවාදියකු බව; සමාජවාදියකු බව. බුදුන් වහන්සේ, ක්‍රිස්තුස් වහන්සේ වැනි උදවිය ඒ කාලයේ රටේ තිබුණ ධනවාදයට විරුද්ධව සටන් කළ අය බව අපට සමහර අවස්ථාවලදී ඒත්තු යනවා. කෙසේ හෝ වේවා බුදුන් වහන්සේ දේශනා කළ ධර්මයේ සමාජවාදයත් ප්‍රජාතන්ත්‍රවාදයත් යන දෙකම තිබෙනවා. ඒ නිසා භික්ෂූන් වහන්සේලාට යම් යම් කරුණු ගැන අප දොස් කීම වැරදි බවයි මගේ කල්පනාව. බුදුන් වහන්සේ ජීවමානව සිටි කාලයේ දී පවා වෙද හෙදකම් කළ භික්ෂූන් වහන්සේලාත් සිටි බව අපට පොත පතින් පෙනී යනවා. බුදුන් වහන්සේ ජීවමාන කාලයේදීත් සියයට සියයක්ම රහත් වුණේ නැහැ. එදා සිටි භික්ෂූන් වහන්සේලා පවා සියල්ලෙන් සම්පූර්ණව සිටියේ නැහැ. නොයෙක් නොයෙක් අවස්ථාවලදී නොයෙක් විධියේ අණපනත් සහ විනය නීති පනවන්නට බුදුන් වහන්සේට සිද්ධ වුණා. ඒ මොකද නොයෙක් නොයෙක් අදහස් තිබෙන අය එදත් සිටි නිසයි.

ඒ කරුණු අනුව කල්පනා කරන විට, කථානායකතුමනි, බෞද්ධ භික්ෂූන් වහන්සේලා අනිකුත් විෂයයන් ඉගෙන ගැනීම අත්හැරිය යුතුය කියා කියනවා නම් එය වැරදියි. එයින් මේ රටේ ඉදිරි අනාගතයට සෑම අතින්ම විශාල පහරක් වදින්න ඉඩ තිබෙනවා. මා එසේ කියන්නේ මගේ පසු පස සිටින ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යකු විසින් කියන ලද එක් ප්‍රකාශයක් නිසයි. එතුමා කිව්වා, දඹරාවේ රතනසාර හිමියන්ට නමස්කාර කරන අය සිය දහස් ගණන් ඉන්නවාය කියා. හෙළා දකිමේ චේතනාවෙන් උපහාසාත්මකවයි ඒ කථාව කිව්වේ. එහෙත් කථානායකතුමනි, 1815 දී මේ රටේ ජාතික කොඩිය බිම හෙළා ඉංග්‍රීසි කොඩිය එසවූ වෙලාවේ වෙඩි උණ්ඩයට පවා නොබියව ඉදිරියට ගමන් කර ඒ කොඩිය බිම දමා පෑගුවේ කව්ද ?

නොබියව ඉදිරියට ගමන් කළ වාරිය පොළ හාමුදුරුවෝ නොවේද ? [බාධා කිරීමක්] සත්කෝරළයේ තමයි. ඒ නිසා මා කියනවා, ප්‍රජාතන්ත්‍රවාදය අනුව ක්‍රියා කිරීමට භික්ෂූන් වහන්සේලාට ඉඩක් නැත්නම්, එය අපේ රටේ ඉදිරි ගමනට, අනාගතයේ ඇති විය හැකි ජාතික සටන් වලට සම්පූර්ණයෙන් බාධාවක් වෙනවාය කියා. එවැනි තත්ත්වයක් ඇති වන විධියට මෙය පිහිටුවීමට යනවා නම් එසේ කරන්න එපාය කියා මා ප්‍රකාශ කර සිටිනවා.

මෙම බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය නිසා, දැනට විද්‍යාලංකාර විද්‍යොදය විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්නා භික්ෂූන් වහන්සේලා බෞද්ධ ධර්මය රැකීමට පමණක් බෞද්ධ ධර්මයට පමණක් සීමා කර සිය ඉගෙනීමේ කටයුතුවල යෙදීමේ තත්ත්වයක් ඇති වනවා නම් මා එයටත් විරුද්ධයි.

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
එසේ කිරීමක් නැහැ.

**කාරියවසම් මයා.**
*(திரு. காரியவசம்)*
(Mr. Kariyawasam)
මං ඒ ගැන සන්තෝෂයි.

අපේ ආගමේ තියෙන ලොකුම දෙයක් තමයි, ඇස් ඉස් මස් ලේ දන් දීමේ කතාව. අපි ඉස්සර සිතුවේ මේක සිහිනයක් වැනි මිථ්‍යා කතාවක් කියායි ; පොතට පමණක් සීමා වුණු කතාවක් කියායි. එහෙත් අද දවසේ එය සාමාන්‍ය සිරිතක් වේගෙන එන බවයි පෙනෙන්නේ. දැන් එක් අයකුගේ හෘදයවස්තුව තවත් අයකුට සවි කරන්නට පුළුවනි. තව ටික කලක් යන විට එක් අයකුගේ ඔළුවක් තවත් අයකුගේ ඔළුව පිහිටි තැනට හා කරන්නට පුළුවන් වෙනවා ඇති. අපේ ඉතිහාසයෙන් අප අසා තිබෙනවා, රිටිගල ජයසේනයන්ට වෙනත් කෙනෙකුගේ හිසක් එහෙම පිටින් ම පෑස්සූ බවක්. ඒක මුඛපරම්පරාගත කතාවක්. එසේ නම් ඇස් ඉස් මස් ලේ දන් දෙන්නට බැරිද ? මේ රටේ එවැනි තත්ත්වයක් උද්ගත වන විට තමන්ගේ හදවත දන් දෙන්නට යම් කෙනෙක් ඉදිරිපත් වන එවැනි අවස්ථාවකදී ඊට තව තවත් ධෛර්යය දී එය ක්‍රියාත්මක කරවන්නට බෞද්ධ භික්ෂූන් වහන්සේ කෙනෙකුට ශක්තිය ලැබෙන්නට ඕනෑ.

බුද්ධාගමය කියන්නේ නිකම් පොත පත කියවා පමණක් තේරුම් ගන්නා ධර්මයක් පමණක් නොවෙයි. එය යම් යම් වත් පිළිවෙත් රකිමින් ජීවත්වීමේ ක්‍රමයක්. ඒ අනුව ක්‍රියා කළාම තමයි, නියම බුද්ධ ධර්මය කෙනෙකුට අවබෝධ වන්නේ. පොතපත කියවීමෙන් පමණක් කෙනෙකුට බුද්ධ ධර්මය නිසි අන්දමට අවබෝධ කර ගන්නට පුළුවන් නම් මේ රටේ සිටින හාමුදුරුවරුන් සේරම බුද්ධ ධර්ම පොත පත හොඳට කටපාඩම් කර ගෙන මෙලහකටත් නිවන් දකලා. මහජනතාව අතර ගැවීමෙන් ම කටයුතු කරන්නට ඕනෑ. නියම ප්‍රතිපත්ති මත කටයුතු කිරීමයි, බුද්ධ ධර්මයෙන් කෙරෙන්නේ. සමාජය තුළ ගැවීමෙනුයි, එම ප්‍රතිපත්ති ක්‍රියාවට පරිවර්තනය කළ හැකි වන්නේ. එම ප්‍රතිපත්ති ක්‍රියාවට පත් කරන්නට හැම ගිහියකුටම හැම භික්ෂූන් වහන්සේ නමකටම අවස්ථාව ලැබෙන්නට ඕනෑ. සිද්ධාර්ථ කුමාරයා වුවත් අවුරුදු ගණනාවක් ගිහිගෙයි වාසය කිරීමෙන් පසුවයි, ඒ උතුම් මඟට බැස් සේ. ගිහිගෙයි වාසය කොට එක පුත්‍රයකු ලැබුණාටත් පසුව ගිහි සැප රජ සැප සහ ධනවත්කම මෙන්ම මහා වංසවත්කමත් අතහැර දමායි, උන්වහන්සේ අභිනිෂ්ක්‍රමණය කළේ. මා මුලින් කියන ලද පරිදි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කාරියවසම් මයා.]

සමාජයේ ගැටීමෙන් ලබා ගන්නා ලද අත් දැකීම් උඩයි, උන්වහන්සේ ඒ මඟට පිළි පන්නේ. එදා බුදුන් වහන්සේට ඉගෙන ගන්නට බුද්ධ ශ්‍රාවක පීඨ තිබුණාද ? එදා සිටි අසූ මහා ශ්‍රාවකයන්ට හෝ කෝටි ගණන් මහ රහතන් වහන්සේලාට තිබුණා ද ? නැහැ. බුදුන් වහන්සේගේ ධර්මය පිළිවෙත් පිළිපැදීම මත ක්‍රියාත්මක කළ යුතුයි. එසේ නොකොට බුද්ධ ධර්මය කට පාඩම් කිරීම පමණක් කරන අන්දමේ බෞද්ධයන් සිටීම නිසා තමයි මේ රටේ තිබුණු පැරණි ජාතික සිරිත් විරිත් සම්පූර්ණයෙන්ම නැති වී ගොස් තිබෙන්නේ. මෙම බුද්ධ ශ්‍රාවක පීඨය මේ රටේ බෞද්ධ පොතපත කටපාඩම් කරවන විද්‍යා පීඨයක් පමණක් වෙනවා නම් ඉන් සිදු වන ප්‍රතිඵලයක් නැති බව මෙම අවස්ථාවේදී සඳහන් කළයුතුව තිබෙනවා.

කෙසේ වෙතත් අද රටේ නොයෙකුත් පූජකයන් වහන්සේලා තුළ තිබෙන අත්ත නෝමතිකකම්වලට විරුද්ධව නැගී සිටීමක් මේ මගින් අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා කර තිබෙනවා. මේකට අත තබන්නට සමහරුන් තුළ බිය ගතියක් පැවතුනා එහෙත් එතුමා ඉතා ධෛර්‍ය සම්පන්න අන්දමින් සිංහයෙක් වාගේ ඉදිරියට ඇවිත් තිබෙනවා. අපි ඒ වෙනුවෙන් ආශිර්වාද කරනවා.

මෙම ස්ථානය පොත් පාඩම් කරන පොත් ගුල්ලන් පිරිසක් බිහි කිරීමේ ස්ථානයක් බවට පත් නොකර මුළු සමාජයටම ඉදිරි අනාගතයේදී ඉතා හොඳින් ප්‍රයෝජනවත් වන හොඳ භික්ෂූන් වහන්සේලා පමණක් නොව හොඳ ගිහියනුත් ඇති කරන හොඳම හොඳ විද්‍යා පීඨයක් බවට පත් කරන්නට හැකිවේවා කියා ප්‍රාර්ථනය කරනවා. අප කරන ලද විවේචන වුවත් හොඳින් කල්පනාවට භාජන කිරීම දැන් තිබෙන දුර්වලතාව යන් නැති කර මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට ප්‍රයෝජනවත් වෙනවා ඇතැයි අප කල්පනා කරනවා. හාමුදුරුවරුන්ට බත් හැන්දක් දී නිවන් බලාපොරොත්තු වෙමින් මේ රටේ බෞද්ධාගම ආරක්ෂා කර ගැනීමට උත්සාහ නොකරන ලෙස මේ රටේ බෞද්ධයන්ගෙන් ඉල්ලා සිටිමින් මගේ කතාව අවසාන කරනවා.

අ. භා. 5.5

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ගරු කථානායකතුමනි, බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පිළිබඳ කෙටුම්පත් පනත සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකු විසින්ම කරන ලද කථා ඉතා වැදගත් වූත්, ප්‍රයෝජනවත් වූත් ඒවා බව කියන්නට කැමතියි. සමහර මන්ත්‍රීවරුන් අකරුණාවෙන් නොව, කාරණය පිළිබඳව හරි අවබෝධයක් නැතිව, පරමාර්ථය හරියාකාර අවබෝධ කර නොගෙන, කාරණයෙන් බැහැර දේ පිළිබඳව කථා කළා. දකුණු කොළඹ සම මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) මේකට විශ්ව විද්‍යාලයය නොකියා බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයය කීවේ කුමක් නිසා දැයි ප්‍රශ්න කළා. මේක විශ්ව විද්‍යාලයක් නොවෙයි. ධර්මය පිළිබඳව පර්යේෂණ පවත්වා ධර්මය පිළිබඳව අවබෝධය ඇති කර ගැනීමට අවකාශ සලස්වන ධර්මාලයක්. දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ටී. බී. තෙන්නකෝන් මයා.) නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාත් (එම්. තෙන්නකෝන් මයා.) මේ පිළිබඳව තේරුම් ගෙන කථා කිරීම ගැන මා ඒ දෙපළට ස්තුතිවන්ත වෙනවා.

මේ විවාදයේදී පිරිවෙන් අධ්‍යාපනය ඇදගෙන කථා කිරීම සම්පූර්ණයෙන්ම කාරණයට බාහිර දෙයක්. එය දේශපාලන වාසියක් ගැනීමේ බලාපොරොත්තුවෙන් කළ කථාවක්ය කියා මා කියන්නෙ නැහැ. එහෙත් ඒ කථාවෙන් සිදු වුණේ යම් යම් අයගේ අදහස් මෙහි ප්‍රකාශ කිරීමක් බව දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමාගේ (ජයකොඩි මයා.) කථාවෙන් මට වැටහී ගියා. එතුමා මේ කාරණය සම්පූර්ණයෙන්ම තේරුම් නොගත් බව මා කියන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨය පිහිටුවීමේ අදහස සම්පූර්ණයෙන් ඒත්තු යන පරිද්දෙන් කථා කිරීමට අඩු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගණනේ පැය තුනක්වත් වුවමනා කරනවා. ඒ තරම් කාලයක් ගත කරන්නට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. මෙහි පරමාර්ථය ඉතා උදාර එකක්. එය ඉෂ්ට කර ගැනීමට හැකි වේද නොවේද යන්න ඒ ධම් පීඨයෙහි ධම්ය ප්‍රගුණ කරන ස්වාමීන් වහන්සේලා පිට රඳා පවතින්නක්.

මුළු ලෝකයම අද දේශපාලන මත ගැන සාකච්ඡා කරනවා. සංස්කෘතිය පිළිබඳව සාකච්ඡා කරනවා. එහෙත් ආගම ධම්ය පිළිබඳව ඒ තරම් සාකච්ඡාවක් අප රටේ පමණක් නොව ලෝකයේ කොහේවත් නැති නිසා මුළු ලෝකයම මේ අමාරු අඩියට වැටී තිබෙන බව නිසැකයි. මිනිසුන් නිතරම කථා කරන්නේ බඩු මිළ වැඩි වීම ගැනයි; ආර්ථික තත්ත්වය පහත වැටීම ගැනයි; පඩි වැඩි කිරීම ගැනයි. එහෙත් බාහිර වශයෙන් දියුණු වී ආර්ථික අතින් කොයි තරම් උසස් තත්ත්වයකට පත් වුවත්, තමන් කැමති පරිදි යාන, වාහන වාසස්ථාන ඇතිව සිටියත්, රස මසවුලෙන් යුත් ප්‍රණීත ආහාර තුන් වේලටම තිබුනත් ආධ්‍යාත්මික අවබෝධයක් හා සැනසීමක් නැති පුද්ගලයා සැම විටම පසු වන්නෙත් දුකෙන්, මැරෙන්නෙත් දුකෙන්. ඒ බව මැනවින් අවබෝධ කර ගත් බුදුරජාණන් වහන්සේ තමයි—එක් පක්ෂයකට වත්, එක් ආගමක් අදහන කෙනකුටවත් වෙන් කරමින් නොවෙයි—ලෝකයාගේ යහපත සඳහා, සකල ලෝක සත්වයාගේම යහපත තකා සියල්ලන් කෙරෙහි පතළා වූ මහා කරුණාවෙන්, ඒ ධර්මය අවබෝධ නොකළ අයටත් එය අවබෝධ කර ගැනීමේ ශක්තිය ලබා දෙන්නට උත්සාහ කෙළේ.

මෙය ඇසීමෙන් තමුන්නාන්සේ සමහර විට පුදුමයට පත් වනු ඇති. බුදුන් බුදු වන අවස්ථාවේ ලෝකයේ වෙන කිසිම බෞද්ධයෙක් සිටියේ නැහැ. එදා මුළු දඹදිව් තලයේම සිටියෝ අබෞද්ධයෝයි. ඒ කාලයේ දඹදිව ආගම් 62ක් තිබුණා. එහෙත් බුදුන් වහන්සේ දේශනා කළේ ආගම් භේදයෙන් තොරව සකල මනුෂ්‍ය සංහතියේම යහපතට අදාළ වන පරිද්දෙනුයි. අද බුද්ධාගම හෝ වේවා, වෙනත් ආගමක් හෝ වේවා, එදා පැවැති තත්ත්වයෙන් නොපවතින බව කියන්නේ කනගාටුවෙනුයි. අපට ලෝකය වෙන් කරන්නට බැහැ. බෞද්ධාගම ගැන බෞද්ධාගම්කාරයින් කථා කළා. බුදුන්ගේ ධර්මය උත්පත්තියෙන් තමන් බෞද්ධාගම්කාරයනැයි උප්පැන්න සහතිකයේ නම සඳහන් වූ අයට පමණක් සීමා වූ ධර්මයක් නොවෙයි. බුදුන්ගේ ධර්මය එසේ එක් කොටසකට පමණක් සීමා වූවක් නොවෙයි. බුදුන්ගේ ධර්මය බෞද්ධ අබෞද්ධ කාටත් පොදුවේ සමාන ප්‍රයෝජනයක් ලබා ගත හැකි වන පරිද්දෙන් දේශනා කරන ලද ධර්මයක්.

බෞද්ධ රටවල් ගැන ඇතැම් ගරු මන්ත්‍රීන් සඳහන් කළා. බුරුමයේ තුන් මාසයකත්වත් මහණ වෙලා ඉන්නට ඕනෑ යයි දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. පණ තිබෙන තුරු මහණ වී සිටියත්, මහණ වුවත් නොවූවත්, බුදුන්ගේ ධර්මය අනුව ලැබෙන සුවය විඳීමට එය අවබෝධ කර ගන්න කාටත් පුළුවන් බව හිතා ගන්නට පුළුවනි. මා මෙසේ කථා කළත් මම බෞද්ධ ධර්මය අවබෝධ කළ කෙනකු නොවෙමි. යම්තම් පතපොතින් කියවා ලබා ගත් සාමාන්‍ය අදහසක් පමණයි මට ඇත්තේ. මා දන්නේ එපමණයි. බුද්ධ ධර්මය එකල පැවැති සකලම පුද පූජා විධිවලට, ධර්මවලට, සමාජ බැඳුම්වලට විරුද්ධව සකලම බැමි කඩා බිඳ ගෙන ගිය ධර්මයක් හැටියට විස්තර කරන්නට පුළුවනි. ඒ අවස්ථාවේදී බුදුන් වහන්සේ නොවිඳපු දුකක්, නෑසූ අපවාදයක්, නොවින්ද පරිභවයක් නැතැයි කියන්නට පුළුවනි. එක් අවස්ථාවකදී උන්වහන්සේ මරණයට පවා ගොදුරු කරන්නට සතුරු පිරිසක් උත්සාහ කර තිබෙන බව කියැවෙනවා. ක්‍රිස්තුස් වහන්සේ මරණයෙන් කෙළවර වුණා, තමන්ගේ ධර්මය දේශනා කරන්නට ගොස්. බුදුන් වහන්සේ නම් යම්තම් එවැන්නකට ගොදුරු වුණේ නැහැ. උන්වහන්සේගේ ධර්මය අවබෝධ කර ගැනීමට උත්සාහ කරන අය රාශියක් සිටින්නට පුළුවනි. ඒ වාගේම ඒ ධර්මය අවබෝධ කර ගත් අයත් ඉන්නට පුළුවනි. බොහෝ දෙනාගේ කල්පනාවේ හැටියට එහෙම අවබෝධයක් ලබා ගත් කෙනකු සොයා ගැනීම දුෂ්කරයි. මිනිහාගේ විමුක්තිය, මිනිහාගේ සදාකාලික විමුක්තිය, ජීවිතාන්තය දක්වා ලැබෙන සුවය නොව සඳ සුවය, පුද පූජාවලින් හෝ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

වන්දනාමානවලින් හෝ ලබා ගන්නට බැරි බව බුදුන් වදාළහයි සම්මතයි. පොත්පත්වල එන සියල්ලම බුදුන් වහන්සේගේ ධර්මයදැයි දන්නේ නැහැ. බුදුන්ගේ ධර්මය දේශනා කළ අයවත්, ලේඛනාරූඪ කළ අයවත් එහෙම කියන්නේ නැහැ. ඕනෑම සූත්‍ර දේශනයක් පටන් ගන්නේ, "මේ සූත්‍රය අප තථාගතයන් වහන්සේ ජේතවනාරාමයෙහි" හෝ වෙන කවර සථානයක හෝ විහාරයක හෝ "වැඩ වසන සමයේදී දේශනා කළහයි මවිසින් අසන ලදි" යන්නෙනුයි. අද ග්‍රන්ථාරූඪ වී තිබෙන්නේ මුඛ පරම්පරාවෙන් පැවත ආ ධර්ම පාඨයි. ඒ ධර්මය හදාළ අය—ත්‍රිපිටක වාගීශ්වරාචාර්යයන්—අදත් වැඩ වෙසෙනවා ; ආදියෙදීත් වැඩ විසුවා. එහෙත්, එයින් ලෝකයාට සහනයක් වූ බවක් පෙනෙන්නේ නැහැ. අද ලෝකයට වුවමනා බුද්ධ ධර්මය යි අප නොයෙක් තැන්වලදී කියනවා. එසේ කියන අයවත් එය හරිහැටි අවබෝධ කරගෙන එසේ කියත්දැයි මා දන්නේ නැහැ. මා හිතන හැටියට ඔවුන් එසේ කියන්නේ අනුමානයෙනුයි. අපට තිබෙන්නේ ඒ ධර්මය පිළිබඳ අවබෝධයේ ලාංජණයක් පමණක් බව අප දෙපක්ෂයම පිළිගන්නවා. මෙවැනි ධර්මයක් අද ලෝකයට දුන්නොත් එයින් අප නොසිතූ අන්දමේ මහා සාංස්කෘතික විප්ලවයක් ලෝකයෙහි ඇති වන්නට පුළුවනි.

ලෝකයෙහි සිටි ඉතාම පුදුම එළවන සුලු මහා විප්ලව වාදියා බුදු හාමුදුරුවෝයි. එවකට පැවැති සකලම සිරිත් විරිත්, සකලම ආගම්, සකලම වන්දනමාන ක්‍රමවලට විරුද්ධව නැඟී සිටි මහා පුරුෂයා උන්වහන්සේයි. එම නිසා උන්වහන්සේගේ ධර්මය ඒ වූ පරිද්දෙන් අවබෝධ කොට ගත් එක් කෙනකුන් වහන්සේ හෝ අද ඇති වුණොත් මුළු ලංකාවේම මහා ධර්ම විප්ලවයක් ඇති වන්නට පුළුවනි. ඒ විප්ලවයේ ආලෝකය මුළු ලෝකය පුරා පැතිරී ගොස්, සමහර විට, අද බලවතුන් සේ ප්‍රසිද්ධව සිටිතත් ඉතා දුකසේ ජීවත් වන ජන නායකයින්, දේශපාලන නායකයින්, මැති ඇමතිවරුන්, ධනවතුන් සියලු දෙනාටම එය ප්‍රයෝජනවත් වනවා ඇති. ධනයෙන්, ජන නායකත්වයෙන්, දේශපාලන නායකත්වයෙන්, නොලැබුණු සුවයක් ඔවුනට මේ ධර්මයෙන් ලැබෙනවාට කිසිම සැකයක් නැහැ. අන්න ඒ පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා ධර්මය අවබෝධ කර ගන්නට මේ පීඨය උපකාරී වෙනවා. ඒ නිසා මෙයින් ලෝකයාට මහා සේවාවක් වන බව තමුන්නාන්සේටත් අප කාටත් වැටහෙන දෙයක්.

අද දේශපාලනඥයාට ආගම ගැන කථා කරන්නට සිදු වී තිබෙන්නේ ඉතාම අමාරුවෙනුයි. ඔහු ආගම ගැන කොතරම් අවංකව කථා කළත් එය ඔහුටම ආපසු හරවා ගහන කස පහරක් වන්නට පුළුවනි. බුදු රජාණන් වහන්සේගේ ධර්මය අනුව එහි "තත්ත්වයක්" යනුවෙන් දෙයක් නැහැ. එහි තිබෙන්නේ මධ්‍යම ප්‍රතිපදාවයි. එහෙත් අද ඒ ආගම අනුව උසස් තැන්වලට පැමිණ සිටින අය තත්ත්වයක් ගැන සලකනවා. බුදු හාමුදුරුවන් වහන්සේ උන්වහන්සේට උපතින්ම, සහජයෙන්ම හිමි වී තිබුණු සියලුම සැප සම්පත්—තමන් වහන්සේගේ ආදරණීය පියාණන්දෑ, තමන් හදා වඩා ගත් සුළු මෑණියන්දෑ, මුළු දඹදිවින්ම රූබර කුමාරිකාව වශයෙන් ප්‍රසිද්ධව සිටි සුන්දර භාර්යාව, තම කුළුඳුල් එකම පුතා, මාළිගා සියල්ල, රස බොදුන් සහ ඒවා වැළඳු රන් භාජන, සළුපිළි පට වස්ත්‍ර—සියල්ලම අත්හැර දමා, සැප එහි නැති බව වටහාගෙන, සැප ඇත්තේ ස්වකීය සිතෙහි ඇති කෙලෙසුන් නැති කොට සිත අභ්‍යන්තර වශයෙන් පිරිසිදු කර ගැනීමෙන් මතුවන සහනයෙහි බව අවබෝධ කොට ගෙන, වදාළහයි කියැවෙන මේ ශ්‍රේෂ්ඨ ධර්මය අනුගමනය කරන උන්වහන්සේගේ ගෝළබාළයන් වශයෙන් සැලකෙන්නන්ගේ මතය හා සසඳා බලන විටත් බුද්ධ ධර්මය අද ඒ වූ පරිද්දෙන් නොපවත්නා බව කියන්නේ කණගාටුවෙන්.

අප අද පාඨශාලා 9,000න් 8,000 කම බුද්ධ ධර්මය අනිවාර්ය වශයෙන් උගන්වනවා. අනෙක් ආගම්ද උගන්වනවා. බුද්ධාගම උගන්වන දහම් පාඨශාලා 5,000 ක් තිබෙනවා. ඒ වාගේම උගත් ස්වාමීන් වහන්සේලාත් ඉන්නවා. දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ජයකොඩි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මයා.) කොහොම කීවත්, අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද අංක 4 දරන චක්‍ර ලේඛයෙන් බුද්ධාගම ඉගැන්වීම අනිවාර්ය කිරීම ගැන මාත් ගරු අගමැතිතුමාත් ඉදිරියේ සමහර භික්ෂූන් වහන්සේලා විරුද්ධත්වය පළ කළ බව මේ සභාව ඉදිරියේ ප්‍රසිද්ධියේ කියන්න කැමතියි. කොයි වෙසින් හිටියත්, ලෞකික සැප සම්පත් බලාපොරොත්තු වන අයට, ඒ අස්සෙන් සැපත පෙරා ගන්නට උත්සාහ කරන අයට බුද්ධාගමේ තැනක් නැතැයි මා හිතනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
මොන සැපතද?

**ගරු ඊරියගොල්ල**
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
විමුක්ති සැපත.

දැනට අවුරුදු 20 ක 25 ක සිට 5,000ක් දහම් පාසල්වලින් ඉගෙනගෙන පිට වුණු අයයි, අද අපේ සමාජයේ ඉන්නා වැඩි පිරිස. 8,000ක් පාඨශාලාවල අනිවාර්ය වශයෙන් ඉගැන්වෙන බුද්ධ ධර්මයෙන් ජ්‍යෙෂ්ඨ විභාගයෙන් විශිෂ්ඨ සාමාර්ථ ඇතිව සමත් වූ අය අද අපේ සමාජයේ—විශ්ව විද්‍යාල ඇතුළේ පවා—ඉන්නවා. එහෙත්, නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) කීවාක් මෙන් බුද්ධාගම පිළිබඳ අවබෝධයක් තබා සදාචාරයවත්, උගත් යයි සම්මත බොහෝ අය තුළ අද දක්නට නැහැ. සමහර අය තුළ නම් තිබෙනවා.

පුද පූජා පමණයි, අද බුද්ධාගම. බුදු රජාණන් වහන්සේගේ ධර්මයේ හැටියට පුද පූජා පැවැත්වීමෙන්—අප ඉගෙන ගන්නා, ධර්ම පුස්තක වශයෙන් සලකන සූත්‍ර දේශනාවල තිබෙන කරුණු අනුව සලකන විට—ගස්, ගල් පිළිම ආදියට වැඳීමෙන් පමණක් නොව පණ පිටින් වැඩ විසූ බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී ශරීරයට වැඳීමෙන්වත් විමුක්තිය නොලැබෙන බව උන්වහන්සේ දේශනා කළහයි ඒ පොත්වලම තිබෙනවා. අසූ මහ සව්වන්ගෙන් කෙනකු වූ වක්කලී ස්වාමීන් වහන්සේ, බුදු රජාණන් වහන්සේ ගඳ කිළියෙන් පිටට වැඩි අවස්ථාවල හැමදාම වාගේ ගිහින් උදේ හා හවසත් උන්වහන්සේට වැන්දාලු. දවසක් බුදු රජාණන් වහන්සේ වක්කලී ස්වාමීන් වහන්සේගෙන් විචාලලු, "මොකද වක්කලී උඹ මට හැම දාම වඳින්නේ" කියා. "තමුන්නාන්සේගේ ශ්‍රී ශරීරයට වැඳීමෙන් විමුක්තිය සොයා ගැනීමටය" යි ඒ ස්වාමීන් වහන්සේ කීවාලු. "පිස්සු වන්නට එපා, උඹ මැරෙන තුරු මට වැන්දත් විමුක්තිය ලබා ගන්නට බැ; භාවනා මාර්ගයෙන් උඹේ අභ්‍යන්තරයේ තිබෙන කෙලෙස් දුරු කර ගැනීමට උත්සාහ කර ඒ මඟින් උඹම විමුක්තිය සොයා ගන්නවා මිස මට වැඳීමෙන් විමුක්තිය සොයා ගන්නට බැ" යයි බුදු රජාණන් වහන්සේ කීවාලු. මෙය ප්‍රසිද්ධියේ කීවොත් සමහර විට පාරේ බැස යන්නටවත් බැරි වෙයි.

ලෝකයේ කිසි කලෙක අසන්නට නොලැබුණු පුදුම ආත්ම පරිත්‍යාගයක් කොට දහ දුක් විඳ සොයා ගත් සත්‍යයෙන් ලෝකයාට සුවය ලබා දීම සඳහා ඒ මහා ශ්‍රේෂ්ඨතමයා—බුදු රජාණන් වහන්සේ—ගත් උත්සාහයේ ප්‍රතිඵල අද නැහැ. ලෝකය වෙනස් කළේ ගොඩවල් එකතු වී නොවෙයි; විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් පෙරහැරේ ගිහින් නැත්නම් පන්ති වර්ජනය කර නොවෙයි. එක පුද්ගලයායි දෙන්නයි ලෝකය හැදුවේ. බුදු රජාණන් වහන්සේ ලෝකය වෙනස් කළා. ක්‍රිස්තුන් වහන්සේ ලෝකය වෙනස් කළා. මහම්මත්තුමා ලෝකය වෙනස් කළා. එම නිසා, බුදු රජාණන් වහන්සේගේ ධර්මය පිළිබඳව ඒ වූ පරිද්දෙන්ම අවබෝධයක් ලබා ගැනීමේ භාග්‍යය මේ ධර්ම පීඨය මඟින් එක් පුද්ගලයකුටවත් ලැබුණොත්, එයම ලංකාවට පමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොව ලෝකයටම සෙතක් විය හැකිය යන හැඟීම උඩ විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් කථා කරන්නට ඇති. ඒ අදහස උඩමයි, අපේ කැබිනට් මණ්ඩලයත් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ.

ගරු කථානායකතුමනි, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් මේ පනතට සම්පූර්ණයෙන් සහයෝගය දෙන්නට සැදී පැහැදී සිටීමෙන්—අදහස්වල සුළු සුළු වෙනසක්ම් ඇති—පෙනී යන්නේ ඔවුනුත් අපි වගේම ධර්මාවබෝධයක් ඇති ශිෂ්ට සමාජයක් මෙහි බිහි කිරීමට සතුටින් සිටීම බව කියන්නට මම බොහොම සන්තෝෂයි. ඒක ඉතා වැදගත් සිද්ධියක්. මේක පක්ෂ දේශපාලනය උඩ දේශපාලන වාසියක් ලැබීමේ බලාපොරොත්තුවෙන් කළ දෙයක් නොවෙයි. අපි ඉදිරිපත් කරන්නට පෙර මෙය ඉදිරිපත් කරන්නට පිළියෙල කළ පක්ෂය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. සමහරවිට ඒ අය මේ වැඩ පිළිවෙල සකස් කරන්නට ඇත්තේත් දේශපාලන වාසියක් තකාගෙන නොවෙන්ට ඇති. ඒ නිසා මෙය සම්මත කර ගැනීමට පමණක් නොව මෙය ක්‍රියාත්මක කිරීමේදීත් සඵලත්වයක් බලාපොරොත්තුවෙන් ඔවුන් අපට සහයෝගය දෙතැයි අපේක්ෂා කරනවා.

මා කලින් කිව්වා වගේ දහම් පාසල් පන් දාහක ඉගැන්නුවත්, ලක්ෂ හයක් වටිනා දහම් පොත් බෙදා දුන්නත් අනිවාර්ය වශයෙන් පාසල් අට දාහක ආගම ධර්මය ඉගැන්වීම කළත් ඵලක් නැති වූ බව—සාමාන්‍යයෙන් ඵලක් ඇති වෙන්ට ඇති—බලාපොරොත්තු වූ ප්‍රයෝජනය යන වියදමේ තරමටවත් නැති බව නම් ඇත්තයි. ඒ නිසා මේ අපි උගන්වන පොතපත වුණත් සකස් විය යුත්තේ බුද්ධ ශ්‍රාවක ධර්මපීඨයේ පර්යේෂණ පවත්වා අවබෝධයක් ලබාගත් මහා තෙරපාණන් කෙනෙකු හෝ ගිහියෙකු හෝ අතින් විය යුතුයි. දැන් තිබෙන්නේ පොත්පත් කටපාඩම් කිරීමක් පමණයි. ඒකෙන් සමහරවිට අවාසියක් වෙන්ටත් පුළුවන්. මා තමුන්නාන්සේට කලින් කී පරිදි අපේ ධර්මය අවුරුදු දාහක් පමණ කටපාඩමින් ගෙනා එකක්. බුදුරජාණන් වහන්සේගේ කාලයේ පොත් ලිවීම තිබුණත් පොත් ලියන්නට අනුබල දුන් බවක් පෙනෙන්ට නැහැ. ධර්මය සියුම් දෙයක් ; මනස පිළිබඳ දෙයක්. ගණිතය මිනිතය හෝ විද්‍යාව වගේ ඉගෙන ගන්ට පුළුවන් දෙයක් නොවෙයි. ධර්මය අවබෝධයෙන්ම දැනගත යුතුයි. අපේ ඉගැන්වීම්වලින් ඵලයක් නොලැබී ඇත්තේ ඒ නිසා වෙන්ට පුළුවන්. එහෙයින් ධර්මය පිළිබඳව අවබෝධයක් ලැබූ පුද්ගලයන් ආශ්‍රයෙන් අනික් අයටත් ධර්මාවබොධයක් ලබා ගැනීමේ මාර්ගය සැලසීමේ උදාර චේතනාවෙන් තමයි, ජාතික රජය මේ පනත ඉදිරිපත් කළේ. සිදුවන වියදමින් හෝ දරන මහන්සියෙන් දැනට ප්‍රයෝජනයක් නැහැ. බලාපොරොත්තුව අනුව ලැබෙන ප්‍රතිලඵය ඉතා අල්පයි. ඒ නිසා මේ මාර්ගයෙන්වත් ධර්මාවබෝධයක් ලැබී බුදුන්ගේ ධර්මය මේ යයි අවබෝධ කර ගත හැකි පුද්ගලයන් බිහි වී ඒ මගින් ලංකාවටත් මුළු ලෝකයටත් සෙතක් සැලසේය යන අවංක චේතනාවෙන් තමයි, මේ පනත ඉදිරිපත් කළේ.

තමුන්නාන්සේ දන්නවා, ත්‍රිපිටකයම කඩපාඩම් කළත් බුදු වෙන්ට බැරි බව. ඒ නිසා අවබෝධයක් නැති කටපාඩමෙන් වැඩක් නැහැ. සමහරවිට එයින් ලැබෙන ප්‍රයෝජනයට වඩා තමන් ආගම දන්නවාය කියන වැරදි හැඟීම නිසා හානියක් ඇති වෙන්ටත් පුළුවනි. ලෞකික සැප සියල්ල අත හැර සකල ලෝකයා කෙරෙහි පතළාවූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

